| 12 | **නිර්දේශිත ග්‍රන්ථ**<br>1. කාරියවසම්, තිස්ස, **සිංහල නාට්‍යයේ විකාශය** , 1983, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ<br>2. කුලසූරිය, ආනන්ද, **සිංහල සාහිත්‍යය 1**, 1961, සමන් ප්‍රකාශකයෝ, මහරගම<br>3. කුලසූරිය, ආනන්ද, **සිංහල සාහිත්‍යය 2**, 1962, සමන් ප්‍රකාශකයෝ, මහරගම<br>4. කුලසූරිය, ආනන්ද, **සිංහල සාහිත්‍යය 4**, 1997, සී/ස(පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව<br>5. ගම්ලත්, සුචරිත, **සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාශය** , 1998, එස්. ගොඩගේ, මරදාන<br>6. ඥාණසීහ හිමි, හේන්පිටගෙදර, **සාහිත්‍යය**, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ<br>7. දිසානායක, විමල් **නිර්මාණය හා විචාරය**, 2002, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ<br>8. දිසානායක, විමල්, **ගිරිකුළ හා සඳමඬල,** (ප්‍ර.මු. 1970), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ<br>9. දිසානායක, විමල්, **විවාදාත්මක ලිපි** , (ප්‍ර.මු. 1970) ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ<br>10. රාජකරුණා, ආරිය, **නූතන සිංහල කාව්‍යය 1**, 1962, සමන් ප්‍රකාශකයෝ, මහරගම.<br>11. රාජකරුණා, ආරිය, **නූතන සිංහල කාව්‍යය 2**, 1962, සමන් ප්‍රකාශකයෝ, මහරගම. | | |

12. රුවන්පතිරණ, මොනිකා, **නව කවි විමසුම**, 1977 , ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ
13. වික්‍රමසිංහ, මාර්ටින්, **සාහිත්‍ය කලාව**, 1992, තිසර ප්‍රකාශකයෝ, කොළඹ
14. වික්‍රමසිංහ, මාර්ටින්, **සිංහල සාහිත්‍යයේ නැගීම**, 1949, මවුන්ට් යන්ත්‍රාලය, කොළඹ
15. වික්‍රමසිංහ, මාර්ටින්, **නව පද්‍ය සිංහලය,** 1956, සමන් ප්‍රකාශකයෝ, මහරගම
16. සරච්චන්ද්‍ර එදිරිවීර, **සාහිත්‍ය විද්‍යාව,** 1998, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ (ප්‍ර.මු. 1965)
17. සරච්චන්ද්‍ර එදිරිවීර, **කල්පනා ලෝකය**, 2000, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
18. සරච්චන්ද්‍ර එදිරිවීර, **සිංහල ගැමි නාටකය**, 2015, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
19. සරච්චන්ද්‍ර එදිරිවීර, **සිංහල නවකථා ඉතිහාසය හා විචාරය** ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්, කොළඹ
20. සුරවීර, ඒ. වී. **නිර්මාණ පසුබිම**, 2000, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
21. සුරවීර, ඒ. වී. **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා**, 2008 , ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ , කොළඹ
22. සුරවීර, ඒ. වී. **නවකතා නිර්මාණය හා අවබෝධය**, 1974, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
23. සුරවීර, ඒ. වී. **සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
24. සෝරත හිමි, වැලිවිටියේ (වර්ෂය නොසඳහන්ය**) සාහිත්‍ය සේවනය**, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම**,** කොළඹ
25. හපුආරච්චි, ඩී. වී. **සිංහල නාට්‍ය ඉතිහාසය**, 1981, සී/ස ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සහ සමාගම, කොළඹ
26. ආරියරත්න, සුනිල්, **නූතන පද්‍ය කාව්‍ය සංහිතා**, 2012 ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
27. කරුණාරත්න, කුසුමා සහ සරත් විජේසූරිය, **නව කවි සංග්‍රහය** (ප්‍ර.මු. 1992), විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ
28. කරුණාරත්න, කුසුමා සහ සරත් විජේසූරිය, **සිංහල කෙටිකතා සංග්‍රහය** (ප්‍ර.මු. 1991 , විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය), කොළඹ
29. දිසානායක, විමල්, **නව කවි සරණිය**, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ.
30. පණ්ඩිත, වින්සන්ට් සහ අහුන්ගල්ලේ අරුණතිලක, **නව පද්‍ය මාලා** 1958, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ
31. පෙරේරා, සිරිල් සී සහ තවත් අය, **තෝරා ගත් සිංහල කෙටිකතා** 1998, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
32. බාලසූරිය, සෝමරත්න, **සංගෘහීත සිංහල කෙටිකතා,** 1993 සම්භාව්‍ය ප්‍රකාශන, කැලණිය.
33. මලල්ගොඩ, පී., **කොළඹ කවි යුගය**, 1981, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ
34. රෝහණධීර, මැන්දිස්, **තෝරා ගත් නව සිංහල පද්‍ය රචනා** 1998, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| 01 | **පාඨමාලා කේතකය** | SIGE 1002 |
| 02 | **පාඨමාලා ඒකකයේ නම** | සිංහල භාෂා ප්‍රවේශය |
| 03 | **ඒකක අගය** | 04 |
| 04 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 05 | **හැඳින්වීම**<br>විද්‍යාත්මක භාෂා අධ්‍යයනයේ මූලිකාංග සරල ව හඳුන්වා දෙමින් සිංහල භාෂා ව්‍යවහාරය සම්බන්ධ විධිමත් අවබෝධයක් ද සිංහල ලේඛන ව්‍යාකරණය සම්බන්ධ ශාස්ත්‍රීය දැනුමක් හා නිරවද්‍ය ලේඛන ව්‍යාකරණය සම්බන්ධ පරිචයක් ද ලබා දෙයි. | |
| 06 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| 07 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• භාෂාව මානවයාගේ ජීවවිද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක උරුමයක් ද සංස්කෘතික දායාදයක් මෙන් ම සංස්කෘතියේ වාහකය ද ප්‍රධානතම සන්නිවේදන මාධ්‍යය ද වශයෙන් හඳුනා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම.<br>• ශිෂ්‍යයාට වාග්විද්‍යාව හෙවත් විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සම්බන්ධ මූලිකාංග පිළිබඳ ව අවබෝධයක් ලබා දීම.<br>• භාෂාව හා සමාජ නිර්මිතයක් වසයෙන් හඳුනා ගනිමින් භාෂාව මඟින් සමාජය නිරූපණය වන ආකාරය හඳුනා ගැනීමට මඟ පෙන්වීම.<br>• භාෂණය හා ලේඛනය අතර පවත්නා සම්බන්ධය පිළිබඳ අවබෝධයක් ලබා දීම.<br>• භාෂාව හා ව්‍යාකරණය සම්බන්ධ අවබෝධයක් ලබා දෙමින් භාෂා විග්‍රහය සඳහා ශිෂ්‍යයා යොමු කිරීම.<br>• සිංහල ලේඛන ව්‍යවහාරය පිළිබඳ ශාස්ත්‍රීය දැනුමක් ලබා දෙමින් නිරවද්‍ය ලේඛන ව්‍යාකරණය සම්බන්ධ පරිචයක් ලබා දීම. | |
| 08 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• නිර්වචන මාර්ගයෙන් භාෂාව පිළිබඳ විධිමත් අවබෝධය ලබා ගනී.<br>• භාෂාවේ සංස්ථිතිය, ව්‍යූහය හා කාර්ය හඳුනා ගනී.<br>• සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් භාෂාවේ වැදගත්කම හා ප්‍රබලත්වය හඳුනා ගනී.<br>• භාෂාව සමාජ නිර්මිතයක් වසයෙන් හඳුනා ගනිමින් භාෂාව හා සමාජය අතර සම්බන්ධතාව පිළිබඳ විද්‍යාත්මක අවබෝධයක් ලබා ගනී.<br>• භාෂණය හා ලේඛනය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව වටහා ගනී.<br>• භාෂා විග්‍රහයෙහි මූලිකාංග හඳුනා ගනී.<br>• නිරවද්‍ය හා සම්මත භාෂා ව්‍යවහාරය සම්බන්ධ පරිචයක් අත්පත් කර ගනී. | |
| 09 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |
| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** |
| | 1. භාෂාව යනු කුමක් ද? මූලික සංකල්ප අධ්‍යයනය | • භාෂාව : නිර්වචනය සහ අර්ථකථන<br>• වාග්විද්‍යාත්මක නිර්වචන |
| | 2.භාෂාවේ සංස්ථිතිය, ව්‍යූහය හා කාර්ය | • භාෂාව සංකේත පද්ධතියකි<br>• භාෂාවේ සමාජ සම්මුතිකභාවය |

| | | |
|---|---|---|
| | | • භාෂාවේ කාර්ය<br>• භාෂාවේ වෛශේෂික ලක්ෂණ |
| | 3. භාෂාව හා සන්නිවේදනය | • සන්නිවේදනය භාෂාවේ මුඛ්‍ය කාර්යය බව<br>• භාෂාව සන්නිවේදනය මාධ්‍යයක් වශයෙන් භාවිත වන අයුරු<br>• භාෂීය හා අභාෂීය සන්නිවේදනය<br>• සත්ත්ව හා මානව සන්නිවේදන ක්‍රම |
| | 4. භාෂාව සමාජය හා සංස්කෘතිය | • භාෂාව සමාජ නිර්මිතයකිඃ භාෂාවේ ආරම්භය.<br>• භාෂාව අනන්‍යතා සංකේතයකි<br>• භාෂාව හා දේශපාලනය<br>• භාෂාව හා භාෂාව<br>• සමාජ ව්‍යාප්තිය හා භාෂාව<br>• භාෂාව හා ජාතිකත්වය<br>• භාෂාව හා සංස්කෘතිය<br>• භාෂාව හා දේශපාලනය<br>• භාෂාව හා සමාජ ඉතිහාසය<br>• භාෂාව හා පුද්ගල භාෂණය<br>• සමාජීය හා ප්‍රදේශීය ව්‍යවහාර ප්‍රභේද<br>• පරිමිත හා ප්‍රාස්තාවික භාෂා<br>• ක්‍රියෝඩ් හා පිජින් භාෂා<br>• භාෂා ද්විරූපතාව හා ද්විභාෂකත්වය<br>• සම්මත ව්‍යවහාරය<br>• සාවද්‍ය හා නිරවද්‍ය ව්‍යවහාර |
| | 5. භාෂාව හා ලේඛනය | • ලේඛනයේ ආරම්භය හා විවිධ ලේඛන ක්‍රම<br>• ලේඛනයේ විකාසනය |
| | 6. භාෂා විග්‍රහය | • භාෂා විග්‍රහයේ ආන්වයික අනුප්‍රස්තර<br>• උච්චාරණාත්මක ශබ්ද විචාරය පිළිබඳ හැඳින්වීමක්<br>• උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය |
| | 7. සිංහල වර්ණමාලාව අක්ෂර ලේඛනය හා අක්ෂර වින්‍යාසය | • භාෂණ සිංහල ශබ්ද මාලාව හා ලේඛන සිංහල අක්ෂර මාලාව<br>• අන්තර්ජාතික ශබ්දවිචාර වර්ණමාලාව හා ශබ්දානුලේඛන සම්මත<br>• ශබ්දිම හා උපශබ්ද<br>• අවම යුගල පරීක්ෂණය<br>• අක්ෂර වින්‍යාස දෝෂ හා අදාළ රීති |

| | | |
|---|---|---|
| | 8. පද සාධන විධි | • නාම, ක්‍රියා, අව්‍යය පද ප්‍රභේද<br>• පද සාධන දෝෂ හා අදාළ රීති |
| | 9. වාක්‍ය වින්‍යාස විධි | • ක්‍රියා කාරක පද සම්බන්ධය<br>• උක්ත ආඛ්‍යාත අනුරූපතාව<br>• උක්ත-අනුක්ත රූප භාවිතය<br>• ක්‍රියා වර නැඟීම<br>• ආනුක්‍රමික පද යෝගය<br>• වාක්‍ය රීති |
| | 10. භාෂා ගුරුකුල හා සම්මතකරණය | • පිරිවෙන් බස් වහර<br>• හෙළ හවුල<br>• සම්මත සිංහල වාර්තාව<br>• රාජ්‍ය භාෂාව හා ජාතික භාෂා<br>• නූතන සිංහල ව්‍යවහාරය හා 'සිංහල ලේඛන රීතිය' |
| 10 | **පාඨමාලාව පවත්වන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | |
| | **අඛණ්ඩ ඇගයීම්** | කණ්ඩායම් පැවරුම්, ස්වාධීන පැවරුම් හෝ ලිඛිත පරීක්ෂණ ලකුණු (20) |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණ ලකුණු (80) |

**නිර්දේශිත ග්‍රන්ථ**


1. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, **සිංහල ලේඛන ව්‍යවහාරය** : උපදේශ සංග්‍රහය, (2014), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
2. අරංගල, රත්නසිරි, **සිංහල භාෂාවේ ඉතිහාසය හා ණ-න ල-ළ භාවිතය**, (2003), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
3. කරුණාතිලක, ඩබ්ලිව්. එස්., (2003) **සිංහල භාෂා ව්‍යාකරණය**, ඇම්. ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ.
4. කුමාරතුංග, මුනිදාස, **ව්‍යාකරණ විවරණය**, (1965), ඇම්. ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ.
5. කුමාරතුංග, මුනිදාස, **ක්‍රියා විවරණය**, (බු.ව.2500), කේ. ඒ. ආරියදාස සහ සමාගම, කොළඹ.
6. කෝපරහේවා, සඳගෝමි, **විසි වන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරයඃ සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්**, 2010, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
7. කෝපරහේවා, සඳගෝමි, **භාෂානුරාගයේ දේශපාලනය**, 1999, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
8. කෝපරහේවා, සඳගෝමි, **සිංහල සන්ධි අකාරාදිය,** 2014, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
9. ජාතික අධ්‍යාපන ආයතනය, (1989) **සිංහල ලේඛන රීතිය**, නව සංස්කරණය, 2015 ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
10. දිසානායක, ජේ.බී., **භාෂාවක භාවිතය හා විග්‍රහය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

11. දිසානායක, ජේ. බී., **නූතන සිංහල ලේඛන ව්‍යාකරණය**, සී/ස ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ.

12. දිසානායක, ජේ. බී., **මානව භාෂා ප්‍රවේශය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

13. ධර්මදාස, කේ. එන්. ඕ., (1996) **භාෂාව හා සමාජය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

14. ධර්මදාස, කේ. එන්. ඕ., (1996) **භාෂා ද්විරූපතාව**, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

15. ධර්මදාස, කේ. එන්. ඕ., (1999) **ද්විභාෂකත්වය**, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

16. බලගල්ලේ, විමල් ජී., (1995) (2012) **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

| | | |
|---|---|---|
| **1** | **පාඨමාලා ඒකකයේ කේතකය** | SAGE 1001 |
| **2** | **පාඨමාලා ඒකකයේ නම** | සංස්කෘත සාහිත්‍යය හා තදීය ඉතිහාසය |
| **3** | **ඒකක අගය** | 04 |
| **4** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |

**5 හැඳින්වීම**

සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ හා එම ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබනු කැමති ඡාත්‍රයන් උදෙසා සැකසුණු පාඨමාලාවකි.නිර්දිෂ්ට සංස්කෘත ග්‍රන්ථ ත්‍රයක තෝරාගත් කොටස් සිංහලයට පරිවර්තනය කරමින් ඒවායේ අන්තර්ගත කරුණු මෙහිදී විග්‍රහ කැරෙයි.සංස්කෘත සාහිත්‍යාරම්භයේ සිට වර්තමානය දක්වා කරුණු සමාලෝචනය සිදු කැරෙයි.සිංහල, පාලි, සංස්කෘත, හින්දී, පුරාවිද්‍යාව වැනි විෂයයන් හදාරන ශිෂ්‍යයනට වඩාත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

| | | |
|---|---|---|
| **6** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | සංස්කෘත පිළිබඳ මූලික අවබෝධයක් තිබීම වැදගත් ය. එහෙත් එය පූර්ව අවශ්‍යතාවක් නො වේ. එහෙයින් සංස්කෘත පිළිබඳ පූර්ව දැනුමක් නොමැති මුත් මෙම පාඨමාලාව හැදෑරීමට රුචි ඡාත්‍රයනට මෙය විවෘත ය. |

**7 පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**

- සිංහල, පාලි ආදි භාෂා සාහිත්‍යයනට ද ආභාසය ලැබුණු සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ පිළිබඳ ව මූලික අවබෝධයක් ලබාදීම.
- විද්‍යාර්ථීන් තුළ සංස්කෘත සාහිත්‍යය ඉතිහාසය පිළිබඳ ඥාන ප්‍රවර්ධනය.

**8 පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**

මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;

- සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ හා එම ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබයි.
- එම සාහිත්‍යයේ ඇති වර්තමාන උපයෝගීතාව අවබෝධ කොට ගනියි.

**10 පාඨමාලා ඒකකයේ අන්තර්ගතය**

| ප්‍රධාන මාතෘකා | සෙසු මාතෘකා | |
|---|---|---|
| 1. සංස්කෘත නාට්‍ය සාහිත්‍යය | • සංස්කෘත නාට්‍යයේ ආරම්භය, සංස්කෘත නාට්‍ය ග්‍රන්ථ | |
| 2. භාසගේ නාට්‍ය සහ ස්වප්නවාසවදත්තය | • භාසගේ නාටක චක්‍රය<br>• ස්වප්නවාසවදත්තයේ අන්තර්ගත කරුණු සමාලෝචනය<br>• ස්වප්නවාසවදත්තයේ ප්‍රථමාංකයේ මුල් කොටස පරිවර්තනය | |
| 3. ස්වප්නවාසවදත්තය | • ස්වප්නවාසවදත්තයේ ප්‍රථමාංකයේ දෙවන කොටස පරිවර්තනය<br>• ප්‍රථමාංකයේ අවසාන කොටස පරිවර්තනය | |

| | | | |
|---|---|---|---|
| | 4.ස්වප්නවාසවදත්තය | • ද්විතීයාංකයේ පළමු කොටස පරිවර්තනය<br>• ද්විතීයාංකයේ දෙවන කොටස පරිවර්තනය<br>• ද්විතීයාංකයේ තෙවන කොටස පරිවර්තනය | |
| | 5.ස්වප්නවාසවදත්තය | • චරිත නිරූපණය<br>• භාෂාව හා ප්‍රකට වන නාට්‍යමය ලක්‍ෂණ<br>• භාසගේ කවිත්වයේ විශේෂතා | |
| | 6. සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යය | • රාමායණය සහ මහාභාරතය<br>• මහාභාරතයේ අන්තර්ගත උපාඛ්‍යාන | |
| | 7. නලොපාඛ්‍යානය | • අන්තර්ගත කරුණු සමාලෝචනය<br>• ප්‍රථම සර්ගය පරිවර්තනය කිරීම | |
| | 8. නලොපාඛ්‍යානය | • දෙවන සර්ගය පරිවර්තනය කිරීම<br>• තෙවන සර්ගය පරිවර්තනය කිරීම | |
| | 9. නලොපාඛ්‍යානය | • සතරවන සර්ගය පරිවර්තනය කිරීම<br>• ප්‍රධාන චරිත හා අවස්ථා නිරූපණය | |
| | 10. නලොපාඛ්‍යානය | • රචනා ශෛලිය<br>• සමාජය හා දර්ශනය | |
| | 11. සංස්කෘත උපදේශ කථා සාහිත්‍යය | • උපදේශ කථා සාහිත්‍යයේ ආරම්භය<br>• හිතෝපදේශය හා පඤ්චතන්ත්‍රය | |
| | 12. පඤ්චතන්ත්‍රය | • අපරීක්‍ෂිතකාරකය-කථාව පරිවර්තනය කිරීම සහ රසාස්වාදය | |
| | 13. පඤ්චතන්ත්‍රය | • අපරීක්‍ෂිතකාරකය-කථාව පරිවර්තනය කිරීම සහ රසාස්වාදය | |
| | 14. පඤ්චතන්ත්‍රය | • අපරීක්‍ෂිතකාරකය-කථාව පරිවර්තනය කිරීම සහ රසාස්වාදය | |
| | 15. පඤ්චතන්ත්‍රය | • අපරීක්‍ෂිතකාරකය -කථාව පරිවර්තනය කිරීම සහ රසාස්වාදය<br>• පඤ්චතන්ත්‍රයේ උපදේශ හා එහි ප්‍රතීයමාන උපහාසය | |
| | 16. සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය | • සංස්කෘත සාහිත්‍යයේ ආරම්භය, විකාශය හා පරිහානිය | |

| | | | |
|---|---|---|---|
| | 17. වෛදික සාහිත්‍ය ඉතිහසය | • වෛදික සාහිත්‍යයේ ප්‍රභවය පිළිබඳ විවිධ මත | |
| | 18. සංහිතා ග්‍රන්ථ | • ඍග්වේදය<br>• යජුර්වේදය<br>• සාමවේදය<br>• අථර්වවේදය | |
| | 19. බ්‍රාහ්මණ ග්‍රන්ථ | • බ්‍රාහ්මණ ග්‍රන්ථ හඳුනාගැනීම හා අන්තර්ගත කරුණු | |
| | 20. ආරණ්‍යක ග්‍රන්ථ | • ආරණ්‍යක ග්‍රන්ථ හඳුනාගැනීම හා අන්තර්ගත කරුණු | |
| | 21. උපනිෂද් | • උපනිෂද් ග්‍රන්ථ හඳුනාගැනීම හා ප්‍රධාන උපනිෂද් ඉගැන්වීම් | |
| | 22. සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යය | • රාමායණය හා මහාභාරතය<br>• වීරකාව්‍ය සමාජය<br>• වීරකාව්‍යවලින් හෙළිවන යුද්ධයේ ආචාර ධර්ම | |
| | 23. සංස්කෘත මහාකාව්‍ය සාහිත්‍යය | • මහාකාව්‍ය ලක්‍ෂණ<br>• ප්‍රධාන මහාකාව්‍ය ග්‍රන්ථ | |
| | 24. ඛණ්ඩ කාව්‍ය හා චම්පූ කාව්‍ය | • ඛණ්ඩ කාව්‍ය ලක්‍ෂණ<br>• ප්‍රධාන ඛණ්ඩ කාව්‍ය ග්‍රන්ථ<br>• ප්‍රධාන චම්පූ කාව්‍ය ග්‍රන්ථ | |
| | 25. ගද්‍ය කාව්‍ය | • ප්‍රධාන ගද්‍ය කාව්‍ය ප්‍රභේද<br>• දශකුමාරචරිතය, කාදම්බරිය, වාසවදත්තය | |
| | 26. ශ්‍රී ලංකාවේ සංස්කෘත සාහිත්‍යය | • ආරම්භය හා විකාශය<br>• මහාකාව්‍ය<br>• ව්‍යාකරණ<br>• ශතක | |
| | 27. ශ්‍රී ලාංකික සංස්කෘත ශිලාලේඛන | • ශිලාලේඛන හා ඒවායෙහි අන්තර්ගතය හඳුනාගැනීම | |
| | 28. ශ්‍රී ලංකාවේ සංස්කෘත ශිල්ප ග්‍රන්ථ සාහිත්‍යය | • හැඳින්වීම | |

| | | | |
|---|---|---|---|
| | | • මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා හා චිත්‍ර කර්ම ශාස්ත්‍රය<br>• ශාරිපුත්‍රය හෙවත් බිම්බමානය<br>• වෛජයන්ති තන්ත්‍රය | |
| | 29. නූතන සංස්කෘත සාහිත්‍යය | • නූතන සංස්කෘත සාහිත්‍ය පෝෂණයට උරදුන් ලේඛකයන් හා ඔවුන්ගේ නිර්මාණ | |
| | 30. 20,21 සියවස්වල සංස්කෘත විද්වතුන් | • 20 වන සියවසෙහි සංස්කෘත විද්වතුන්<br>• 21 වන සියවසෙහි සංස්කෘත විද්වතුන් | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන, සාකච්ඡා, නිබන්ධ පත්‍රිකා, අන්තර්ජාල ඉගෙනුම් ක්‍රියාකාරකම් හා සංයුක්ත තැටි භාවිතය.<br>(මාර්ගගත ක්‍රමය) දේශන 10 කාලය පැය 40 (04x10)<br>(දේශන /සාකච්ඡා /කණ්ඩායම් වැඩ) | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | ලිඛිත පරීක්ෂණය / පැවැරුම ලකුණු (20) යි | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු (80) යි | |

**12** **නිර්දේශිත ග්‍රන්ථ**


1. **ශිලාලේඛන සංග්‍රහය** සාධනා 1965
2. **ජානකීහරණය** ධර්මාරාම සංස්කරණය
3. ගුරුගේ, ආනන්ද ඩබ්,පී. **ලංකාවේ සංස්කෘත**
4. **රාමායණයාත්‍රා**, රණසිංහ, සමන් චන්ද්‍ර
5. **රාවණ**, රණසිංහ, සමන් චන්ද්‍ර.
6. **යුද්ධ ආචාර ධර්ම**, රණසිංහ, සමන් චන්ද්‍ර
7. **රාමායණය**, ජී. එස්. බී. සේනානායක
8. **මංජුශ්‍රී භාෂිතවාස්තුවිද්‍යා ශාස්ත්‍ර,** ඊ.ඩබ්. මාරසිංහ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්, නුගේගොඩ, 1993
9. **මංජුශ්‍රී භාෂිතචිත්‍රකර්ම ශාස්ත්‍ර**, පරිඃ ඊ.ඩබ්. මාරසිංහ, ඒ. ආර්. ප්‍රින්ටර්ස්, දිල්ලි, 1991
10. **Satyasuri A Critical Study of Janakiharana**, Nirman Prakashan, Delhi, 1984
11. Pannasara Thero, Dehigaspe. **Sanskrit Literature in Ceylon**
12. **සංස්කෘත නාට්‍ය ඉතිහාසය.** ජයදේව තිලකසිරි. කොළඹ, 1971
13. ඒ.බී. කීත්, **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය**, පරි. ජී.එස්.බී. සේනානායක, කොළඹ. 1969
14. රොලින්සන්, එච්. පී. **භාරතීය සංස්කෘතික ඉතිහාසය**, පරි; පරවාහැර පඤ්ඤානන්ද හිමි සහ ඒ.ඩී. වෙදගේ, කොළඹ, 1961
15. **History of Sanskrit Literature**, S.K. De, Calcutta, 1947
16. **History of Sanskrit Literature**, A.B. Keith, OUP. Chap. iii, iv, xi

| | | | |
|---|---|---|---|
| 1 | **පාඨමාලා කේතකය** | SAGE 1002 | |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | සංස්කෘත ව්‍යාකරණය | |
| 3 | **ඒකක අගය** | 04 | |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර | |
| 5 | **හැඳින්වීම**<br>සංස්කෘත මුල සිට හදාරනු කැමති විද්‍යාර්ථීන් සඳහා සකස් වූවකි. සිංහල, පාලි, සංස්කෘත, හින්දී, පුරාවිද්‍යාව වැනි විෂයන් හදාරන ශිෂ්‍යයනට වඩාත් ප්‍රයෝජනවත් ය. | | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | සංස්කෘත පිළිබඳ ව මූලික අවබෝධයක් තිබීම වැදගත් ය. එහෙත් එය පූර්ව අවශ්‍යතාවක් නොවේ. එහෙයින් සංස්කෘත පිළිබඳ පූර්ව දැනුමක් නොමැති වුවත් මෙම පාඨමලාව හැදෑරීමට රුචි ඡාත්‍රයනට මෙය විවෘත ය. | |
| 7 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• සංස්කෘත භාෂාවේ මූලික ව්‍යාකරණය පිළිබඳ අවබෝධය ලබයි.<br>• සරල සංස්කෘත ග්‍රන්ථ පිළිබඳ කියවා අවබෝධය ඇති කොට ගනියි. | | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• නාගරී අක්ෂර ලිවීමේ හා කියවීමේ හැකියාව ඇති කොට ගනියි.<br>• මූලික සංස්කෘත ව්‍යාකරණ විධි පිළිබඳ දැනුම ලබයි.<br>• සරල සංස්කෘත ග්‍රන්ථ කියවා අවබෝධ කොට ගනියි. | | |
| 9 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | | |
| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
| | 1. සංස්කෘත භාෂාව | • සංස්කෘත භාෂාවේ ආරම්භය හා ඒ පිළිබඳ විවිධ මත | |
| | 2. නාගරී අක්ෂර | • අක්ෂර පුහුණුව ස්වර හා ව්‍යඤ්ජන | |
| | 3. නාගරී අක්ෂර | • අක්ෂර වර්ගීකරණය<br>• ස්වර ප්‍රභේද<br>• ව්‍යඤ්ජන ප්‍රභේද | |
| | 4. සංයුක්තාක්ෂර | • සංයුක්තාක්ෂර ලිවීම පිළිබඳ රීති සහ සංයුක්තාක්ෂර පුහුණුව | |
| | 5. පද වර්ගීකරණය | • චතුර්විධ පද හැඳින්වීම (නාම පද, ක්‍රියා පද, උපසර්ග පද, නිපාත පද) | |
| | 6. නාම පද | • ස්වරාන්ත පුරුෂ ලිංග සහ ස්ත්‍රී ලිංග | |
| | 7. නාම පද | • ස්වරාන්ත නපුංසක ලිංග සහ සර්ව නාම | |

| | | | |
|---|---|---|---|
| | 8. විභක්ති සහ විභක්ති ප්‍රයෝග | • ප්‍රථමා විභක්ති ප්‍රයෝග<br>• ද්විතීයා විභක්ති ප්‍රයෝග<br>• සරල වාක්‍ය පරිවර්තන | |
| | 9. විභක්ති සහ විභක්ති ප්‍රයෝග | • තෘතීයා විභක්ති ප්‍රයෝග<br>• චතුර්ථී විභක්ති ප්‍රයෝග<br>• සරල වාක්‍ය පරිවර්තන | |
| | 10. විභක්ති සහ විභක්ති ප්‍රයෝග | • පඤ්චමී විභක්ති ප්‍රයෝග<br>• ෂෂ්ඨී විභක්ති ප්‍රයෝග<br>• සප්තමී විභක්ති ප්‍රයෝග<br>• සරල වාක්‍ය පරිවර්තන | |
| | 11. ධාතු වරනැඟීම | • ධාතු ගණ හඳුනාගැනීම<br>• 1, 4 වන ගණවලට අයත් ධාතු | |
| | 12. ධාතු වරනැඟීම | • 6, 10 වන ගණවලට අයත් ධාතු | |
| | 13. දශ ලකාර | • දශ ලකාර හැඳින්වීම<br>• එහි ප්‍රභේද | |
| | 14. දශ ලකාර | • ලට් හා ලෝට් වරනැඟීම<br>• සරල වාක්‍ය ගොඩනැඟීම | |
| | 15. දශ ලකාර | • ලඞ් හා විධිලිඞ් වරනැඟීම<br>• සරල වාක්‍ය ගොඩනැඟීම | |
| | 16. සන්ධි විධි | • සන්ධි විධි (ලෝප, ආදේශ ආගම ආදිය) | |
| | 17. සන්ධි විධි | • ස්වර සන්ධි විධි | |
| | 18. සන්ධි විධි | • ව්‍යඤ්ජන සන්ධි විධි | |
| | 19. සන්ධි විධි | • විසර්ග සන්ධි විධි | |
| | 20. සන්ධි විධි | • සන්ධි විධි පිළිබඳ අභ්‍යාස | |
| | 21. කෘදන්ත | • කෘදන්ත ප්‍රභේද හැඳින්වීම | |
| | 22. කෘදන්ත | • අතීත කෘදන්ත පද සාධනය<br>• කෘදන්ත පද යෝජනය | |
| | 23. කෘදන්ත | • වර්තමාන කෘදන්ත පද සාධනය<br>• කෘදන්ත පද යෝජනය | |

| | | | |
|---|---|---|---|
| | 24. කෘදන්ත | • අනාගත කෘදන්ත පද සාධනය<br>• කෘදන්ත පද යෝජනය | |
| | 25. පූර්වක්‍රියා | • ත්වා ප්‍රත්‍යාන්ත පූර්වක්‍රියා<br>• සෝපසර්ග පූර්වක්‍රියා<br>• උපසර්ග පද යෝජනය | |
| | 26. සමාස | • සමාස හැඳින්වීම<br>• එහි ප්‍රභේද | |
| | 27. සමාස | • අව්‍යයීභාව සමාසය<br>• කර්මධාර සමාසය | |
| | 28. සමාස | • ද්විගු සමාසය<br>• තත්පුරුෂ සමාසය | |
| | 29. සමාස | • ද්වන්ද්ව සමාසය<br>• බහුව්‍රීහි සමාසය | |
| | 30. පරිවර්තන අභ්‍යාස | • සරල සංස්කෘත පාඨ සිංහලයට පරිවර්තනය කිරීම<br>• සරල සිංහල පාඨ සංස්කෘතයට පරිවර්තනය කිරීම | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන, සාකච්ඡා, නිබන්ධ පන්ති, අන්තර්ජාල ඉගෙනුම් ක්‍රියාකාරකම් හා සංයුක්ත තැටි භාවිතය. | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | ලිඛිත පරීක්ෂණය / පැවැරුම - ලකුණු 20 යි | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු 80 යි | |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ** | | |

1. **සරල සංස්කෘත ශික්ෂකය** බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මාහිමි
2. **සරල සංස්කෘත ශික්ෂකය 11**, බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මාහිමි
3. **සංස්කෘත ශික්ෂකය** - ප්‍රථම පුස්තකය, එම්.එච්.එෆ්. ජයසූරිය
4. **සංස්කෘත ශික්ෂකය 11**, එම්.එච්.එෆ්. ජයසූරිය,
5. **බාලාදර්ශය**
6. **ප්‍රථමාදර්ශය**
7. **සුරභාරතී**, ඩබ්. එස්. කරුණාතිලක
8. **සංස්කෘත ප්‍රථම පුස්තකය**, ආර්.ජී, භණ්ඩාර්කාර් පරි. පරවාහැර පඤ්ඤානන්ද හිමි
9. **ආධුනික සංස්කෘත ව්‍යාකරණය**, ඒ. ඒ. මැක්ඩොනල්,
10. ***Sanskrit Grammar*** by W.D Whitny, Delhi, 2000.

| | | |
|---|---|---|
| 01 | **පාඨමාලා කේතකය** | CUGE 1003 |
| 02 | **පාඨමාලා ඒකකයේ නම** | සංස්කෘතික අධ්‍යයන ප්‍රවේශය |
| 03 | **ඒකක අගය** | 04 |
| 04 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 05 | **හැඳින්වීම**<br>සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැකි, කාලීන වශයෙන් ද වැදගත් පාඨමාලාවකි. සංස්කෘතිය පිළිබඳ විවිධ නිර්වචන, විවිධ සංස්කෘති සහ සංස්කෘතික සහජීවනය පිළිබඳ දැනුවත් කෙරෙන මෙම පාඨමාලාව මානවශාස්ත්‍ර මෙන් ම සමාජීයවිද්‍යා විෂය ක්ෂේත්‍රයන්හි විද්‍යාර්ථීනට ද වැදගත් පාඨමාලාවකි. | |
| 06 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත. |
| 07 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• සංස්කෘතිය යන පදය විග්‍රහ කිරීම, සංස්කෘතියෙහි මූලික ලක්ෂණ හා සංකල්ප අධ්‍යයනය කිරීම.<br>• ප්‍රාථමික හා නාගරික ශිෂ්ටාචාරයන්හි සංස්කෘති හඳුනා ගැනීම.<br>• ගැටුම් නිරාකරණය හා සංස්කෘතික සහජීවනය පිළිබඳ අධ්‍යයනය කිරීම.<br>• නව සංස්කෘතික ප්‍රවණතා හා සංස්කෘතික අනන්‍යතා පිළිබඳ අධ්‍යයනය කිරීම. | |
| 08 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• ලෝකයේ විවිධ සංස්කෘතීන් හඳුනා ගනිමින් ඒවා අගය කරයි.<br>• ප්‍රාථමික හා නාගරික ශිෂ්ටාචාරයන්හි සංස්කෘතීන් පිළිබඳ අවබෝධය ලබා ගනියි.<br>• සංස්කෘතීන් පිළිබඳ වන ඉගෙනීම ගැටුම් නිරාකරණය කොට සංස්කෘතික සහජීවනය උදෙසා භාවිත කළ හැකි බව අවබෝධ කොට ගනියි.<br>• නව සංස්කෘතික ප්‍රවණතා හා සංස්කෘතික අනන්‍යතා හඳුනා ගනියි. | |
| 09 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |
| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** |
| 01 | සංස්කෘතිය හැඳින්වීම | • සංස්කෘතිය හැඳින්වීම<br>• සංස්කෘතිය පිළිබඳ නිර්වචන |
| 02 | සංස්කෘතිය පිළිබඳ බෙදීම් | • භෞතික හා අභෞතික සංස්කෘතිය, මහා සංස්කෘතිය, උපසංස්කෘතිය, විරෝධී සංස්කෘතිය |
| 03 | සංස්කෘතිය හා සමාජය | • සංස්කෘතිය, සමාජය හා පරිසරය<br>• සංස්කෘතියේ ලක්ෂණ හා කෘත්‍යයන්<br>• සංස්කෘතිය පිළිබඳ මතවාද හා න්‍යාය |
| 04 | සංස්කෘතිය පිළිබඳ සංකල්ප | • සංස්කෘතිය හා සම්බන්ධ සංකල්ප අධ්‍යයනය I |
| 05 | සංස්කෘතිය පිළිබඳ සංකල්ප | • සංස්කෘතිය හා සම්බන්ධ සංකල්ප අධ්‍යයනය II |
| 07 | සංස්කෘතිය පිළිබඳ සංකල්ප | • සංස්කෘතිය හා සම්බන්ධ සංකල්ප අධ්‍යයනය III |

| | | |
|---|---|---|
| 08 | මානව ශිෂ්ටාචාර හා සංස්කෘති | • සංස්කෘතිය, සභ්‍යත්වය සහ ශිෂ්ටාචාරය යන සංකල්ප අධ්‍යයනය<br>• මානව ශිෂ්ටාචාර ගොඩනැගීම හා සංස්කෘතික ලක්ෂණ |
| 09 | නාගරික ශිෂ්ටාචාර සහ සංස්කෘති | • ඉපැරණි නාගරික ශිෂ්ටාචාරයන්හි සංස්කෘති අධ්‍යයනය |
| 10 | නව සංස්කෘතික ප්‍රවණතා හා අනන්‍යතා | • සංස්කෘතික ගතිකත්වය<br>• සංස්කෘතික ලෝක හා සංස්කෘතික ව්‍යාපාර<br>• ගැමි සමාජය හා සංස්කෘතිය<br>• ජනප්‍රිය සංස්කෘතිය |
| 11 | සංස්කෘතික විවිධත්වය | • සංස්කෘතික විවිධත්වය<br>• ගැටුම් නිරාකරණය හා සංස්කෘතික සහජීවනය |
| **10** | **පාඨමාලාව පවත්වන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | අඛණ්ඩ ඇගයීම් සහ ලිඛිත පරීක්ෂණ |
| | **අඛණ්ඩ ඇගයීම්** | ස්වාධීන පැවරුම හෝ නිබන්ධය<br>ස්වාධීන පැවරුම් හෝ ලිඛිත පරීක්ෂණ ලකුණු (20) |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණ ලකුණු (80) |

**12 නිර්දේශිත ග්‍රන්ථ**


1. ගුණසිංහ, ආනන්ද. (1992), ***සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයන ප්‍රවේශය***, ගංගොඩවිල: පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.
2. ගුණසිංහ, ආනන්ද. (2012),***ශාන්ති කර්ම රෝග ව්‍යුපශමන විධි හා බුදු සමය***, කොළඹ: කර්තෘ ප්‍රකාශන
3. පල්ලියගුරු, චන්ද්‍රසිරි. (2000), ***සංස්කෘතියේ සමාජ මුහුණුවර***, කොළඹ:සිරිගුරු ප්‍රකාශන.
4. වික්‍රමසිංහ, මාර්ටින්. (1987), ***මානව විද්‍යාව හා සිංහල සංස්කෘතිය***, කොළඹ: තිසර ප්‍රකාශකයෝ.
5. සෙනෙවිරත්න, අනුරාධ. (1996), ***සංස්කෘතිය හා සමාජය*** , කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
6. සෙනෙවිරත්න, අනුරාධ, (1997), ***සංස්කෘතිය හා කලා ශිල්ප***, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
7. හේරත්, සමන්ත.(2009), ***ගෝලීයකරණය සංස්කෘතිය හා සන්නිවේදනය***, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
8. Herskovites, (1958), *Melville J*, ***Cultural Anthropology***, New Delhi : Oxford and IBH Publishing Cooperation
9. Kroeber and Kluckhorn, (1963), ***Culture*****:** New York ,Vitage Books.

| 01 | පාඨමාලා කේතකය | CUGE 1004 |
|---|---|---|
| 02 | **පාඨමාලා ඒකකයේ නම** | සෞන්දර්ය අධ්‍යයන ප්‍රවේශය |
| 03 | **ඒකක අගය** | 04 |
| 04 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 05 | **හැඳින්වීම**<br>සෞන්දර්යය පිළිබඳ මූලික අවබෝධයක් සහ හැඟීමක් ලබා ගත හැකි කාලීන වශයෙන් ද වැදගත් වන පාඨමාලාවකි. සෞන්දර්යය පිළිබඳ විවිධ නිර්වචන, විවිධ මතවාද, පිළිබඳ දැනුවත් කෙරෙන මෙම පාඨමාලාවෙන් ශිෂ්‍ය ප්‍රජාවේ රසවින්දන ශක්‍යතා ප්‍රවර්ධනය ද අපේක්ෂා කැරේ. මානවශාස්ත්‍ර මෙන් ම සමාජීයවිද්‍යා විෂය ක්ෂේත්‍රයන්හි විද්‍යාර්ථීනට ද වැදගත් පාඨමාලාවකි. | |
| 06 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත. |
| 07 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• සෞන්දර්යය හා කලාව විග්‍රහ කිරීම.<br>• සෞන්දර්යය හා කලාව පිළිබඳ නිර්වචන හා මතවාද අධ්‍යයනය කිරීම.<br>• රසවින්දන ශක්‍යතා ප්‍රවර්ධනය කිරීම.<br>• ගැටුම්වලින් තොර සහජීවන සමාජයක් උදෙසා කලාව භාවිත කිරීම. | |
| 08 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• සෞන්දර්යය හා කලාව විග්‍රහ කිරීම පිළිබඳ අවබෝධයක් ලබයි.<br>• සෞන්දර්යය හා කලාව පිළිබඳ නිර්වචන හා මතවාද පිළිබඳ අවබෝධයක් ලබයි.<br>• සිය රසවින්දන ශක්‍යතා වැඩි දියුණු කරගනියි.<br>• ගැටුම්වලින් තොර සහජීවන සමාජයක් උදෙසා කලාව භාවිත කළ හැකි ආකාරය පිළිබඳ අවබෝධයක් ලබයි. | |
| 09 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |
| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** |
| 01 | සෞන්දර්යය විග්‍රහය | • සෞන්දර්යය හා කලාව යන සංකල්ප හඳුනා ගැනීම |
| 02 | සෞන්දර්යය හා කලාව පිළිබඳ මතවාද I | • සෞන්දර්යය පිළිබඳ පෙරදිග හා අපරදිග අර්ථ නිරූපණ |
| 03 | සෞන්දර්යය හා කාව්‍යය | • කාව්‍ය විචාරවාද හඳුනා ගැනීම<br>• අලංකාර, රීති, රස, ධ්වනි, වක්‍රෝක්ති, ඖචිත්‍ය |
| 04 | සෞන්දර්යය හා කාව්‍ය විචාරවාද | • අලංකාරවාදය සහ රීතිවාදය පිළිබඳ සනිදර්ශන විග්‍රහ |
| 05 | සෞන්දර්යය හා කාව්‍ය විචාරවාද | • රසවාදය සහ ධ්වනිවාදය පිළිබඳ සනිදර්ශන විග්‍රහ |
| 06 | මධ්‍ය වාර පරීක්ෂණය | • පැවරුම හෝ නිබන්ධය අවසන් කිරීම. |

| | | |
|---|---|---|
| 07 | සෞන්දර්යය හා කාව්‍ය විචාරවාද | • වක්‍රෝක්තිවාදය සහ ඖචිත්‍යවාදය පිළිබඳ සනිදර්ශන විග්‍රහ |
| 08 | සෞන්දර්යය හා ප්‍රාසංගික කලා I | • ප්‍රාසංගික කලාව හා සංගීතය<br>• සංගීත රසාස්වාදය |
| 09 | සෞන්දර්යය හා ප්‍රාසංගික කලා II | • ප්‍රාසංගික කලාව හා නර්තනය<br>• නර්තන රසාස්වාදය |
| 10 | සෞන්දර්යය හා ප්‍රාසංගික කලා III | • ප්‍රාසංගික කලාව හා නාට්‍ය කලාව<br>• නාට්‍ය රසාස්වාදනය |
| 11 | සෞන්දර්යය හා දෘශ්‍ය කලා I | • චිත්‍ර, මූර්ති සහ කැටයම් |
| **10** | **පාඨමාලාව පවත්වන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | අඛණ්ඩ ඇගයීම් සහ ලිඛිත පරීක්ෂණ |
| | **අඛණ්ඩ ඇගයීම්** | ස්වාධීන පැවරුම හෝ නිබන්ධය<br>ස්වාධීන පැවරුම් හෝ ලිඛිත පරීක්ෂණ ලකුණු (20) |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණ ලකුණු (80) |

**12** **නිර්දේශිත ග්‍රන්ථ**


1. ගුණසිංහ, ආනන්ද, (1992), ***සංස්කෘතිය හා සෞන්දර්යය අධ්‍යයන ප්‍රවේශය***, ගංගොඩවිලඃ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.
2. ජයතුංග, මංගලිකා,(2008),***ප්‍රාසංගික කලා***, කඩවත,කර්තෘ ප්‍රකාශන
3. සෙනෙවිරත්න, අනුරාධ, (1997), ***සංස්කෘතිය හා කලා ශිල්ප***, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
4. සෝමාරාම හිමි, ගල්ගමුවේ,(1952), ***කලාව හා විද්‍යාව,*** කැළණිය:
5. පඤ්ඤාකිත්ති හිමි හිරිපිටියේ, (2002), ***භාරතීය රංගන කලාව හා භරතමුනි,*** කොළඹ.
6. මාරසිංහ වොල්ටර්,(පරි.) (1994), ***භරතමුනි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍රය, ප්‍රථම භාගය***, ගංගොඩවිල, නුගේගොඩ.
7. සුරවීර ඒ.වී.(පරි.)(1984), ***ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රය***, කොළඹ:
8. සිගල්ස් ආර්.එල්. (පරි.) සුරවීර ඒ.වී.,(2001) ***ඇරිස්ටෝටල් හා භරත,*** නුගේගොඩ:
9. ටෝල්ස්ටෝයි ලියෝ, **What is art,*ග්‍රන්ථයේ සිංහල අනුවාදය,***(1987)
10. ඒ.වී.සුරවීර (පරි) ***කලාව යනු කුමක්ද?***, කොළඹ

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා කේතකය** | ANGE 1001 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | සංස්කෘතික මානව විද්‍යාව හැඳින්වීම |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |

**5 හැඳින්වීම**

මානව විද්‍යාව යනු මිනිසා පිළිබඳව කරනු ලබන පූර්ණ අධ්‍යයනයකි. මිනිස් වර්ගයා පිළිබඳව විද්‍යාත්මක හැදෑරීමක් මේ මගින් සිදු වේ. මානව විද්‍යාව මනුෂ්‍යත්වය පිළිබඳ කරනු ලබන අධ්‍යයනයක් ලෙසද මානව විද්‍යාඥයෝ හඳුන්වති. ඒ අනුව මානව විද්‍යාවේ ඇති පෘථුල ස්වභාවය සලකා බලනවිට පෙනී යන්නේ මිනිසා සහ ඔහුගේ සියලු නිර්මාණ පිළිබඳ අධ්‍යයනය මානව විද්‍යාව බවයි.
මානව විද්‍යාවට දීර්ඝ ඉතිහාසයක් තිබේ. මානව විද්‍යාව යන්න අතීතයේ අර්ථකථනය කර තිබුණේ වර්තමානයේ පවත්නා පෘථුල අර්ථයෙන් නොවේ. ක්‍රමානුකූලව සංවිධානාත්මකව සහ විද්‍යාත්මක ස්වරූපයකින් මානව විද්‍යාව බිහිවූයේ 18 වන සියවසේ දී ය.
ඓතිහාසික සංස්කෘතික මානව විද්‍යාව බිහිවීම ඓතිහාසිකව සලකුණු කරන්නේ යුරෝපීය යටත්විජිත ව්‍යාප්තිය සමඟය. මානව සංස්කෘතින් පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනය සංස්කෘතික මානව විද්‍යාව ලෙස හැඳින්වේ. සාංස්කෘතික මානව විද්‍යාවට අයත් විෂය ක්ෂේත්‍ර ගණනාවකි. එය ප්‍රධාන වශයෙන් පුරා විද්‍යාව, වාග් විද්‍යාව, මානව වංශ විද්‍යාව ආදි වශයෙන් පෘථුලව වර්ගීකරණය කෙරේ. මෙහිදී මානවයාගේ අතීතය හා වර්තමාන සංස්කෘතීන් පිළිබඳ ගැඹුරින් හදාරනු ලැබේ. මේ මගින් මානව සංස්කෘතීන්වල සම්භවය, පරිණාමය හා ඉතිහාසය සපුරා හැදෑරීමේ වෑයමක යෙදී සිටියි. ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා මානව විද්‍යාව සාකල්‍ය ප්‍රවේශයක් අනුගමනය කරයි.

| | | |
|---|---|---|
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | මෙම පාඨමාලාව හැදෑරීම සඳහා සපුරාලිය යුතු පූර්ව අවශ්‍යතාවක් නොමැත. |

**7 පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**

- මානව ස්වභාවය හා මානව චර්යාව පිළිබඳ අවබෝධය ලබාදීම
- මානව චින්තනය හා මිනිස් ඉතිහාසය පිළිබඳ අවබෝධය ලබාදීම
- මිනිසාගේ ද්‍රව්‍යාත්මක මෙන්ම ද්‍රව්‍යාත්මක නොවන නිපැයුම් ආදිය පිළිබඳ දැනුම ලබාදීම
- මානව සමාජ විවිධත්වය හා සංස්කෘතීන් පිළිබඳ දැනුම ලබාදීම
- මනුෂ්‍යයා සම්බන්ධව සියලුම සංස්කෘතික අංශ පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීම සිදු වේ.

**8 පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**

මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;

- සංස්කෘතික මානව විද්‍යාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ අවබෝධය ලැබීම.
- සංස්කෘතික මානව විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබීම.
- සංස්කෘතික මානව විද්‍යාවේ පුරෝගාමී ආචිර්ණ කල්පිත මානව විද්‍යාඥයන් පිළිබඳ අවබෝධයක් හා විෂයානුබද්ධව මූලික සංකල්ප පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලැබීම සිදු වේ.

**9 පාඨමාලා ඒකකයේ අන්තර්ගතය**

| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
|---|---|---|---|
| | 1. සංස්කෘතික මානව විද්‍යාව හැඳින්වීම හා විකාශය | • හැඳින්වීම | |
| | 2. සංස්කෘතික මානව විද්‍යාවේ උප විෂයය ක්ෂේත්‍ර | • මානව විද්‍යාත්මක පුරා විද්‍යාව<br>• මානව වංශ විද්‍යාව<br>• වාග් විද්‍යාව<br>• ආර්ථික හා දේශපාලන මානව විද්‍යාව | |

| | | | |
|---|---|---|---|
| | | • ආගම පිළිබඳ මානව විද්‍යාව<br>• සංකේතාත්මක මානව විද්‍යාව<br>• ජනශ්‍රැතිය හා මානව විද්‍යාව<br>• වෛද්‍ය මානව විද්‍යාව | |
| | 3.මානව විද්‍යාව ප්‍රායෝගිකව භාවිතයට ගැනීම | • අප්‍රිකාව, ඉන්දියාව, ලංකාව ආදි රටවල් ඇසුරෙන් | |
| | 4. සංස්කෘතිය හා පෞරුෂත්ව අධ්‍යයනය | • මාගරට් මීඩ්, රූත් බෙනඩික් ආදීන්ගේ අධ්‍යයන ඇසුරෙන් | |
| | 5. මානව සංස්කෘතිය | • හැඳින්වීම<br>• සංස්කෘතිය පිළිබඳ නිර්වචන<br>• සංස්කෘතිය පිළිබඳ ප්‍රධාන බෙදීම් හා සංකල්ප | |
| | 6. පවුල හා විවාහ ක්‍රම, දේපළ | • විස්තාරිත පවුල, න්‍යෂ්ටික පවුල, බද්ධ පවුල, මාතෘමූලික පවුල, පිතෘමූලික පවුල<br>• තරවද් විවාහය, ඇවැස්ස ඥාති විවාහ, එකගෙයි කෑම, දීග විවාහ, බින්න විවාහ, භ්‍රාන්තෘ සරණ හා දේවරසරණ විවාහ, මව් පස දේපළ, පිය පස දේපළ | |
| | 7. ඥාතීත්ව අධ්‍යයන හා ඥාති ක්‍රම | • මාතෘ පාර්ශ්වීය හා පිතෘ පාර්ශ්වීය ඥාතිත්වය, වංශය, පරම්පරාව කුසඹුරු සම්බන්ධතා, ව්‍යභිචාරී තහංචි, ඥාති පද මාලා | |
| | 8. ආගම හා අභිචාර | • ආගම අභිචාර හැඳින්වීම, ආගම හා අභිචාර පිළිබඳ නිර්වචන<br>• ප්‍රාණ වාදය, බහු දේව වාදය, ඒක දේව වාදය, ආත්මවාදය, මන සංකල්පය, කළු අභිචාර (විනාශකාරී අභිචාර), සුදු අභිචාර (ආරක්ෂණ අභිචාර), නිෂ්පාදන අභිචාර<br>• ආගම සහ අභිචාර අතර ඇති සම විසමතා<br>• ආගම සහ අභිචාරවල ඇති සමාජ කාර්යභාරය | |
| | 9. ද්වාර කර්ම හා බැඳි දෙස් විදෙස් සිරිත් විරිත් පිළිබඳ මානව විද්‍යාව | • උපත, වැඩිවිය පැමිණීම, විවාහය, මරණය | |
| | 10. ගෝත්‍රික සමාජවල ලක්ෂණ හඳුනාගැනීම හා ප්‍රාථමික අර්ථක්‍රමය | • පොලිනීසියානු හා ට්‍රෝබ්‍රියානු අර්ථ ක්‍රම | |
| | 11. ගැමි සමාජය හා සංස්කෘතිය | • ගැමි සමාජය හා සංස්කෘතියේ ලක්ෂණ, රොබට් රෙඩ්ෆීල්ඩ් ගේ චූල සම්ප්‍රදාය හා මහා සම්ප්‍රදාය සංකල්පය, ගැමි සමාජයෙහි වෙනස්වීම් | |

| | | | |
|---|---|---|---|
| | 12. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික චාරිත්‍ර වාරිත්‍ර | • වැව, කුඹුර, කමත, හේන වටා බැඳි චාරිත්‍ර | |
| | 13. දෙස් විදෙස් ගෝත්‍රික සමාජ/විශේෂ උපසංස්කෘති දරන සමාජ. | • ගෝත්‍රික සමාජයක් යනු කුමක්ද?<br>• වැදි, කින්නර, අහිගුණ්ඨික, රොඩී ජනතාව, නිත්තෑවෝ<br>• නුවර්, ඩින්කාවරු, අරුන්ටා, එස්කිමෝ, දකුණු ඇමරිකානු ගෝත්‍ර (යාගන්, අපාචියන්වරු) මඕරිවරු, ඉන්දියානු ගෝත්‍රික ජනතාව (නායර්, තෝඩා, හිමාචල් ගෝත්‍රිකයෝ ) | |
| | 14. මානව විද්‍යාවේ පුරෝගාමියෝ | • ඊ. බී. ටයිලර්, බී මැලිනොව්ස්කි, රැඩ්ක්ලිෆ් බ්‍රවුන්, මාගරට් මීඩ්, රූත් බෙනඩික්ට්, මේරි ඩග්ලස්, රේමන්ඩ් ෆර්ත්, ජේම්ස් ෆේසර්, ආර්. ආර්. මැරට්, මැක්ස් ග්ලක්මාන්, ප්‍රාන්ස් බෝයස්, ලෙස්ලි වයිට්, ක්ලාක් විස්ලර්, ඒ. එල්. ක්‍රෝබර්, ඊ. ආර්. ලීච්, නූර් යාල්මාන්, ශ්‍රී නිවාස් | |
| | 15. ශ්‍රී ලාංකේය මානව විද්‍යාඥයෝ සහ ශ්‍රී ලංකාව අළලා මානව විද්‍යාත්මක අධ්‍යයන සිදු කළ මානව විද්‍යාඥයෝ | • රැල්ෆ් පීරිස්, ගණනාථ ඔබේසේකර, නන්දදේව විජේසේකර, එච්. ජී. තම්බයියා, රාඝවාන්, රායන්, සෙලිග්මාන්, නන්දසේන රත්නපාල, මයිකල් රොබට්ස්, මයිකල් ඒම්ස්, හැන්ස් ඩයිටර් ඊවර්ස් | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන හා සම්මන්ත්‍රණ, අත් පත්‍රිකා, Power Point Presentation, කණ්ඩායම් සාකච්ඡා | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | මධ්‍ය වාර්ෂික ඇගයීම/අවසාන වාර්ෂික ඇගයීම | |
| | **අඛණ්ඩ ඇගයීම්** | නිබන්ධනය ලකුණු (20) | |
| | **අවසාන පරීක්ෂණය** | අධ්‍යයන වර්ෂය අවසානයෙහි පෙනී සිටින ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු (80)ක් දෙනු ලැබේ. | |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. අමරසේකර, දයා, 1999, ***සමාජ මානව විද්‍යාව***, ආරිය ප්‍රකාශකයෝ, වාරියපොල.
2. ආරියපාල, ඇම්. බී. 1956, ***මධ්‍යකාලීන ලංකා සමාජය***, කොළඹ.
3. විජේසේකර, නන්දසේන, 1955, ***ලංකා ජනතාව***, කොළඹ.
4. විමලවංශ හිමි, බද්දේගම, 1954, ***අපේ සංස්කෘතිය***, කොළඹ.
5. රත්නපාල, නන්දසේන, 2001, ***මානව විද්‍යාව***, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.
6. රත්නපාල, නන්දසේන, 1995, ***ජනශ්‍රැති විද්‍යාව***, ගොඩගේ සහෝදරයෝ, මරදාන.
7. පෙරේරා, ටෙනිසන්, 2002, ***මානව විද්‍යා හා සමාජ විද්‍යා ප්‍රවේශය***, ගොඩගේ සහෝදරයෝ.

8. සමරසේකර, සේපාල, 2000, ***ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සමාජ***, කොළඹ.

9. සමරසේකර, සේපාල, 2001, ***මානව විද්‍යාවේ මූලධර්ම***, කර්තෘ ප්‍රකාශනයකි.

10. ජයසිරි, ජයන්ත, එදිරිසිංහ, 2009, අනූෂා, ***දකුණු ආසියාව පිළිබඳ මානව විද්‍යාව.***

11. ජයතිලක, දේවිකා, යසාංජලී, 2007, ***මල්වර සිරිත***, කර්තෘ ප්‍රකාශනයකි.

12. ජයතිලක, දේවිකා, යසාංජලී, 2012, ***ආදිවාසී සමාජ I***, කර්තෘ ප්‍රකාශනයකි.

13. ජයතිලක, දේවිකා, යසාංජලී, 2012, ***ආදිවාසී සමාජ II***, කර්තෘ ප්‍රකාශනයකි.

14. ජයතිලක, දේවිකා, යසාංජලී, 2010, ***ලොව වටා මල්වර සිරිත්***, මලිද්‍රව ප්‍රකාශනයකි, බත්තරමුල්ල.

15. රත්නායක අබේ, 1999, ***සමාජ විද්‍යා මානව විද්‍යා න්‍යාය I කොටස***, කර්තෘ ප්‍රකාශනයකි.

16. Colman, Simon and Helan, 1992, Wolson, ***Introduction to Anthropology***, London.

17. Evens, Pritchard, E.E., 1979, ***Social Anthropology***, New York.

18. Fried, John, 1951, ***Cultural Anthropology***, New York.

19. Lowie R. H., 1920, ***Primitive Society,*** New York.

20. Tylor, Edward,1871, ***Primitive Culture***, London.

21. Barnow, Victor, 1982, ***Ethnology***, Homewood, Illinois, USA.

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | ANGE 1002 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | භෞතික මානව විද්‍යාව හැඳින්වීම |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |

**5 හැඳින්වීම**

මානව විද්‍යාව යනු, මිනිසා පිළිබඳව අධ්‍යයනය කිරීමයි. මෙහිදී මිනිසාට වැදගත් වන හා අදාළ වන සියලුම අංශයන් ඔස්සේ අධ්‍යයනයන් සිදුකරනු ලබයි. එනම් ඔවුන්ගේ චර්යාව, භාෂාව, ආකල්ප, ඥාතීත්වය ඉතිහාසය, සංස්කෘතිය, ප්‍රාග් ඉතිහාසය, කලාව, ආගම, තාක්ෂණය මින් සමහරකි. මානව විද්‍යාවේ විශේෂත්වය වන්නේ මිනිසාගේ මෙම අභෞතික ස්වභාවය මෙන්ම භෞතික ස්වභාවය පිළිබඳව ද හැදෑරීමයි. එනම් මිනිසාගේ භෞතික දේහය පිළිබඳව ද අධ්‍යයනය කරන අතර ඒ තුළට මිනිසාගේ පරිණාමය, මිනිසා වර්තමාන රූපාකාරයට පැමිණුන ආකාරය සහ ඒ සඳහා දායක වූ පරිණාමීය හා පාරිසරික සාධක, ඔවුන්ගේ දේහ විලාසය, රුධිර ගණ සහ අනෙකුත් අණුක විද්‍යාත්මක අධ්‍යයනයන් ද සිදු කෙරේ. මානව විද්‍යාව අධ්‍යයනය කිරීමේදී මිනිසා පූර්ණ ලෙසම අධ්‍යයනයට බඳුන් කිරීම සිදුකරනවා යැයි කියන්නේ එබැවිනි.

මිනිසාගේ භෞතික ස්වභාවය අධ්‍යයනය කිරීමේ දී මූලිකව ම මිනිසා සත්ත්වයකු ලෙස සලකයි. එනම් මිනිසා බොහෝ ශාරීරික ලක්ෂණවලින් සත්ත්වයන්ට සමාන වන නමුත් ඔවුන්ගේ සංස්කෘතික අංගයන් මානව සමාජයේ කැපීපෙනෙන ලෙස වර්ධනය වී ඇති බැවින් අනෙකුත් සත්ත්වයන්ට වඩා දියුණු තත්ත්වයකට පත්ව ඇත. එබැවින් භෞතික මානව විද්‍යාව අධ්‍යයනයේදී ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් භාවිත කරන අතර, ඒවා මානව විවිධත්වය හා මානව පරිණාමය ලෙස නම් කර ඇත.

මානව විවිධත්වය අධ්‍යයනයේදී වත්මන් මිනිසුන් පෙන්වන රූපීය විවිධත්වයත් සාකච්ඡා කරනු ලැබේ. මිනිසුන් විවිධ ආකාරයේ රූපීය ලක්ෂණ පෙන්නුම් කරයි. ඒවා ඔවුන්ගේ බාහිරින් පෙන්වන වෙනස්කම් වන දේහ ප්‍රමාණය, සමේ වර්ණය, හිසකෙස්වල වර්ණය, ස්වභාවය වැනි දෑ මෙන්ම අභ්‍යන්තර ලක්ෂණ වන රුධිර ගණවල වෙනස්කම් සහ අනෙකුත් අභ්‍යන්තර වෙනස්කම් ප්‍රමුඛ වේ. මෙහිදී භෞතික මානව විද්‍යාඥයෝ මෙම අභ්‍යන්තර හා බාහිර වෙනස්කම්වලට හේතු සෙවීම සඳහා පර්යේෂණවල නිරත වෙති.

මානව පරිණාමය යන විෂය ක්ෂෙත්‍රය යටතේ මානවයාගේ පරිණාමය පිළිබඳ සාකච්ඡා කෙරේ. මෙහිදී මානව වානර සබඳතාව සහ මානව පූර්වජයන් අධ්‍යයනයට බඳුන් කෙරේ. මෙයට අමතරව භෞතික මානව විද්‍යාවේ ඇති ව්‍යවහාරික විෂය ක්ෂෙත්‍රයන් වන අධිකරණ මානව විද්‍යාව, ප්‍රිමාටා විද්‍යාව යන විෂය ක්ෂෙත්‍රයන් ද සාකච්ඡා කෙරේ.

| | | |
|---|---|---|
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |

**7 පාඨමාලා ඒකකයෙන් අපේක්ෂිත අරමුණු**

- මෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ භෞතික මානව විද්‍යාවේ විෂය ක්ෂෙත්‍ර, ඉතිහාසය සහ වර්තමාන පවතින තත්ත්වය දක්වා වර්ධනය වූ ආකාරය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීමය.
- එයට අමතරව මානවයාගේ ජීව විද්‍යාත්මක විවිධත්වය සාකච්ඡා කිරීම.

- මානව පරිණාමය හා ඒ සම්බන්ධයෙන් ඇති න්‍යායයන් ද මානව පූර්වජයන් පිළිබඳ අවබෝධයක්ද ලබා දීම.
- මිනිස් නොවන ප්‍රිමාටාවන් සහ ඔවුන්ගේ පරිණාමය ද, මානව පරිණාමයට ඔවුන්ගේ දායකත්වය පහදාදීම.
- මිනිස් සමාජවල පෙන්නුම් කරන වර්ගභේදවාදය සහ එයට හේතු විමසීම.
- මිනිසා සිය පරිසරයට දක්වන භෞතික අනුවර්තනයන් අධ්‍යයනය කිරීම.
- ශ්‍රී ලංකාවේ භෞතික මානව විද්‍යා පර්යේෂණයන් පිළිබඳ දැනුම්වත් කිරීම.

**8 පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**

මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;

- සිසුන්ට භෞතික මානව විද්‍යාවේ ආරම්භය, විකාශය, එහි වර්තමාන තත්ත්වය දක්වා වූ වර්ධනය සහ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් ලබාගත හැකි වේ.
- මානවයන් සහ වානරයන් අතර ඇති සම්බන්ධතා හා පරිණාමීය බන්ධුතා හඳුනාගත හැකිවීම.
- මානව විවිධත්වය, වර්ගභේදවාදය පිළිබඳ ඇති විද්‍යාත්මක න්‍යායන් සහ සංකල්ප තේරුම් ගැනීම.
- මිනිසා සිය විවිධ පරිසර තත්ත්වයන්ට භෞතික වශයෙන් අනුවර්තනය වෙමින්, පාරිසරික ගැටලුවලට මුහුණ දෙමින් ලොව පුරා සාර්ථකව ව්‍යාප්ත වූ ආකාරය දැනගැනීම.
- ශ්‍රී ලංකාවේ විසූ ආදි මානවයන් සහ ඔවුන්ගේ සංස්කෘතික පසුබිම, ඔවුන් හා ලෝකයේ ව්‍යාප්තව සිටි අනෙකුත් මානවයන්ගේ අන්තර් සම්බන්ධතාව අවබෝධ කර ගැනීමට හැකියාවක් ලැබීම.

**9 පාඨමාලා ඒකකයේ අන්තර්ගතය**

| ප්‍රධාන මාතෘකා | සෙසු මාතෘකා | |
|---|---|---|
| 1. භෞතික මානව විද්‍යාවේ ආරම්භය හා විකාශනය | • හැඳින්වීම | |
| 2. භෞතික මානව විද්‍යා විෂය ක්ෂේත්‍රයන් | • පාෂාණධාතු විද්‍යාව<br>• අස්ථි ජීව විද්‍යාව හා මානව අස්ථි මිතිය<br>• අධිකරණ මානව විද්‍යාව<br>• ප්‍රිමාටා විද්‍යාව<br>• මානව ජීව විද්‍යාව<br>• ප්‍රාග් ව්‍යාධිවේදය | |
| 3. මානව සම්භවය පිළිබඳ පූර්ව විද්‍යාත්මක චින්තනයන් | • මැවුම් වාදය<br>• රසායනික පරිණාම වාදය<br>• ස්වයං සිද්ධි ජනනවාදය<br>• කොස්මොසොයික් වාදය<br>• ව්‍යසන වාදය | |

| | | | |
|---|---|---|---|
| | 4. පරිණාමීය මූලධර්ම | • පරිණාමය සිදුවූ බවට ඇති සාක්ෂි<br>• පරිණාමීය වාද<br>• -ලැමාක් වාදය<br>• -ඩාවින් වාදය<br>• -නව ඩාවින් වාදය | |
| | 5. මානව විවිධත්වය | • විසි වන ශතවර්ෂයේ වාර්ගික සංකල්ප<br>• ඒකජනන වාදය, බහුජනන වාදය<br>• සමේ වර්ණය<br>• බහුරූපීතාව-රුධිර ගණ<br>• ලැක්ටෝස් ඌනතාව<br>• සිකල්සෙල් ඇනීමියාව සහ තැලසීමියාව | |
| | 6. මනුෂ්‍ය ප්‍රජාවන්ගේ දැකිය හැකි ජීව විද්‍යාත්මක අනුවර්තන | • අනුවර්තන තලයන්<br>• උෂ්ණ දේශගුණයට හා සීත දේශගුණයට ඇති අනුවර්තන<br>• දේහ ප්‍රමාණය සහ හැඩය<br>• උස් බිම් ප්‍රදේශවල ජීවත් වීම<br>• පෝෂණ ඌනතා | |
| | 7. ප්‍රිමාටාවන් | • ප්‍රිමාටා වර්ගීකරණය<br>• ප්‍රිමාටා ලක්ෂණ<br>• ප්‍රිමාටා සමාජ සංවිධාන රටා<br>• ප්‍රිමාටා පරිණාමය | |
| | 8. මානව පරිණාමය | • *Sahelanthropus tchadensis*<br>• *Ardipithecus ramidus*<br>• *Australopithecus anamensis*<br>• *Australopithecus aferensis*<br>• *Australopithecus africanus*<br>• *Australopithecus garhi* | |
| | 9. හෝමෝ මානවයාගේ සම්ප්‍රාප්තිය | • *Homo habilis* (ශක්‍ය මානවයා)<br>• *Homo erectus*(ඍජු මානවයා)- භෞතික හා ද්‍රව්‍යාත්මක සංස්කෘතිය<br>• Archaic *Homo sapiens*- නියැන්ඩතාල් මානවයා<br>• Neanderthal behavior- නියැන්ඩතාල් මානවයාගේ හැසිරීම<br>• Material culture - ද්‍රව්‍යාත්මක සංස්කෘතිය | |

| | | | |
|---|---|---|---|
| | 10. නූතන මානවයාගේ සම්භවය හා ව්‍යාප්තිය | • බහු ප්‍රාදේශීය සම්භවය<br>• ඒක ප්‍රාදේශීය සම්භවය | |
| | 11. ජීව සංස්කෘතික මානව විද්‍යාව | • ජීව සංස්කෘතික ක්‍රමවේදයන්<br>• මානව චර්යාව සහ බෝවන රෝග ව්‍යාප්තිය | |
| | 5. ශ්‍රී ලංකාවේ භෞතික මානව විද්‍යාත්මක අධ්‍යයන | • ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ භෞතික මානව විද්‍යාඥයන්<br>• ශ්‍රී ලාංකේය මානව පොසිල<br>• ශ්‍රී ලංකාවේ ප්‍රාග් මානව සාධක පෙන්වන ස්ථාන | |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන මගින් සහ කණ්ඩායම් සාකච්ඡා | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම** | නිබන්ධනය ලකුණු - (20) | |
| | **අවසාන පරීක්ෂණය** | වසර අවසාන පරීක්ෂණය ලකුණු -( 80) | |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. Barnow, V. 1982. ***Introduction to Physical Anthropology and Archaeology. Vol. 1. (4th edition)***. Dorsey Press, Illinois. USA.
2. Jurmain, R., Kilgore, L., Trevathan, W. and Ciochon, R.L. 2008, ***Introduction to Physical Anthropology. 11th Edition***. Thomson Learning Inc. USA.pp- 513.
3. Kulathilake, S. W. 1997. ***මිනිසා සත්ත්වයෙකි: භෞතික මානව විද්‍යා පිවිසුම.*** Tharanji Printers, Navinna, Sri Lanka.
4. Kulathilake, S. W. 2001. ***මානව අතීතය I : ප්‍රිමාටා පරිණාමය.*** Tharanji Printers, Navinna, Sri Lanka.
5. Nahallage, C. 2001. ***මානව විවිධත්වය.*** Tharanji Printers, Navinna, Sri Lanka.
6. Nahallage, C. 2013. ***ප්‍රිමාටා ලෝකය.*** Sarasavi Publishes, Nugegoda, Sri Lanka.
7. Kulathilake, S. W. 2004. ***මානව අතීතය II : මානව පවුලේ පරිණාමය.*** Tharanji Printers, Navinna, Sri Lanka.
8. Kulathilake, S. W. 2008. ***මානව අතීතය III : නූතන මිනිසාගේ සම්භවය හා පරිණාමය.*** Tharanji Printers, Navinna, Sri Lanka.

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | ARGE 1001 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ඉතිහාසය |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 5 | **හැඳින්වීම**<br>ජාතියක් සතු උරුමයන් පිළිබඳ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ ප්‍රවේශයක් වීම. | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| 7 | **පාඨමාලා ඒකකයෙන් අපේක්ෂිත අරමුණු**<br>ජාතික උරුමයන් හා ලෝක උරුමයන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම ලබා දීම. | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>ජාතියක හා ජාත්‍යන්තර උරුමයන් පිළිබඳ විද්‍යාත්මක අවබෝධය තුළින් ලබන තාක්ෂණය පදනම් කරගෙන උරුමයන් ආරක්ෂා කිරීමත් එය ජාතියට දායාද කිරීමත්, දේශයට ආදරය කරන පරපුරක් බිහි කිරීමත් අපේක්ෂා කෙරේ. | |
| 9 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
|---|---|---|---|
| | 1. පුරාවිද්‍යාවේ ආරම්භය හා වර්ධනය | • 16 ,17, 18 වන සියවස්වලදී පුරාවස්තු රැස්කිරීම ආරම්භ වීම.<br>• 19 වන සියවසේදී යුග තුනේ ක්‍රමය<br>• ඉංග්‍රීසි ජාතිකයින් විසින් ඉදිරිපත් කළ හු විද්‍යාත්මක විපරිණාම පදනම<br>• ප්‍රංශ හා ඉංග්‍රීසි ජාතිකයන් අතින් වර්ධනය වු මානව යටගියාව පිළිබඳ අධ්‍යයනය<br>• 1860 දශකයේදී අධ්‍යාපන විෂයයක් වීම.<br>• 20 වන සියවසේ තුන්වන දශකයේ පරිපූර්ණ විෂයයක් බවට පත්වීම<br>• පරිගණක විෂයය පුරාවිද්‍යාවට ඇතුළත් වීමෙන් වර්ධනය වී අංග සම්පූර්ණ විෂයයක් බවට පත්වීම. | |
| | 2. 1890 ට පෙර ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කටයුතු | • ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කටයුතු ආරම්භවීමට බලපෑ සාධක හා ඒ පිළිබඳ වාර්තා<br>• විවිධ සමිති සමාගම් | |
| | 3. 1890 සිට 1912 දක්වා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ කරන ලද පුරාවිද්‍යා කටයුතු | • 1890 ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා පර්යේෂණ කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආරම්භවීම හා එච්.සී.පී. බෙල් මහතා පාලන කාලය දක්වා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු | |

| | | | |
|---|---|---|---|
| | 4. 1912 සිට 1922 දක්වා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ කරන ලද පුරාවිද්‍යා කටයුතු | • 1912 දී අයර්ටන් මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු<br>• 1922 දී ඒ. ඇම්. හොකාර්ට් මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේ දී කරන ලද පුරාවිද්‍යා කටයුතු | |
| | 5. 1922 සිට 1940 දක්වා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ කරන ලද පුරාවිද්‍යා කටයුතු | • 1935 දී ඒ. එම්. ලෝන්හර්ට්ස් මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු.<br>• විවිධ පුරාවිද්‍යා සංගම්, ආයතන මගින් හා පුද්ගලයන් විසින් කරන ලද පුරාවිද්‍යා කටයුතු. | |
| | 6. 1940 න් පසු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ කරන ලද පුරාවිද්‍යා කටයුතු | • 1940 දී මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ප්‍රථම ශ්‍රී ලාංකික පුරාවිද්‍යා කොමසාරිස් වරයා ලෙස පත්වීම හා ඔහුගේ පාලන කේෂත්‍රයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු | |
| | 7. 1940 න් පසු ශ්‍රී ලංකාවේ කරන ලද පුරාවිද්‍යා කටයුතු | • 1957 දී ආචාර්ය සී.ඊ. ගොඩකුඹුර මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු<br>• 1967 දී ආර්.එච්.ද. සිල්වා මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු<br>• 1979 දී ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු<br>• යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණය යෝජනා ක්‍රමය පිහිටුවීම හා මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත සම්මතවීම | |
| | 8. 1940 න් පසු ශ්‍රී ලංකාවේ කරන ලද පුරාවිද්‍යා කටයුතු | • 1984 දී ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු.<br>• 1991 දී ආචාර්ය එච්.එම්. සිරිසෝම මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු<br>• 1993 දී ආචාර්ය සිරාන් දැරණියගල මහතා පත්වීම හා ඔහුගේ පාලන කාලයේ දී කරන ලද පුරාවිද්‍යා කටයුතු<br>• 2001 දී ආචාර්ය ඩබ්. විජේපාල මහතා පත්වීම හා පාලන කාලයේදී කරන ලද පුරාවිද්‍යා කටයුතු | |

| | | | |
|---|---|---|---|
| | 9. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කටයුතු සඳහා දායක වූ වෙනත් ආයතන හා පුද්ගලයන්<br><br>ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික හා මූල ඓතිහාසික අවධි පිළිබඳ ගවේෂණය | • මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආරම්භය<br>• මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් කරන ලද පුරාවිද්‍යා කටයුතු<br>• ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික දත්ත විශ්ලේෂණය කිරීම<br>• ශ්‍රී ලංකාවේ මූල හා ඓතිහාසික අවධි පිළිබඳ කාල විමර්ශනය | |
| | 10. 1860 ට පෙර ඉන්දියාවේ පුරාවිද්‍යා කටයුතු හා ඇලෙක්සැන්ඩර් කනින්හැම් මහතා විසින් ඉන්දියාවේ පුරාවිද්‍යා කේෂත්‍රයට කරන ලද සේවය | • ඉන්දියාවේ පුරාවිද්‍යා සංකල්පයේ ප්‍රභවය හා ඓතිහාසික යුගයේ පුරාවිද්‍යා කටයුතු.<br>• 1794 සිට 1861 දක්වා පුරාවිද්‍යා කටයුතු.<br>• ඇලෙක්සැන්ඩර් කනින්හැම් ඉන්දියා පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සිදුකරන ලද ගවේෂණ, කැණීම්, සංරක්ෂණ හා ඒවායේ ප්‍රතිඵල.<br>• ඉන්දියාවේ පුරාවිද්‍යා කොමසාරිස්වරයා වශයෙන් ඔහුගේ කාර්යභාරය හා ඔහු විසින් ක්ෂේත්‍රයට හඳුන්වාදුන් නව ප්‍රවණතා. | |
| | 11. සර් ජොන් මාෂල් හා සර් මෝටිමර් වීලර් විසින් ඉන්දියාවේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට කරන ලද සේවය | • සර් ජොන් මාෂල් ඉන්දියා පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සිදුකරන ලද ගවේෂණ කැණීම් සංරක්ෂණ හා ඒවායේ ප්‍රතිඵල<br>• සර් මොටිමර් වීලර් ඉන්දියා පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සිදුකරන ලද ගවේෂණ කැණීම් සංරක්ෂණ හා ඒවායේ ප්‍රතිඵල | |
| | 12. එච්. ඩී. සංකලියා හා ආර්.ඩී. බෙනර්ජි විසින් ඉන්දියාවේ පුරාවිද්‍යා ක්ෂෙත්‍රයට කරන ලද සේවය | • එච් .ඩී. සංකලියා ඉන්දියා පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සිදු කරන ලද ගවේෂණ, කැණීම්, සංරක්ෂණ හා ඒවායේ ප්‍රතිඵල.<br>• ආර්.ඩී. බෙනර්ජි ඉන්දියා පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සිදු කරන ලද ගවේෂණ කැණීම් සංරක්ෂණ හා ඒවායේ ප්‍රතිඵල. | |
| | 13. ඉන්දියානු ප්‍රාග් ඉතිහාසය හා පුරාවිද්‍යා පර්යේෂණ | • ඉන්දියානු ප්‍රාග් ඉතිහාසය හඳුනාගැනිම හා ඒ පිළිබඳ කරන ලද පර්යේෂණ හා පුද්ගලයන්.<br>• ශිලාමෙවලම් හා වෙනත් ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ නිර්මාණ ඇසුරින් ඔවුන්ගේ සංස්කෘතිය හඳුනාගැනීම. | |
| | 14. ඉන්දීය මූල ඉතිහාස අවධිය හා පුරාවිද්‍යා පර්යේෂණ | • මූල ඓතිහාසික අවධිය හදුනාගැනීම සහ එම අවධිය පිළිබඳ කරන ලද පර්යේෂණ<br>• මූල ඓතිහාසික අවධිය හැදෑරීමට ඇති මූලාශ්‍රය | |

| | | | |
|---|---|---|---|
| | | • එම අවධිය පිළිබඳ පර්යේෂණය කළ පුද්ගලයන් හා ඔවුන්ගේ පර්යේෂණවලින් ලද ප්‍රතිඵල<br>• මෙම වකවානුවල ඉන්දීය සංස්කෘතිය | |
| | 15. ඉන්දියාවේ ඓතිහාසික අවධි හා පුරාවිද්‍යා පර්යේෂණ | • ඓතිහාසික අවධිය හඳුනාගැනීම එම අවධිය පිළිබඳ පර්යේෂණ හා පර්යේෂණ කළ පුද්ගලයෝ<br>• ඓතිහාසික අවධියේ ඉන්දීය සංස්කෘතිය | |

| | | |
|---|---|---|
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන මගින්,කණ්ඩායම් සාකච්ඡා<br>ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා පැවැත්වීම |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | |
| | **අඛණ්ඩ ඇගයීම** | කණ්ඩායම් පැවරුම්, ස්වාධීන පැවරුම් හෝ ලිඛිත පරීක්ෂණ ලකුණු (20) |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු (80) |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | |


1. පුරාවිද්‍යා දේපාර්තමේන්තුවේ ***ඉතිහාසය 1990*** - සංස්: නන්දදේව විජේසේකර
2. ***පුරාවිද්‍යා ප්‍රවේශය*** - 1992 එච්.ටී. බස්නායක හා උදා හෙට්ටිගේ
3. ***පුරාවිද්‍යා හැදෑරීම*** - සරත් වත්තල
4. ***ලංකා පුරාවිද්‍යාවේ ඉතිහාසය*** - සද්ධාමංගල කරුණාරත්න
5. ***Archaeological survey of Ceylon – Annual Reports***
6. ***Central Cultural fund – Annual Reports***
7. ***Central Cultural fund – Excavation Reports***
8. ***Central Cultural fund – conservation Reports***
9. ***ඉන්දියා පුරාවිද්‍යා ඉතිහාසය*** - 2001, පරිවර්තනය මහාචාර්ය ඩී.එල්. අබේවර්ධන, සමන් ප්‍රකාශන, මහරගම.
10. ***ආදි ඉන්දියාව හා පාකිස්ථානය*** - 1971, මෝටිමර් වීලර්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
11. ***Indus Civilization***, 1953, Mortimer wheeler Cambridge.
12. Chakrabarti, Dilip K. 1982. "***The Development of Archaeology in the Indian Subcontinent"***
13. Trautmann, Thomas R.; Sinopoli, Carla M. 2002. "***In the Beginning was the Word: Excavating the Relations between History and Archaeology in South Asia". Journal of the Economic and Social History of the Orient.***

<table>
<tr><td>1</td><td>පාඨමාලා ඒකකයේ කේතකය</td><td colspan="2">ARGE 1002</td></tr>
<tr><td>2</td><td>පාඨමාලා ඒකකයේ නම</td><td colspan="2">සම්භාව්‍ය චිත්‍ර හා මූර්ති</td></tr>
<tr><td>3</td><td>ඒකක අගය</td><td colspan="2">04</td></tr>
<tr><td>4</td><td>අධ්‍යයන වර්ෂය</td><td colspan="2">පළමුවන වසර</td></tr>
<tr><td>5</td><td colspan="3">හැඳින්වීම<br><br>ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය චිත්‍ර හා මූර්ති කලාව පිළිබඳ මූලික දැනුම හා අවබෝධය තුළින් නිර්මාණ රසවින්දනය හා නිර්මාණකරණය.</td></tr>
<tr><td>6</td><td>පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා</td><td colspan="2">නැත</td></tr>
<tr><td>7</td><td colspan="3">පාඨමාලා ඒකකයෙන් අපේක්ෂිත අරමුණු<br><br>• ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ චිත්‍ර හා මූර්ති කලාව පිළිබඳ මූලික දැනුම හා අවබෝධය ලබා දීම.<br>• ඉන්දියානු කලාව ශ්‍රී ලංකාවේ කලාව කෙරෙහි ඇති කළ බලපෑම හඳුනා ගැනීම.<br>• ඒ ඒ යුගවලට ආවේණික කලාවේ හා නිර්මාණ ලක්ෂණ වෙන් කොට හඳුනා ගැනීමට හැකියාව ලබාදීම.<br>• භාවිත ද්‍රව්‍ය හා තාක්ෂණික ශිල්පක්‍රම පිළිබඳ අවබෝධය ලබා ගැනීම.</td></tr>
<tr><td>8</td><td colspan="3">පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය<br><br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• මානවයාගේ පැවැත්ම සඳහා කලාවේ උපකාරය හඳුනා ගනියි.<br>• මිනිසා අන්තර් සංස්කෘතික ක්‍රියාවලියකට අතීතයේ සිටම අනුගතව සිටි  බව හඳුනා ගනියි.<br>• කලින් කල ඇති වූ සමාජ විපර්යාස හඳුනා ගනියි.<br>• නිර්මාණ රසවින්දනය හා නිර්මාණකරණයට පෙළඹවයි.</td></tr>
<tr><td rowspan="3">9</td><td colspan="3">පාඨමාලා ඒකකයේ අන්තර්ගතය</td></tr>
<tr><td>ප්‍රධාන මාතෘකා</td><td>සෙසු මාතෘකා</td><td></td></tr>
<tr><td>01. භාරතීය කලා පසුබිම<br><br>1.1 ඉන්දුනිම්න ශිෂ්ටාචාරයට අයත් කලාකෘති</td><td>• මේ යටතේ ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ පැතිරීම හා කාලය<br>• එම ශිෂ්ටාචාරවාසීන් විසින් නිර්මාණය කළ කලාකෘතිවල දක්නට ලැබෙන පුරුෂ රූප, ස්ත්‍රී රූප, ක්‍රීඩා භාණ්ඩ, මැටි බඳුන් සහ මුද්‍රා ආදියේ මූලික ලක්ෂණ<br>• ඒ සඳහා භාවිත අමුද්‍රව්‍ය හා එම කලා කෘතිවල සංකල්පයන් හඳුනාගැනීම</td><td></td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | 1.2 මෞර්ය සම්ප්‍රදායේ කලාව | • අශෝක ස්තම්භ, බුද්ධගයා කැටයම් හා සාංචි කැටයම්<br>• ඒවායේ විශේෂ ලක්ෂණ හා ආභාසයන් හඳුනාගැනීම | |
| | 1.3 ආන්ද්‍ර කලා සම්ප්‍රදාය | • දකුණු දිග ඉන්දියාවේ ක්‍රිෂ්ණා සහ ගෝධාවරි ගංගා අතර බිහිව වැඩුණු,<br>• අමරාවති<br>• නාගර්ජුනකොණ්ඩ<br>• ගෝලි<br>• ජග්ගෙයියාපේට<br>• ආදී ස්ථානවල ඇති කලා කෘතීවල විශේෂ ලක්ෂණ හා ප්‍රකාශන විධික්‍රම තේරුම් ගැනීම | |
| | 1.4 කුෂාණ කලා සම්ප්‍රදාය | • කුෂාණ රජ පෙළපත යටතේ බිහිවූ ගන්ධාර හා මථුරා කලා කලාකෘතිවල විශේෂ ලක්ෂණ<br>• ඒවායේ විවිධ ආභාසයන් හඳුනා ගැනීම | |
| | 1.5 ගුප්ත කලා සම්ප්‍රදාය | • ගුප්ත රජ පෙළපත යටතේ උතුරු ඉන්දියාවේ සංවර්ධනයට පත් බුද්ධ ප්‍රතිමා කලාව අධ්‍යයනය | |
| | 1.6 අජන්තා චිත්‍ර කලා සම්ප්‍රදාය | • අජන්තා ලෙන් පද්ධතියේ ඇති චිත්‍රවල, අන්තර්ගතය<br>• ඉදිරිපත් කිරීමේ විලාසය<br>• චිත්‍ර තාක්ෂණය හඳුනා ගැනීම | |
| | **02. ශ්‍රී ලංකාවේ කලා පසුබිම**<br><br>2.1 ශ්‍රී ලංකාවේ කලා ශිල්ප බිහිකිරීමේ පසුබිම | • ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික කලාව<br>• මහින්දාගමනයත් සමග ඇති වූ ඉන්දියානු සබඳතාව මත ලංකාවේ කලාවෙහි ඇති වූ සංවර්ධනය තේරුම් ගැනීම | |
| | 2.2 ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාව | • බුද්ධ සංකේත<br>• අනුරාධපුර, පොළොන්නරුව හා මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය සඳහා භාවිත අමුද්‍රව්‍ය<br>• එක් එක් යුගයේ ප්‍රතිමාවල විශේෂ ලක්ෂණ හඳුනාගැනීම | |

| | | | |
|---|---|---|---|
| | 2.3 ශ්‍රී ලංකාවේ බෝධිසත්ත්ව ප්‍රතිමා | • ශ්‍රී ලංකාව තුළ මහායාන බුදුදහමේ ව්‍යාප්තිය<br>• මහායාන බෝධිසත්ව ප්‍රතිමාවල ඊට ආවේණික ලක්ෂණ තේරුම් ගැනීම | |
| | 2.4 ශ්‍රී ලංකාවේ සැරසිලි මූර්ති | • ආයක කැටයම්<br>• ආරාමික හා රාජකීය ගොඩනැගිලිවල දොරටු හා මණ්ඩප අලංකරණය සඳහා භාවිත සඳකඩපහණ, මුරගල, කොරවක්ගල ආදියේ ක්‍රමික විකාශනය<br>• එම කලාකෘතිවල සංකේතාර්ථයන් හඳුනාගැනීම | |
| | 2.5 ශ්‍රී ලංකාවේ බිතුසිතුවම් කලාව | • අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර යන යුගවල බිතුසිතුවම් ඇඳි ස්ථාන<br>• එම සිතුවම්වල අන්තර්ගතය හා විශේෂ ලක්ෂණ<br>• බිතුසිතුවම් තාක්ෂණය තේරුම් ගැනීම | |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන මඟින්,සම්මන්ත්‍රණ<br>ක්ෂේත්‍ර කටයුතු සඳහා යොමු කිරීම | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම** | කණ්ඩායම් පැවරුම්, ස්වාධීන පැවරුම් හෝ ලිඛිත පරීක්ෂණ ලකුණු (20) | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු (80) | |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. Blacker, J. F. 1922, ***The ABC of Indian Art.*** Stanley Paul & Co., London.
2. Coomaraswamy, Ananda K. 1914, ***Viśvakarmā ; examples of Indian architecture, sculpture, painting, handicraft.*** London.
3. Kapila Vatsyayan, 1977,***Classical Indian Dance in Literature and the Arts*** ,New Delhi: Sangeet Natak Akademi
4. Mitter, Partha. 2001,***Indian Art,***Oxford University Press.
5. Havell, E. B. 1907, ***Essays on Indian art, industry & education***. G. A. Natesan & Co. , Madras.
6. Havell, E. B. 1920, ***The Ideals of Indian Art***. E. P. Dutton and Co., New York.
7. Havell, E. B. 1908, ***Indian Sculpture and Painting***. John Murray, London.

8. Havell, E. B. 1920, ***A Handbook of Indian Art***. John Murray, London.
9. Smith, Vincent A. 1930, ***A History Of Fine Art In India And Ceylon***. The Clarendon Press, Oxford.
10. Welch, Stuart Cary 1985, ***India: Art and Culture, 1300-1900.*** New York: The Metropolitan Museum of Art.
11. අබේවර්ධන ඩී.එල්. ***ඉන්දීය පුරාවිද්‍යා ඉතිහාසය***
12. අලහකෝන්, හෙක්ටර්, 1968, ***හින්දුසභ්‍යත්වයේ නැගීම***
13. කුමාරස්වාමි ආනන්ද, 1962, ***මධ්‍යකාලීන සිංහල කලා***, කොළඹ
14. දේවේන්ද්‍ර ඩී.ටී., 1970, ***සඳකඩපහණ හා වෙනත් ලිපි***, කොළඹ
15. පරණවිතාන.එස්., 1990, ***ලංකාවේ ස්තූපය***, කොළඹ
16. පිගට් ස්ටුවට්, 1971, ***ප්‍රාග් ඓතිහාසික ඉන්දියාව***,
17. බෂාම්. එල්. ***අසිරිමත් ඉන්දියාව***
18. ගුරුගේ ආනන්ද, ***දඹදිව බෞද්ධ කලාව***
19. වනරතන හිමි කඹුරුපිටියේ, 1985, ***ලක්දිව බුදුපිළිමය***, මාතරතන හිමි, බෙල්ලන්විල, 1995
20. ***බුද්ධ ප්‍රතිමා කලාව සහ බුදුපිළිමයේ විකාශය***, දෙහිවල
21. විමලරතනහිමි, බෙල්ලන්විල, 1991, ***බුදුපිළිමයේ මුද්‍රා සහ ආසන***, දෙහිවල
22. විජේසේකර නන්දදේව, 1990, සංස්. ***මූර්ති කලාව***, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
23. වීලර්, මෝටිමර්, ***ආදි ඉන්දියාව හා පකිස්ථානය***
24. සෝමතිලක එම්. ***ශ්‍රී ලංකාවේ බිතුසිතුවම් කලාව***
25. බස්නායක එච්.ටී. ***ඉන්දියාවේ බෞද්ධ කලා ශිල්ප***

| | | |
|---|---|---|
| **01** | **පාඨමාලා ඒකකයේ කේතකය** | CMGE 1001 |
| **02** | **පාඨමාලා ඒකකයේ නම** | සන්නිවේදන මූලධර්ම |
| **03** | **ඒකක අගය** | 04 |
| **04** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| **05** | **හැඳින්වීම**<br>සන්නිවේදන විෂය ශාස්ත්‍රීය වශයෙන් විමර්ශනයට ලක් කිරීම සඳහා එහි පදනම සකස් වී ඇති ආකාරය මෙන්ම විෂය ක්ෂේත්‍රයේ විවිධ බෙදීම් හා වර්ගීකරණයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් තිබීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම විවිධ වූ විෂයානුබද්ධ කරුණු පැහැදිලි කර ගැනීමේදී උපස්තම්භක වන පිළිගත් මූලික පාරිභාෂික නාමකරණයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. | |
| **06** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| **07** | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• සන්නිවේදන විෂය ක්ෂේත්‍රය හැඳින්වීම<br>• විෂයයට අදාළ මූලික බෙදීම් හා අනුෂංගික සංරචකයන් පිළිබඳ මූලික අවබෝධය ලබාදීම.<br>• සන්නිවේදන විෂය අධ්‍යයනයේදී භාවිත මූලික නාමකරණය හඳුන්වා දීම | |
| **08** | **පාඨමාලා ඒකකයේ ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ ව්‍යාප්තිය පැහැදිලි කර ගනියි<br>• විෂයයට අදාළ මූලික බෙදීම් හා වර්ගීකරණයන් හා ඊට පාදක වූ සාධක ඇසුරින් ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගනියි<br>• සන්නිවේදන අධ්‍යයනය හා බැඳුණු මූලික පාරිභාෂික නාමකරණයන් අදාළ සන්දර්භයට ඇති සම්බන්ධයට අනුව නිවැරදිව භාවිත කිරීමේ හැකියාව ලබාගනී | |
| **09** | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |
| | **ප්‍රධාන මාතෘකාව** | **සෙසු මාතෘකා** |
| | 1.සන්නිවේදනය යනු කුමක්ද? | • හැඳින්වීම<br>• නිර්වචන<br>• වැදගත්කම |
| | 2.සන්නිවේදනයේ ලුහුඬු ඉතිහාසය | • මුල්කාලීන සන්නිවේදන විධික්‍රම මානව<br>• දේශීය සන්නිවේදන විධික්‍රම |
| | 3.මානව සන්නිවේදනය | • මූලික ගුණාංග<br>• සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග<br>• සන්නිවේදනයේ පෞද්ගලික වටිනාකම<br>• සන්නිවේදනයේ සමාජ වටිනාකම |
| | 4.සන්නිවේදන වර්ග හා ස්වරූප | • වර්ග<br>- අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය<br>- පුද්ගලාන්තර සන්නිවේදනය<br>- සමූහ සන්නිවේදනය<br>- ජන සන්නිවේදනය |

| | | |
|---|---|---|
| | | • ස්වරූප<br>- කථන<br>- ලිඛිත<br>- ශ්‍රව්‍ය<br>- දෘශ්‍ය<br>- විධිමත්<br>- නොවිධිමත්<br>- වාචික<br>- නිර්වාචික |
| | 5.සන්නිවේදන ආකෘති | • ඇරිස්ටෝටල්<br>• ලැස්වෙල්<br>• ෂැනන් හා වීවර්<br>• බර්ලෝ<br>• ශ්‍රාම් හා ඔස්ගුඩ් |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | |
| | **අවසාන පරීක්ෂණය** | වර්ෂාවසාන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. ලකුණු 100% |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ** | |


1. ඇතුගල, ආරියරත්න 1998, ***සන්නිවේදන සිද්ධාන්ත***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 10
2. කරුණානායක, නන්දන, 1995, ***මානව සන්නිවේදනය***, මාධ්‍ය ප්‍රකාශකයෝ, නුගේගොඩ
3. පියදාස, රෝහණ ලක්ෂ්මන්, 2008, ***සන්නිවේදන විමර්ශන***, මාධ්‍ය හා සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රය
4. හපුආරච්චි, අජන්තා, ***සන්නිවේදනය හඳුනාගැනීම*** 2010, රත්න ප්‍රකාශකයෝ - කොළඹ
5. කරුණානායක, නන්දන 1994, ***සන්නිවේදන***, මාධ්‍ය ප්‍රකාශකයෝ, නුගේගොඩ
6. කරුණානායක, නන්දන 2000, ***සන්නිවේදනයට පදනම***, සදීපා
7. දිසානායක විමල් 1997, ***මානව සන්නිවේදනය***, සීමාසහිත ලේක්හවුස් කොළඹ 02
8. මහේන්ද්‍ර, සුනන්ද 1991, ***සන්නිවේදන ගවේෂණ***, ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලය
9. ගමගේ ජේ. නිමල් 1998, ***සත්ව සන්නිවේදනය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
10. මහේන්ද්‍ර, සුනන්ද 1993, ***සන්නිවේදන විචාර ප්‍රතිචාර***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ - කොළඹ 10
11. Tubbs & Moss 1994, ***Human Communication***, McGrow–Hill, Inc
12. Fiske, John 2006, ***Introduction to Communication Studies*** –Rutledge, London
13. Andrew, Bennett& Wall 2008, ***AS Communication Studies (2$^{nd}$ ED***),Rutledge, London

<table>
<tr><td>01</td><td>පාඨමාලා ඒකකයේ කේතකය</td><td>CMGE 1002</td></tr>
<tr><td>02</td><td>පාඨමාලා ඒකකයේ නම</td><td>මාධ්‍ය අධ්‍යයනය හැඳින්වීම</td></tr>
<tr><td>03</td><td>ඒකක අගය</td><td>04</td></tr>
<tr><td>04</td><td>අධ්‍යයන වර්ෂය</td><td>පළමුවන වසර</td></tr>
<tr><td>05</td><td colspan="2">හැඳින්වීම<br>ජනසන්නිවේදනය යනු සන්නිවේදනය යන පුළුල් විෂය ක්ෂේත්‍රයෙහි අන්තර්ගත විශේෂිත ඒකකයකි. පුද්ගලයා මත මෙන්ම සමාජය මත ඇතිකරන දැඩි බලපෑම නිසාම වර්තමාන ලෝකයේ ඒ පිළිබඳව මහත් වූ අවධානයක් යොමුව තිබේ.එහෙයින් සන්නිවේදන විද්‍යාර්ථියකු අනිවාර්යයෙන්ම ජනමාධ්‍යවල හැසිරීම පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් යුක්ත වීම අත්‍යවශ්‍ය වූවකි.</td></tr>
<tr><td>06</td><td>පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා</td><td>නැත</td></tr>
<tr><td>07</td><td colspan="2">පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු<br>• ජනසන්නිවේදනය පිළිබඳවත් එහි ඓතිහාසික වර්ධනය හා කාර්යභාරය පිළිබඳවත් ප්‍රමාණවත් අවබෝධයක් ලබා දීම<br>• ශාස්ත්‍රීය දෘෂ්ටිකෝණයකින් ජනමාධ්‍යවල හැසිරීම සහ ක්‍රියාකාරීත්වය න්‍යායාත්මකව මෙන්ම ප්‍රායෝගිකව විමර්ශනයට ලක් කිරීම</td></tr>
<tr><td>08</td><td colspan="2">පාඨමාලා ඒකකයේ ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• විවිධ ජනමාධ්‍ය වර්ග හා ඒවාට අදාළ විශේෂතාවන් පැහැදිලි කර ගැනීම<br>• ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව න්‍යායාත්මක සාධක ඇසුරින් අවබෝධයක් ලබා ගැනීම<br>• ජනමාධ්‍යයන්ගේ කාර්ය හා බැඳුණු විවිධ සංරචකයන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය විවිධ ජනමාධ්‍ය ආකෘති ඇසුරින් විමර්ශනය කර ගැඹුරින් අවබෝධ කර ගැනීම</td></tr>
<tr><td>09</td><td colspan="2">පාඨමාලා ඒකකයේ අන්තර්ගතය</td></tr>
<tr><td></td><td>ප්‍රධාන මාතෘකාව</td><td>සෙසු මාතෘකා</td></tr>
<tr><td></td><td>1.ජනමාධ්‍ය යනු කුමක්ද?</td><td>• හැඳින්වීම<br>• නිර්වචන<br>• ජනමාධ්‍යයන්ගේ කාර්යයන්</td></tr>
<tr><td></td><td>2.ජනමාධ්‍ය ඉතිහාසය</td><td>• පුවත්පත්<br>• සිනමාව<br>• ගුවන්විදුලිය<br>• රූපවාහිනිය<br>• අන්තර්ජාලය</td></tr>
<tr><td></td><td>3. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හැඳින්වීම</td><td>• මුද්‍රිත මාධ්‍ය<br>- පුවත්පත්<br>- සඟරා<br>• විද්‍යුත් මාධ්‍ය<br>- ගුවන්විදුලිය<br>- රූපවාහිනිය<br>- අන්තර්ජාලය</td></tr>
<tr><td></td><td>4.ජනමාධ්‍ය පිළිබඳ නාමික න්‍යායයන්</td><td>• අධිපතිවාදී<br>• නිදහස්වාදී<br>• සෝවියට් කොමියුනිස්ට්<br>• සමාජ වගකීම<br>• ප්‍රජාතන්ත්‍රවාදී</td></tr>
</table>

| | | |
|---|---|---|
| | 5.ජනසන්නිවේදන ආකෘති | • වෙස්ට්ලි මැක්ලීන්<br>• ඩේවිඩ් මැනිං වයිට්<br>• කාට්ස් සහ ලැසාස්හෙල්ඩ්<br>• මෙල්වින් ද ෆ්ලුවර්<br>• අන්තර්ජාල අකෘතිය |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | |
| | **අවසාන පරීක්ෂණය** | වර්ෂාවසාන ලිඛිත පරීක්‍ෂණයට පෙනී සිටිය යුතුය.<br>ලකුණු 100% |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ** | |


1. ඇතුගල, ආරියරත්න 1993, ***රූපවාහිනිය සහ සන්නිවේදනය***, රත්න පොත් ප්‍රකාශකයෝ, මරදාන
2. කාරියවසම්, තිස්ස 2004, ***ශ්‍රී ලංකවේ පුවත්පත් කලාව***, ගොඩගේ සහෝදරයෝ, කොළඹ
3. කරුණානායක, නන්දන 2000, ***විද්‍යුත් සන්නිවේදනය***, සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය
4. නානායක්කාර, සේන 2012, ***මාධ්‍යකලා විචාර ප්‍රතිචාර***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
5. මහේන්ද්‍ර, සුනන්ද, 2012, ***ජනමාධ්‍යයේ නැගීම***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
6. රාජපක්ෂ චන්ද්‍රසිරි 2002, ***ජනසන්නිවේදන මූලධර්ම***, ෆාස්ට් ප්‍රින්ටර්ස්, කොළඹ
7. Pradeep Kumar Dey 1993, ***Perspectives in Mass Communication***, Kalyani Publishes – New Delhi
8. Dounick R Joseph, 1994, ***Dynamics of Mass Commmunication***, Mc Grow–Hill Publishing Company, New York
9. DeFleur & Dennis, 1991, ***Understanding Mass Communication***, Houston Mifflin Company, Boston.

| | | |
|---|---|---|
| **01** | **පාඨමාලා ඒකකයේ කේතකය** | CRGE 1001 |
| **02** | **පාඨමාලා ඒකකයේ නම** | අපරාධ විද්‍යාවේ මූලික සංකල්ප |
| **03** | **ඒකක අගය** | 04 |
| **04** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| **05** | **හැඳින්වීම**<br><br>පුද්ගලයාගේ හා සමාජයේ යථා පැවැත්ම කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කරනු ලබන මානව චර්යා රටාවන් අතුරින් අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා ප්‍රධාන වේ. සමාජ කෙරෙහි අපරාධ මඟින් ඇති කරන එම අනර්ථකාරී බලපෑම නිසා ඒ පිළිබඳව අධ්‍යයනය කොට දැනුම ගොඩ නැගීම කෙරෙහි විද්‍යාඥයන් තම අවධානය යොමු කර තිබේ. ඒ අනුව සමාජ සංසිද්ධියක් ලෙස අපරාධ පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ අරමුණින් අපරාධ විද්‍යාව නැමැති විෂය ක්ෂේත්‍රය ගොඩ නගා තිබේ.<br><br>සමාජ විද්‍යා කාණ්ඩයට අයත් විෂයයක් වන අපරාධ විද්‍යාව මඟින් අපරාධ, අපරධකාරී චර්යා රටාවන්ගේ ස්වභාවය, පුද්ගල අපරාධකාරීත්වය සඳහා බලපාන හේතු සාධක හා අපරාධ පාලනය සහ නිවාරණය පිළිබඳ විද්‍යාත්මකව හදාරනු ලැබේ. අපරාධ හා අපරාධ පාලනයට අදාළ වන්නාවූ අංශ ගණනාවක් පිළිබඳ අපරාධ විද්‍යාඥයන් විසින් අධ්‍යයනය කරන අතර, අපරාධ විද්‍යා ප්‍රවේශය යටතේ අපරාධ විෂය ධාරාව තුළ සාකච්ඡාවට භාජනය කරන මූලික සංකල්පය විමසීමට ලක් කෙරේ. | |
| **06** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| **07** | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණ**<br>• අපරාධ හා බාලාපරාධවල ස්වභාවය හා මූලික ලක්ෂණ පිළිබඳ විමසා බැලීම<br>• අපරාධ විද්‍යාව හා එහි විෂය ක්ෂේත්‍රය පිළිබඳ හඳුනා ගැනීම<br>• අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ විවිධ අපරාධ වර්ගීකරණයට ලක් කර ඇති ආකාරය හා එසේ වර්ග කර ඇති ඇති අපරාධවල මූලික ලක්ෂණ හඳුනා ගැනීම<br>• අපරාධ පිළිබඳ දත්ත හා තොරතුරු රැස්කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයක් ලබාදීම | |
| **08** | **පාඨමාලා ඒකකයේ ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br><br>• අපරාධ හා බාලාපරාධවල ස්වභාවය හා මූලික ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවීම<br>• අපරාධවිද්‍යාවේ අරමුණු සහ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධ කර ගත හැකිවීම<br>• අපරාධවල ස්වභාවය අනුව අපරාධ වර්ගකර ඇති ආකාරය සම්බන්ධයෙන් දැනුවත් භාවයක් ලබාගත හැකි වීම<br>• අපරාධ පිළිබඳ දත්ත හා තොරතුරු රැස් කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගත හැකිවීම | |
| **09** | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| | ප්‍රධාන මාතෘකා | සෙසු මාතෘකා | |
|---|---|---|---|
| | 1. අපරාධ හා මානව සමාජය | • මානව සමාජ සම්බන්ධතා පිළිබඳ අගනාකම් ධර්මතා හා අපරාධකාරී චර්යාව | |
| | 2. අපරාධ පිළිබඳ නිර්වචන හා මූලික ලක්ෂණ | • සමාජමය විග්‍රහයන් සහ සමාජ විද්‍යාත්මක නිර්වචන<br>• නීතිමය විග්‍රහයන් සහ නීතිමය නිර්වචන | |
| | 3. බාලාපරාධ පිළිබඳ නිර්වචන හා මූලික ලක්ෂණ | • සමාජමය විග්‍රහයන් සහ සමාජ විද්‍යාත්මක නිර්වචන<br>• නීතිමය විග්‍රහයන් සහ නීතිමය නිර්වචන | |
| | 4. අපරාධ විද්‍යාව පිළිබඳ හැඳින්වීම | • අපරාධ විද්‍යාවේ ඓතිහාසික සංවර්ධනය<br>• අපරාධ විද්‍යාව පිළිබඳ නිර්වචන | |
| | 5. අපරාධ විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය | • නීතිය පිළිබඳ සමාජ විද්‍යාව අපරාධ හේතු විද්‍යාව දණ්ඩන වේදය අපරාධ ගොදුරු වේදය හා අපරාධ යුක්ති ක්‍රමය | |
| | 6. අපරාධ වර්ගීකරණය | • අපරාධ පිළිබඳ නීතිමය වර්ගීකරණය සහ ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රහය මගින් අපරාධ වර්ගකර ඇති ආකාරය<br>• අපරාධ පිළිබඳ ආයතනික වර්ගකිරීම් හා ශ්‍රී ලංකාවේ පොලීසිය සහ වෙනත් ආයතන අපරාධ වර්ගකර ඇති ආකාරය | |
| | 7. අපරාධ වර්ගීකරණය | • පුද්ගලයින්ට එරෙහි අපරාධ<br>• දේපලවලට එරෙහි අපරාධ<br>• මහජන සාමයට එරෙහි අපරාධ<br>• ගොදුරු විරහිත අපරාධ<br>• වෘත්තීය අපරාධ<br>• සුදුකරපටි අපරාධ<br>• පරිගණක තාක්ෂණය හා අන්තර්ජාල භාවිතය ආශ්‍රිත අපරාධ<br>• ළමයින්ට එරෙහි අපරාධ හා ළමා අපයෝජනය | |
| | 8. අපරාධ පිළිබඳ දත්ත හා තොරතුරු රැස්කිරීම | • නිලවාර්තා හා සංඛ්‍යා ලේඛන භාවිතය<br>• ශ්‍රී ලංකාවේ අපරාධ පිළිබඳ සංඛ්‍යා ලේඛන හා නිලවාර්තා<br>• අපරාධවලට ගොදුරු වූවන් පිළිබඳ සමීක්ෂණ<br>• අපරාධකාරීත්වය පිළිබඳ<br>• ස්වයංවාර්තා | |

| | | |
|---|---|---|
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන හා ඉදිරිපත් කිරීම් |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | |
| | **අඛණ්ඩ ඇගයීම්** | පැවරුම් ලකුණු (20) |
| | **අවසාන පරීක්ෂණය** | වසර අවසාන පරීක්ෂණය සඳහා ලකුණු (80) |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ** | |


1. අමරසේකර, දයා. 2012, ***අපරාධ විද්‍යාව***, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල
2. අභයසුන්දර, ප්‍රණීත්. 1993, ***බෞද්ධ සමාජ පාලනය හා අපරාධ විද්‍යාව***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
3. කරුණාතිලක, කේ. 1998, ***අපරාධ බාලාපරාධ හා පුනරුත්ථාපනය***, මාලිංග ප්‍රකාශකයෝ, කඩවත
4. ගුණරත්න, රාජා. 2009, ***අපරාධ නීතිය, නීතිය පිළිබඳ හැඳින්වීම සහ අපරාධ නීතියේ මූලික සිද්ධාන්ත***, කර්තෘ ප්‍රකාශනයකි.
5. රත්නපාල, නන්දසේන. 1990, ***අපරාධ විද්‍යාවේ මූලධර්ම 01***, ආරිය ප්‍රකාශකයෝ , වරකාපොල
6. Siegel,Larry, J. 2006, ***Criminology, (Ninth edition***), Thomas Learning Inc, USA
7. Reid, Sue, Titus. 1997, ***Crime and Criminology (eight editon***), MacGraw- Hill InC Newyork

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | CRGE 1002 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | අපරාධ යුක්ති ක්‍රමය |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 5 | **හැඳින්වීම**<br>අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය (Criminology and Criminal Justice), යන විෂය න්‍යායාත්මකව, සංකල්පීය හා ප්‍රායෝගික වශයෙන් මිනිසුන්ගේ අපරාධකාරී චර්යාවන් (Criminal Behavior) බාල අපචාර (Delinquency) කාන්තාවන්ගේ අපචාරී හැසිරීම්, (Deviance of Women), ආධුනිකයන්ගේ අපරාධ (Recidivist)හා ළමා අපයෝජනය ආදී වූ හැසිරීම් පිළිබඳව අධ්‍යයනය කරයි. එහිදී නීති විද්‍යාත්මකව, සමාජ විද්‍යාත්මකව, අපරාධ විද්‍යාත්මකව බහුවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් යුක්තව අපරාධ හා අපරාධ යුක්තිය, පිළිබඳව සංකීර්ණ ලෙස අධ්‍යයනය කරනු ලබයි.<br>ජාතික හා ජාත්‍යන්තර වශයෙන් අපරාධ පිළිබඳ හා අපරාධ යුක්තිය පිළිබඳව ගොඩනැගුණා වූ න්‍යායන් හා සංකල්පයන් මෙන්ම ප්‍රායෝගික අත්දැකීම් හා එහි ප්‍රතිඵල ප්‍රයෝජනයට ගනිමින් තමන්ගේ රටෙහි නීතිය දණ්ඩනවේදය, අපරාධ යුක්ති ක්‍රමය, නීති සම්පාදනය, බන්ධනාගාරගත කිරීම, පුනරුත්ථාපනය යනාදී වූ සංකීර්ණ එකිනෙකට බැඳුණු අපරාධ යුක්ති පරිපාලන පද්ධති ක්‍රියාදාමයන් (Integrated Criminal Justice System)පිළිබඳව සාර්ව හා සූක්ෂම මට්ටමින් දැනුම හා අවබෝධය ලබා දීම මෙම පාඨමාලාව තුළින් බලාපොරොත්තු වේ. | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| 7 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• අපරාධ යුක්ති ක්‍රමයේ මූලික අරමුණු හා එහි විෂය ක්ෂේත්‍රය පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීම<br>• පොලිස් සේවයේ ආරම්භය විකාශය හා කාර්යභාරය පිළිබඳව සාකච්ඡා කිරීම<br>• අධිකරණ ක්‍රියාවලියේ අරමුණු සහ එහි ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීම<br>• දණ්ඩනය පිළිබඳ මූලික සිද්ධාන්ත හා එහි අරමුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම<br>• බන්ධනාගාර ක්‍රමයේ හා පුනරුත්ථාපනයේ ආරම්භය, විකාශය හා අරමුණු පිළිබඳව මූලික අවබෝධයක් ලබා දීම | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• අපරාධ, අපචාර හා අනෙකුත් නීති විරෝධී හැසිරීම් සහ ඒ හා බැඳි නෛතික තත්ත්වයන් හඳුනාගනී.<br>• අපරාධ යුක්ති පරිපාලන ක්‍රියාදාමයේ ප්‍රායෝගික හා න්‍යායාත්මක වටිනාකම විග්‍රහ කළ හැකිය.<br>• අපරාධ විද්‍යාවේ න්‍යාය හා සංකල්ප අපරාධ යුක්ති ක්‍රියාදාමය සමඟ සැසඳිය හැකිය.<br>• අපරාධ යුක්ති පරිපාලන පද්ධතියේ කාර්යක්ෂමතාව පෙරට වඩා වර්ධනය කළ හැකිය.<br>• න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබන්නාවූ නැණ නුවණ හේතු කරගෙන සමාජයට හා රටට ඉහළ සේවයක් ලබාදිය හැක.<br>• අපරාධ යුක්ති පරිපාලන ධුරාවලිය රැකියාවල නිරතවීමට පහසුවේ. | |
| 9 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| | ප්‍රධාන මාතෘකා | සෙසු මාතෘකා | |
|---|---|---|---|
| | 1. අපරාධ යුක්ති ක්‍රියාදාමය පිළිබඳව හැඳින්වීම | • අපරාධ යුක්තිය<br>• අපරාධ යුක්ති පරිපාලනය<br>• අපරාධ යුක්ති පද්ධති පිළිබඳ මූලික හැඳින්වීමක් | |
| | 2. අධිකරණ ධුරාවලිය පිළිබඳ හැඳින්වීම | • ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, සමථ මණ්ඩල හා ප්‍රාථමික උසාවි | |
| | 3. ශ්‍රී ලංකාවේ නීතික්‍රම සහ නීති ඉතිහාසය පිළිබඳ කෙටි හැඳින්වීමක් | • තේසවලාමේ නීතිය<br>• මුස්ලිම් නීතිය<br>• මුක්කුවාර් නීතිය<br>• බෞද්ධ නීතිය<br>• හින්දු නීතිය<br>• උඩරට නීතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් | |
| | 4. පුරාතන ශ්‍රී ලංකා යුක්තිය පසිඳලීම | • සිංහල අධිකරණ ක්‍රමය<br>• යුක්තිය පසිඳලීමේ ක්‍රමය (නුවර යුගය දක්වා)<br>• පුරාතන ශ්‍රී ලංකාවේ පැවති දණ්ඩන ක්‍රම | |
| | 5. එංගලන්තයේ හා ඇමෙරිකාවේ පොලිස් ක්‍රමය ආරම්භය හා විකාශය | • එංගලන්තයේ පොලිස් ක්‍රමයේ ආරම්භය හා විකාශය හා වර්තමාන තත්ත්වය<br>• ඇමරිකාවේ පොලිසියේ කාර්යභාරය හා විකාශය පිළිබඳ මූලික හැඳින්වීම | |
| | 6. පොලිස් සේවයේ අරමුණු හා කාර්යභාරයේ විකාශය | • ශ්‍රී ලංකාවේ පොලිසියේ ඓතිහාසික පසුබිම හඳුනා ගැනීම<br>• පොලීසියේ ප්‍රධාන කාර්යභාරය විකාශය වූ ආකාරය<br>• අපරාධ පාලනය හා නිවාරණය පිළිබඳව ඔවුන්ට පැවරී ඇති වගකීම<br>• පොලිස් මහජන සම්බන්ධතාව වැඩිදියුණු කිරීමෙහි ලා පොලීසිය සතු වගකීම | |

| | | | |
|---|---|---|---|
| | 7. අධිකරණ ධුරාවලියේ ප්‍රධාන අරමුණු හා කාර්යභාරයන් ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය ඇසුරින් පැහැදිලි කිරීම (අපරාධකාරී චර්යාව සම්බන්ධයෙන්) | • සමථ මණ්ඩලයේ කාර්යභාරය<br>• මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යභාරය (ලඝු නඩු හා අධිචෝදනීය නඩු සම්බන්ධයෙන්)<br>• මහාධිකරණයේ අපරාධ නඩු සම්බන්ධයෙන් කාර්යභාරය<br>• අපරාධ නඩු සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ කාර්යභාරය | |
| | 8. බන්ධනාගාර ක්‍රමය පිළිබඳ හැඳින්වීම | • බන්ධනාගාරගත කිරීමේ අරමුණු<br>• මුල්කාලීන බන්ධනාගාරගත කිරීම් සහ දඬුවම්වල ස්වභාවය | |
| | 9. බන්ධනාගාර ක්‍රමයේ ආරම්භය හා විකාශනය(එංගලන්තය සහ ඇමරිකාව) | • විධිමත් බන්ධනාගාර ක්‍රමයක් බිහිවීමට බලපානු ලබන සමාජ, ආර්ථික, දේශපාලන කරුණු හඳුන්වා දීම<br>• පුනරුත්ථාපනය පිළිබඳ මතවාදයන්ගේ ආරම්භය හඳුන්වා දීම<br>• බන්ධනාගාර ප්‍රතිසංස්කරණය | |
| | 10. ඇමරිකානු බන්ධනාගාර ක්‍රමය ආරම්භය හා විකාශනය | • ඇමරිකානු බන්ධනාගාර ක්‍රමයේ ආරම්භය<br>• ඔ(ර්)බන්, එල්මීරා, පෙනිසිල්වේනියානු ක්‍රමයන් පිළිබඳව පැහැදිලි කිරීම | |
| | 11. බන්ධනාගාර වැඩසටහන් සහ නැවත සමාජගත කිරීමේ උපායමාර්ගයන් පිළිබඳව හඳුන්වා දීම | • බන්ධනාගාරය තුළ අනුගමනය කරනු ලබන විවිධ වූ වැඩසටහන්වලින් සිරකරුවන් පුනරුත්ථාපනය කොට නැවත සමාජගත කිරීමට අනුගමනය කරන ක්‍රමවේදයන් පැහැදිලි කිරීම<br>• ජ්‍යාත්‍යන්තර බන්ධනාගාරගත සිරකරුවන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ජාත්‍යන්තර නීතිරීති හා පිළිගැනීම් පිළිබඳ හැඳින්වීම | |
| | 12. දණ්ඩනවේදය හා දඬුවම | • දණ්ඩනවේදය යනු කුමක්ද ?<br>• දඬුවම යනු කුමක්ද, දඬුවම් පැමිණවීමේ අරමුණු හා කාර්යභාරය කුමක්ද යන්න<br>• දඬුවමෙහි අන්තර්ගත දඩගැසීම, වන්දි ගෙවීම, සිරගත කිරීම හා වෙනත් කොන්දේසි මගින් අපරාධකාරී චර්යාවන්හි නිරතවීම වැළැක්වීම සඳහා කරනු ලබන නෛතික ක්‍රියාදාමයන් හඳුනා ගැනීම | |

| | | | |
|---|---|---|---|
| | 13. පුනරුත්ථාපනය ආරම්භය විකාශය හා අරමුණු පිළිබඳව හඳුනා ගැනීම | • පුනරුත්ථාපනය යනු කුමක්ද ?<br>• පුනරුත්ථාපනයේ අරමුණු<br>• පුනරුත්ථාපනය පිළිබඳ සංකල්ප<br>• පුනරුත්ථාපනය පිළිබඳ පවතින ගැටලු | |
| | 14. පුනරුත්ථාපන වැඩසටහන්වල සවභාවය | • ආයතනගත පුනරුත්ථාපනය වැඩසටහන්<br>• සමාජගත පුනරුත්ථාපනය වැඩසටහන් | |
| | 15.ප්‍රජාපාදක විශෝධනය | • ප්‍රජාපාදක විශෝධන ක්‍රමය හැඳින්වීම<br>• ප්‍රජාපාදක විශෝධනය ආරම්භය විකාශය හා වර්තමාන තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කිරීම<br>• පරිවාසය<br>• අත්හිටවූ සිර දඬුවම්<br>• ප්‍රජා සේවා නියෝග | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 20%ක් හිමිවේ. නිබන්ධන, මධ්‍යවාර පරීක්ෂණය, කණ්ඩායම් හෝ කේවල ව්‍යාපෘති යන එක් ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයක් මගින් ඇගයීම සිදු කෙරේ. | |
| | **අවසාන පරීක්ෂණය** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 80%ක් හිමිවේ. පැය තුනක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු වරණීය රචනා ප්‍රශ්න පත්‍රයක් ලැබේ. | |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. ජයතිස්ස කොස්තා 2002, ***නීති ක්‍රම සහ නීති ඉතිහාසය, අපරාධ විද්‍යාව*** , එස් ගොඩගේ සහ සහෝදරයෝ.
2. ජයතිස්ස කොස්තා, 2000, ***නීති විද්‍යාව,*** රත්න ප්‍රකාශකයෝ .
3. සුනිල් රාජනෙත්ති සහ ඩබ්ලියු ඒ සරත්චන්ද්‍ර 2011, ***අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය***, ආරිය ප්‍රකාශකයෝ.
4. නන්දසේන රත්නපාල 2005, ***අපරාධ විද්‍යාවේ මූලධර්ම 1 ,2*** ,ආරිය ප්‍රකාශකයෝ.
5. නිරංජි විජේවර්ධන 2007, ***අපරාධ විද්‍යාවේ මූලධර්ම***, වින්දන ප්‍රකාශකයෝ.
6. කේ. කරුණාතිලක, 1998, ***අපරාධ, බාල අපරාධ හා පුනරුත්ථාපනය***, මාලිංග ප්‍රකාශකයෝ.

| | | | |
|---|---|---|---|
| **1** | **පාඨමාලා ඒකක කේතකය** | ECGE 1001 | |
| **2** | **පාඨමාලා ඒකකයේ නම** | සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම | |
| **3** | **ඒකක අගය** | 04 | |
| **4** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර | |
| **5** | **හැඳින්වීම**<br>ආර්ථික සංකල්ප හා මූලධර්ම පුද්ගල ජීවිතයේ අවශ්‍ය කොටසක් බවට පත්ව ඇත. එබැවින් මෙම විෂය මඟින් ආර්ථික විද්‍යාවේ අවශ්‍යතාව හා වැදගත්කම සිසුන්ට හඳුන්වාදීමට සැලසුම් කර ඇත. | | |
| **6** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත | |
| **7** | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>ඉල්ලුම හා සැපයුම, මිල තීරණය, සම්පත් බෙදාහැරීම, භාණ්ඩ හා සේවා බෙදාහැරීම, පාරිභෝගික හැසිරීම පිළිබඳ න්‍යාය, වෙළඳපොළ ආදී සංකල්ප සමඟ ආර්ථික පද්ධතිය හා ආර්ථික විශ්ලේෂණයන් හඳුන්වාදීම මෙම විෂයයේ අරමුණ වේ. | | |
| **8** | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්,<br>• සූක්ෂම ආර්ථිකවිද්‍යාවේ මූලික සංකල්ප හා ශිල්පක්‍රම පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකි වේ.<br>• ප්‍රායෝගික ආර්ථික ගැටලු විසඳීම සඳහා ආර්ථික සංකල්ප යොදාගැනීමට හැකි වේ. | | |
| **9** | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | | |
| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
| | 1. සූක්ෂම ආර්ථික විද්‍යාව හැඳින්වීම | • සූක්ෂම ආර්ථික විද්‍යාවේ විෂය ක්ෂෙත්‍රය<br>• ආර්ථික විද්‍යාව තුළ සූක්ෂම ආර්ථික විද්‍යාවේ කාර්යභාරය සහ වැදගත්කම<br>• සාර්ව ආර්ථික විද්‍යාවට ඇති සම්බන්ධය<br>• යථානුරූපී හා අභිමතානුරූපී ප්‍රකාශන<br>• විද්‍යාත්මක ක්‍රමය භාවිතය<br>• හිඟකම, ආවස්ථික පිරිවැය, නිෂ්පාදන හැකියා මායිම<br>• නිෂ්පාදන සාධක<br>• මූලික ආර්ථික ගැටළු | |
| | 2. ආර්ථික ක්‍රම/ආර්ථික සංවිධාන/ආර්ථික පද්ධති | • ධනවාදී ආර්ථික ක්‍රමය<br>• සමාජවාදී/මධ්‍ය සැලසුම් ආර්ථික ක්‍රමය<br>• මිශ්‍ර ආර්ථික ක්‍රමය<br>• ආර්ථික ක්‍රමයන්ගේ නව ප්‍රවණතා | |

| | | | |
|---|---|---|---|
| | 3.පාරිභෝගික හැසිරීම පිළිබඳ න්‍යාය | • සංඛ්‍යා සූචක ප්‍රවේශයඃ ආන්තික උපයෝගිතා න්‍යාය<br>• ක්‍රම සූචක ප්‍රවේශයඃ උපේක්ෂා වක්‍ර විග්‍රහය සහ හෙළිකළ වරණ න්‍යාය | |
| | 4. වෙළෙඳපොළ | • වෙළෙඳපොළ ඉල්ලුම<br>• වෙළෙඳපොළ සැපයුම<br>• නම්‍යතාවඃ- ඉල්ලුම් නම්‍යතාව, සැපයුම් නම්‍යතාව<br>• සමතුලිතය | |
| | 5. වෙළෙඳපොළ තුළ රජයේ මැදිහත්වීම | • බදුකරණය<br>• නිෂ්පාදන සහනාධාර<br>• මිල පාලනය<br>• පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයඃ සුභසාධන බලපෑම | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරයඃ** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා | |
| **11** | **ඇගයීමේ ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | ඉදිරිපත් කිරීම්, ව්‍යාපෘති ඇගයීම් ලකුණු (40– 20) | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්‍ෂණය ලකුණු (60-80) | |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. Ahuja, H.L. (2009). ***Principles of Microeconomics***.New Delhi: S. Chand & Company.
2. Koutsoyiannis, A.(1979). ***Modern Microeconomics***. London: McMillan Press.
3. Lipsey, R.G. (1995). ***An Introduction to Positive Economics***. London: Oxford University Press.
4. Lipsey, R.G.,& Chrystal, K.A. (1999). ***Principles of Economics*** (9th ed.). London: Oxford University Press.
5. Lipsey, R.G.,& Harbury, C. (1992). ***First Principles of Economics***. London: McMillan Press.
6. Samuelson, P.A. (1973). ***Economics***. Tokyo: McGraw-Hill Kogakusha Ltd.
7. ඩෙවට්, කේ.කේ. සහ වර්මා, ජේ.ඩී. (1966). ***මූලික ආර්ථික සිද්ධාන්ත,*** (පරිවර්තනයකි), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
8. සැමුවෙල්සන්, පී.ඒ. සහ නෝඩ්හවුස්, ඩබ්.ඩී. (1990). ***ආර්ථික විද්‍යාව*** (පරිවර්තනයකි) ශ්‍රී ලංකා ඇමරිකානු අධ්‍යාපනික සමාජය, කොළඹ.
9. ලක්ෂ්මන් ඩබ්.ඩී., (1998). ***ආර්ථික විශ්ලේෂණය***, කරුණාරත්න ප්‍රකාශකයෝ, කොළඹ.

<table>
<tr><td>1</td><td>**පාඨමාලා ඒකක කේතකය**</td><td colspan="2">ECGE 1002</td></tr>
<tr><td>2</td><td>**පාඨමාලා ඒකකයේ නම**</td><td colspan="2">සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම</td></tr>
<tr><td>3</td><td>**ඒකක අගය**</td><td colspan="2">04</td></tr>
<tr><td>4</td><td>**අධ්‍යයන වර්ෂය**</td><td colspan="2">පළමුවන වසර</td></tr>
<tr><td>5</td><td colspan="3">**හැඳින්වීම**<br><br>තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පූර්ණ සේවා නියුක්තිය සහ ජාතික නිමැවුම වැඩි කරගැනීමත්, අභ්‍යන්තර හා බාහිර ස්ථාවරත්වයක් පවත්වා ගැනීමත් ශ්‍රී ලංකාව ඇතුළු බොහොමයක් රටවල ආර්ථික ප්‍රතිපත්තීන්හි මූලික අරමුණු බවට පත්ව ඇත. මෙකී සන්දර්භය සාර්ව ආර්ථික විද්‍යාවේ දී ප්‍රධාන වශයෙන් සාකච්ඡා කෙරේ. එබැවින් සාර්ව ආර්ථික විද්‍යාවේ මූලික අවබෝධය සිසුන් වෙත ලබාදීම මෙම විෂය මඟින් සැලසුම් කර ඇත.</td></tr>
<tr><td>6</td><td>**පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා**</td><td colspan="2">නැත</td></tr>
<tr><td>7</td><td colspan="3">**පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>ජාතික ආදායම හා නිමැවුම, සේවා නියුක්තිය, මිල මට්ටම හා උද්ධමනය, රාජ්‍ය අය-වැය, රාජ්‍ය ප්‍රතිපත්ති හා පොළී අනුපාතිකය ආදී සංකල්ප සමග ආර්ථික පද්ධතිය හා ආර්ථික විශ්ලේෂණයන් හඳුන්වාදීම මෙම විෂයයේ අරමුණ වේ.</td></tr>
<tr><td>8</td><td colspan="3">**පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• සාර්ව ආර්ථික විද්‍යාවේ මූලික සංකල්ප හා ශිල්පක්‍රම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ.<br>• ප්‍රායෝගික ආර්ථික ගැටලු විසඳීම සඳහා ආර්ථික සංකල්ප යොදා ගැනීමට හැකි වේ.</td></tr>
<tr><td>9</td><td colspan="2">**පාඨමාලා ඒකකයේ අන්තර්ගතය**</td><td></td></tr>
<tr><td></td><td>**ප්‍රධාන මාතෘකා**</td><td>**සෙසු මාතෘකා**</td><td></td></tr>
<tr><td></td><td>1. සාර්ව ආර්ථික විද්‍යාව හැඳින්වීම</td><td>• සාර්ව ආර්ථික විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය<br>• ආර්ථික විද්‍යාව තුළ සූක්ෂම ආර්ථික විද්‍යාවේ කාර්යභාරය සහ වැදගත්කම<br>• සාර්ව ආර්ථික විද්‍යාවට ඇති සම්බන්ධය<br>• ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්<br>• තොග විචල්‍යයන් සහ ප්‍රවාහ විචල්‍යයන්</td><td></td></tr>
<tr><td></td><td>2. ජාතික ආදායම් ගිණුම්කරණය</td><td>• ජාතික ආදායම් ගිණුම්කරණය පිළිබඳ මූලික සංකල්ප<br>• ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය<br>• දළ දේශීය නිෂ්පාදිතය මැනීම: නිමැවුම් ප්‍රවේශය, ආදායම් ප්‍රවේශය, වියදම් ප්‍රවේශය<br>• ජාතික අදායම් ගිණුම්කරණයේ වැදගත්කම හා සීමා<br>• සාර්ව ආර්ථික සමතුලිතය (සරල, සංවෘත, විවෘත)</td><td></td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | 3. මුදල් හා බැංකුකරණය | • මුදලේ විකාශය<br>• මුදලේ කාර්යයන්, මුදල් වර්ග හා මුදලේ වටිනාකම<br>• මුදල් සැපයුම (M1, M2, M2b, M4)<br>• මුදල් ඉල්ලුම: කේන්සියානු ප්‍රවේශය<br>• මහ බැංකුව: මහ බැංකුවේ අරමුණු, කාර්යයන් හා ණය පාලන උපකරණ<br>• වාණිජ බැංකු: කාර්යයන් හා මුදල් මැවීම | |
| | 4. මිල මට්ටම හා උද්ධමනය | • නිර්වචන<br>• මිල දර්ශක<br>• උද්ධමනය මැනීම<br>• උද්ධමන වර්ග<br>• උද්ධමනයේ ආර්ථික ප්‍රතිවිපාක<br>• උද්ධමනය පිළිබඳ න්‍යායයන් (ඉල්ලුමෙන් ඇදුණු හා පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය, උද්ධමනය පිළිබඳ ව්‍යුහවාදී කල්පිතය, ෆිලිප්ස් වක්‍රය) | |
| | 5. අන්තර්ජාතික වෙළඳ න්‍යාය හා ගෙවුම් තුලනය | • අන්තර්ජාතික වෙළෙදාමේ පදනම: නිරපේක්ෂ හා සාපේක්ෂ වාසි න්‍යාය<br>• ගෙවුම් තුලනය: ව්‍යුහය සහ ගණුදෙණු<br>• විනිමය අනුපාතිකය: ස්ථාවර විනිමය අනුපාතිකය, විනිමය අනුපාතිකය, පාවෙන විනිමය අනුපාතිකය, න විනිමය අනුපාතික, ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතික<br>• විනිමය ක්ෂය වීම හා අධිතක්සේරු වීම<br>• විනිමය අවප්‍රමාණය හා විනිමය අතිප්‍රමාණය<br>• තීරු බදු හා තීරු බදු නොවන බාධක<br>• ගෙවුම් තුලනය, විනිමය අනුපාතිකය හා ජාතික ගිණුම් අතර සම්බන්ධතාව | |
| | 6. ආර්ථික වර්ධනය | • නිර්වචන, මිනුම් හා නිශ්චායක<br>• ආර්ථික වර්ධනයේ පිරිවැය හා ප්‍රතිලාභ | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය:** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | කණ්ඩායම් ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම්, ව්‍යාපෘති ඇගයීම් ලකුණු (40 – 20) | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය (ලකුණු 60-80) | |

**12** **නිර්දේශිත ග්‍රන්ථ**


1. Lipsey, R.G. (1995). ***An introduction to positive economics***.London: Oxford University Press.
2. Lipsey, R.G.,& Chrystal, K.A (1999). ***Principles of economics*** (9thed.). London: Oxford University Press.
3. Lipsey, R.G. & Harbury, C. (1992). ***First principles of economics***. London: McMillan Press.
4. Samuelson, P.A. (1973). ***Economics***. Tokyo: McGraw-Hill Kogakusha Ltd.
5. අතුකෝරාළ, ප්‍රේමචන්ද්‍ර (1985) ***මුදල් හා මූල්‍ය ආයතන***, දීපානි, නුගේගොඩ.
6. තිලකරත්න, සිරිසේන (1996) ***ආර්ථිකවිද්‍යා පදනම***, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
7. දයාරත්න, ඊ (2006) ***උසස් පෙළ හා වෘත්තීය විභාග සඳහා ආර්ථික විද්‍යාව***, කර්තෘ ප්‍රකාශනයකි, කොට්ටාව.
8. සෝමසුන්දර, දයානන්ද (1996) ***සාර්ව ආර්ථික විද්‍යාව***, එස්. ගොඩගේ, කොළඹ.
9. ලක්ෂ්මන්, ඩබ්.ඩී. (1998) ***ආර්ථික විශ්ලේෂණය***, කොළඹ.

| | | |
|---|---|---|
| **1** | **පාඨමාලා කේතකය** | GEGE 1001 |
| **2** | **පාඨමාලා ඒකකයේ නම** | භූගෝල විද්‍යාත්මක චින්තනය හා ක්‍රමවේදය |
| **3** | **ඒකක අගය** | 04 |
| **4** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| **5** | **හැඳින්වීම**<br>භූගෝල විද්‍යාත්මක චින්තනයේ ඇති වැදගත්කම වර්තමානයේ දී සියලු ක්ෂේත්‍රයන්හි වඩාත් අවධානයට බඳුන් වී ඇති හෙයින් එහි ඉගැන්වෙන මූලික සංකල්ප පිළිබඳ අවබෝධය පුළුල් කිරීමත් විවිධ කාර්යයන්හිදී ඒවා භාවිතයට ගැනීමේ හැකියාව ප්‍රගුණ කිරීමත් කාලීන අවශ්‍යතාවකි. විශේෂයෙන් ම සැලසුම් සම්පාදනය, ආපදා කළමනාකරණය, සම්පත් උපයෝජනය මෙන්ම භූ දේශපාලනික ක්‍රමෝපායන්හි දී භූගෝල විද්‍යාත්මක චින්තනය පදනම් කරගත් සාර්ව ප්‍රවේශය ඉතා වැදගත්ය. ඈත අතීතයේ පටන් වර්තමානය දක්වා භූගෝල විද්‍යාත්මක දැනුම භාවිත කර ඇති ආකාරය විවිධ ගුරු කුල ආශ්‍රයෙන් විමසා බැලිය හැකිය. ගෝලීය මට්ටමේ සිට ක්ෂුද්‍ර මට්ටම දක්වා වූ විවිධ ගැටලු හඳුනා ගැනීමටත් ඒවා විශ්ලේෂණය කර නිසි ප්‍රතිඵල ලබා ගැනීමටත් ඒ ඔස්සේ අවකාශීය තීරණ ගැනීමටත්, පුරෝකතනය සඳහා ආකෘති නිර්මාණය කිරීමටත් භාවිතයට ගන්නා ක්‍රමශිල්ප පිළිබඳ පුළුල් අවබෝධයක් පැවතීම ද ප්‍රායෝගික වශයෙන් ඉතා වැදගත් වේ. | |
| **6** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| **7** | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• භූගෝල විද්‍යාවේ න්‍යාය, සංකල්ප හා මූලධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දීම<br>• ප්‍රායෝගික ලෝකය තුළ භූගෝල විද්‍යාත්මක චින්තනයේ වැදගත්කම සහ වලංගුතාව අවබෝධ කරවීම<br>• තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී වඩාත් ඵලදායී ලෙස භූගෝල විද්‍යාත්මක දැනුම හා ක්‍රම ශිල්ප භාවිත කිරීමේ හැකියාව ප්‍රගුණ කිරීම | |
| **8** | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින් ,<br>• භෞතික හා මානව අවකාශය පිළිබඳ භූගෝල විද්‍යාත්මක චින්තනයේ සුවිශේෂත්වය වටහා ගනියි<br>• තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ භූගෝල විද්‍යාත්මක චින්තනයේ හා ක්‍රමවේදයේ උපයෝගීතාව අවබෝධ කර ගනියි<br>• භෞතික හා සංස්කෘතික භූ දර්ශනයක ස්වභාවය, වර්ධනය, වෙනස්වීම, රටා සහ ක්‍රියාවලීන් අධ්‍යයනය කිරීමේ උචිත ක්‍රමශිල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගනියි | |
| **9** | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| | | | |
|---|---|---|---|
| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
| | 1. භූගෝල විද්‍යාවේ අන්තර්ගතය | • භූගෝල විද්‍යාව යනු කුමක්ද?<br>• භූගෝල විද්‍යාත්මක චින්තනයේ පදනම<br>• භූගෝල විද්‍යාව පිළිබඳ නිර්වචනයන්හි විකාසය<br>• විෂයක් වශයෙන් භූගෝල විද්‍යාව හඳුනා ගැනීම<br>• භූගෝල විද්‍යාවේ ද්විධාකරණ | |

| | | | |
|---|---|---|---|
| | 2. භූගෝල විද්‍යා චින්තනය හා එහි වර්ධනය | • මූලික භූගෝල විද්‍යා සංකල්ප<br>• මිනිස්-පරිසර අන්තර්සම්බන්ධතාව පිළිබඳ භූගෝල විද්‍යාත්මක චින්තනය<br>• අවකාශය හා කාලය පිළිබඳ භූගෝල විද්‍යාව<br>• භූගෝල විද්‍යාඥයන්ගේ කාර්යභාරය<br>• භූගෝල විද්‍යා සංගම්වල දායකත්වය | |
| | 3. නූතන භූගෝල විද්‍යාත්මක ප්‍රවේශ සහ එහි භාවිතය | • භූගෝල විද්‍යාවේ විවිධ ප්‍රවේශ<br>- ප්‍රාදේශීය ප්‍රවේශය<br>- පද්ධතික ප්‍රවේශය<br>- පරිණාමවාදී ප්‍රවේශය<br>- රැඩිකල්වාදී ප්‍රවේශය<br>- ස්ත්‍රීවාදී ප්‍රවේශය<br>- පශ්චාද් නූතනවාදී ප්‍රවේශය<br>• ගැටුම් හා ගැටලු අභිමුඛ කරගත් භූගෝල විද්‍යාව<br>• පරිසර විද්‍යාත්මක ප්‍රවේශය<br>• ජාතික රාජ්‍ය හා භූ දේශපාලනය | |
| | 4. භූගෝල විද්‍යාත්මක ක්‍රමවේදය හා ක්‍රම ශිල්ප | • භූගෝල විද්‍යාත්මක පර්යේෂණවලට පදනම් වන දර්ශනය<br>• භූගෝල විද්‍යාවේ ගුණාත්මක පර්යේෂණ<br>• භූගෝල විද්‍යාවේ ප්‍රමාණාත්මක පර්යේෂණ<br>• නූතන ක්ෂේත්‍රීය පර්යේෂණවල අන්තර්ගතය<br>• ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම ශිල්ප<br>• නූතන භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයන්හි භාවිත ශිල්පීය ක්‍රම | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | නියමිත පැය ගණනින් පැය 40ක් අදාළ මාතෘකා හා සම්බන්ධ දේශන වෙයි. ඉතිරිය ස්වයං අධ්‍යයන ක්‍රමය පදනම් කරගෙන කණ්ඩායම් සාකච්ඡා සහ කේවල ඉගෙනුම් ක්‍රම මගින් සම්පූර්ණ කෙරෙනු ඇත. | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 20%ක් හිමිවේ. නිබන්ධන, මධ්‍යවාර පරීක්ෂණය, කණ්ඩායම් හෝ කේවල ව්‍යාපෘති යන එක් ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයක් මගින් ඇගයීම සිදු කෙරේ. | |
| | **අවසාන පරීක්ෂණය** | වර්ෂාවසාන පරීක්ෂණයකි. නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 80%ක් හිමිවේ. පැය තුනක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු වරණීය රචනා ප්‍රශ්න පත්‍රයක් ලැබේ. | |

**12 නිර්දේශිත ග්‍රන්ථ**


1. දංගල්ල, එන්.කේ. 2019, **මානුෂ භූගෝල විද්‍යා අධ්‍යයන**, කර්තෘ ප්‍රකාශන.
2. එපිටවත්ත, එස්. 2005, **භූගෝල විාවේ න්‍යායාත්මක පසුබිම**, ස්ටැම්පර්ඩ් ලේක්, පන්නිපිටිය.
3. හෙන්නායක, එස්. කේ. සහ හෙන්නායක, එන්.එම්. 2005, **භූගෝලීය අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය සහ ශික්ෂණය පිළිබඳ සටහන්**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
4. පත්මසිරි, ඊ. එච්. ජී. සී. 2011, **භූගෝල විද්‍යාවේ දර්ශනය**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
5. Chorley, R.J. and Hagget, P.(eds.). 1965, **Models in Geography**, Methuen, London.
6. Flowerdew R. and David, M. (eds.). 2005, **Methods in Human Geography**, Pearson Education Limited, England.
7. Haggett, P. 2001, **Geography: A Global Synthesis**, Prentice Hall, London.
8. Holt-Jensen, A. 1988, **Geography: History and Concepts**, Paul Chapman, London.
9. John, A.M and David, T.H (eds.). 2004, **Unifying Geography**, Routledge, London.
10. Limb, M. and Claire, D. (eds.) 2001, **Qualitative Methodologies for Geographers: Issues and Challenges**, Arnold, London.
11. Lounsbury, J.F and Frank, T.A. 1986, **Introduction to Geographic Field Methods and Techniques**, Charles E. Merrill Publishing Company, Ohio.
12. Roland, F.B, Melvin, G.M. and Judy, M.O. (edts.). 1992, **Geography’s Inner World**, Rutgers University Press, New Jersey.

| | | |
|---|---|---|
| **1** | **පාඨමාලා ඒකකයේ කේතකය** | GEGE 1002 |
| **2** | **පාඨමාලා ඒකකයේ නම** | භෞතික හා මානව භූගෝල විද්‍යාව |
| **3** | **ඒකක අගය** | 04 |
| **4** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |

**5 හැඳින්වීම**

භූගෝල විද්‍යාව යන පුළුල් වූ විෂය පථය තුළ අඩංගු එක් පාඨමාලා ඒකකයක් ලෙස භෞතික හා මානව භූගෝල විද්‍යාව යන විෂය ඒකකය හඳුන්වා දිය හැකිය. මෙම විෂය ඒකකය තුළින් පෘථිවිය මතුපිට හා අභ්‍යන්තරයේ පවත්නා විවිධ භෞතික ක්‍රියාවලීන් හා රටාවන් මෙන්ම පෘථිවිය මතුපිට පවත්නා විවිධ මානව කටයුතු ආශ්‍රිත ක්‍රියාවලීන් හා රටාවන් පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ. මානව භූගෝල විද්‍යාව හා භෞතික භූගෝල විද්‍යාව යන විෂයන්ට අයත් වෙනත් ස්වාභාවික හා සමාජීය විද්‍යාවන්ගෙන් ආභාසය ලත් විෂය කරුණුවල සංකලනයකින් මෙම විෂය ඒකකය සමන්විත වේ.එසේ වුවද මෙහිදී භූගෝල විද්‍යාවට අනන්‍ය වූ අවකාශීය හා කාලික යථාදර්ශයකින් යුතුව විෂය කරුණු පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| **6** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |

**7 පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**

- සාකල්‍ය විෂය පථයකින් යුක්තව විවිධ වූ මානව හා භෞතික ක්‍රියාවලීන් හා රටා මෙන්ම පද්ධතීන් පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම සිසුන් තුළ අභ්‍යන්තරීකරණය කිරීම.
- තමා ජීවත්වන භෞතික හා මානව පරිසරය පිළිබඳව අවබෝධය ලබා ගැනීමට සිසුන් ධෛර්යමත් කිරීම.

**8 පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**

මෙම පාඨමාලා ඒකකය සාර්ථකව සම්පූර්ණ කිරීම තුළින් ;

- මානව හා භෞතික භූගෝල විද්‍යාවේ න්‍යායාත්මක යථාදර්ශයේ ඇති වැදගත්කම ඇගයීමට හැකියාව ලැබීම.
- මෙම විෂය තුළින් ලැබෙන සාකල්‍ය දැනුම නිසාම භෞතික හා මානව පරිසරයට සම්බන්ධ වූ විවිධ ගැටලු හා අභියෝග හඳුනා ගැනීමට හැකිවීම.
- ඉහත අංශයන් සම්බන්ධයෙන් ලබාගත් දැනුම විවිධ සංවර්ධන කටයුතු එනම් පරිපාලන හා ප්‍රතිපත්ති සම්පාදනයට මෙන්ම සිසුන්ගේ සාමාන්‍ය අවබෝධය සඳහා භාවිතයට ගතහැකිවීම.
- සමාජයේ විවිධ අවශ්‍යතාවලදී පර්යේෂණ, විශ්ලේෂණ හා ඉදිරිපත් කිරීම් සඳහා මෙයින් ලැබූ කුසලතා භාවිතකළ හැකිවීම.

**9 පාඨමාලා ඒකකයේ අන්තර්ගතය**

| ප්‍රධාන මාතෘකා | සෙසු මාතෘකා | |
|---|---|---|
| 1. භෞතික භූගෝල විද්‍යාව හැඳින්වීම | • නිර්වචන<br>• භෞතික භූගෝල විද්‍යාවේ විකාශනය | |
| 2. භෞතික භූගෝල විද්‍යාවේ විෂය අන්තර්ගතය | • උප විෂය ක්ෂේත්‍රයන්<br>• න්‍යායන් හා ආකෘතීන් | |

| | | | |
|---|---|---|---|
| | 3. පෘථිවිය සහ එහි විවිධත්වය | • ගෝලීය පද්ධති<br>• ශිලාගෝලය<br>• ජල ගෝලය<br>• වායුගෝලය<br>• ජෛව ගෝලය | |
| | 4. කාලය හා අවකාශීය විවිධත්වය පිළිබඳ භෞතික භූගෝල විද්‍යාත්මක අවබෝධය | • භූ විද්‍යා කාල චක්‍රය<br>• පෘථිවි පෘෂ්ඨයේ ප්‍රධාන භූරූපවල විවිධත්වය<br>• පාරිසරික විවිධත්වය | |
| | 5. භූදර්ශන පරිණාමය පිළිබඳ ආකෘතීන් හා මත | • ඩේවිස්ගේ ඛාදන චක්‍රය<br>• උතික්ෂිප්තය හා නග්නීකරණය<br>• සමතුලිතතා ආකෘතිය | |
| | 6. තැටි භූකාරක කල්පිතය | • මහද්වීපික ප්ලවන කල්පිතය<br>• භූමිකම්පා හා තැටිකාරක සංකල්පය | |
| | 7. බහිර්ජන්‍ය ක්‍රියාවලීන් සහ භූරූප, ඛාදනය, පරිවහනය ,නිස්සාධනය | • ගලන ජලය<br>• සුළඟ<br>• සාගර තරංග | |
| | 8. මානව භූගෝල විද්‍යාව හැඳින්වීම හා විෂය අන්තර්ගතය | • නිර්වචන<br>• මානව භූගෝල විද්‍යාවේ වර්ධනය<br>• උපවිෂය ක්ෂේත්‍රයන් හැඳින්වීම | |
| | 9. ලෝක ජනගහනය හා වියපත් ජන සංඛ්‍යාව | • ලෝක ජනගහනයේ කාලීන හා අවකාශීය ව්‍යාප්තිය<br>• ජනසංඛ්‍යා ව්‍යාප්තිය හා ඝනත්වය කෙරෙහි බලපාන සාධක<br>• වියපත් ජනසංඛ්‍යාව ආශ්‍රිත ප්‍රවණතා හා ගැටලු | |
| | 10. නවීන කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම | • නවීන කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම, ඒවායේ ලක්ෂණ හා ඒ ආශ්‍රිත බලපෑම් | |
| | 11. පාරිසරික සංචාරක කර්මාන්තය | • නිර්වචන<br>• පාරිසරික සංචාරක කර්මාන්තයේ විවිධ ප්‍රභේද<br>• පාරිසරික සංචාරක කර්මාන්තයේ විවිධ මානයන් හා ඒ ආශ්‍රිත බලපෑම් | |
| | 12. නාගරීකරණය | • නාගරීකරණය හා නාගරිකත්වය<br>• නාගරීකරණය හඳුනාගැනීමේ නිර්ණායක<br>• නාගරීකරණය ආශ්‍රිත සමාජ හා පාරිසරික ගැටලු | |
| | 13. ගෝලීයකරණය | • නිර්වචන<br>• ගෝලීයකරණයේ වාහක බලවේග<br>• ගෝලීයකරණයේ බලපෑම් | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | නියමිත පැය ගණනින් පැය 40ක් අදාළ මාතෘකා හා සම්බන්ධ දේශන වෙයි. ඉතිරිය කණ්ඩායම් සාකච්ඡා සහ ස්වේල ඉගෙනුම් ක්‍රම මගින් සම්පූර්ණ කෙරෙනු ඇත. | |

| | | |
|---|---|---|
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | |
| | **අඛණ්ඩ ඇගයීම්** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 20%ක් හිමිවේ. නිබන්ධන, මධ්‍යවාර පරීක්ෂණය, කණ්ඩායම් හෝ කේවල ව්‍යාපෘති යන එක් ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයක් මගින් ඇගයීම සිදු කෙරේ. |
| | **අවසාන පරීක්ෂණය** | වර්ෂාවසාන පරීක්ෂණයකි. නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 80%ක් හිමිවේ. පැය තුනක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු රචනා ප්‍රශ්න පත්‍රයක් ලැබේ. |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | |


1. Getis, A., Getis, J. and Fellman, J.D. 2008, ***Introduction to Geography. Eleventh edition.*** Mcgrow-hill higher education.
2. Hammond, C.W. 1979, ***Elements of human geography***. George Allen & Anwin Ltd.
3. Huntington, E. 1956, ***Principles of human geography. Sixth edition***. John Wiley Sons Inc. USA.
4. Jhonston, R.J., Gregory, D. and Davis, M.S. 1986, ***The dictionary of human geography***. Oxford Blackwell.
5. Keinth, C. 1979, ***An introduction to human geography: People, pattern and process***. Halsted.
6. Smith, D.M. 1977, ***Human geography***: A welfare approach. Edward Arnold.
7. White, C.L. and Renner, G.T. 1948, ***Human geography***: An ecological study of society. Appleton, New York.
8. Christopherson, R. W. 2000, Geosystems: ***An Introduction to Physical Geography***, Prentice Hall, New York.
9. Strahler, A.H. &Strahler, A.N. 2000, ***Introducing Physical Geography***, John Wiley & Son, New York.
10. Olliver,C.D. 1981, ***Tectonics and Landforms***, Langman, London.
11. Brown, E.H. and Waters, R.S. 1974, ***Progress in Geomorphology***. Institute of BritishGeographers. Special Publication Number Seven.
12. බණ්ඩාරනායක, පී. එම්. 2007. ***දේශගුණය, පස හා පරිසර පද්ධති***, ගොඩගේ ප්‍රකාශකයෝ, මරදාන, කොළඹ 10.

| | | |
|---|---|---|
| **1** | **පාඨමාලා ඒකකයේ කේතකය** | HIGE 1001 |
| **2** | **පාඨමාලා ඒකකයේ නම** | පෙරදිග ඉතිහාසයේ බලවේග |
| **3** | **ඒකක අගය** | 04 |
| **4** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| **5** | **හැඳින්වීම**<br>ආසියානු ඉතිහාසයේ ස්වභාවය තේරුම් ගැනීමට මෙන්ම ශ්‍රී ලංකාව කෙරෙහි ඇතිවූ විදේශ බලපෑම් හඳුනාගැනීමට ද මෙම විෂය දැනුම අවශ්‍ය වේ. | |
| **6** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | අවශ්‍ය නැත |
| **7** | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• ආසියානු ඉතිහාසයේ ප්‍රධාන බලවේග හඳුනාගැනීම.<br>• ආසියාවේ යුරෝපීය බල ව්‍යාප්තියේ ස්වභාවය තේරුම් ගැනීම.<br>• ශ්‍රී ලංකා ඉතිහාසය හා ඉන්දියානු ඉතිහාසය හැදෑරීමට අවශ්‍ය මූලික පසුබිම සකස් කිරීම. | |
| **8** | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• ආසියාවේ පැරණි ශිෂ්ටාචාර පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගනියි.<br>• ආසියානු ඉතිහාසයේ වැදගත් අවස්ථා තේරුම් ගනියි.<br>• ආසියාවේ යුරෝපීට බල ව්‍යාපෘතිය හා එහි ප්‍රතිඵල අවබෝධ කර ගනියි.<br>• නූතන ආසියානු ඉතිහාසය ගොඩනැගීමේ ස්වරූපය තේරුම් ගනියි. | |
| **9** | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
|---|---|---|---|
| | **1.** මිසර ශිෂ්ටාචාරය | • මූලාශ්‍රය හඳුනාගැනීම<br>• කැණීම් හා පර්යේෂණ<br>• දේශපාලන ඉතිහාසය<br>• ආගමික හා සංස්කෘතික කටයුතු<br>• සමාජ හා ආර්ථික කටයුතු | |
| | 2. මෙසපොටේමියානු ශිෂ්ටාචාරය | • මෙසපොටේමියාවේ මුල් ජනාවාස<br>• දේශපාලන ඉතිහාසය<br>• සභ්‍යත්වය | |
| | 3. චීන ශිෂ්ටාචාරය | • ශිෂ්ටාචාරයේ ආරම්භය<br>• ව්‍යාප්තිය<br>• රජ පෙළපත්<br>• සභ්‍යත්වය | |
| | 4. ඉන්දුනිම්න ශිෂ්ටාචාරය | • පුරාවිද්‍යාත්මක සොයාගැනීම්<br>• ඉන්දුනිම්න සභ්‍යත්වය<br>• නාගරික ජීවිතය<br>• ශිෂ්ටාචාරයේ පරිහානිය | |

| | | | |
|---|---|---|---|
| | 5. හින්දු සභ්‍යත්වය | • මූලාශ්‍රය විග්‍රහය<br>• භගවද් ගීතාවේ ඉගැන්වීම<br>• ආගමික තත්ත්වය<br>• හින්දු ජන ජීවිතය | |
| | 6. බුද්ධකාලීන භාරතය | • දේශපාලන තත්ත්වය<br>• ආගමික හා දාර්ශනික පසුබිම<br>• ආර්ථිකය හා ජන ජීවිතය<br>• බුදුදහමේ ව්‍යාප්තිය | |
| | 7. ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායේ ව්‍යාප්තිය හා ශ්‍රී ලංකාව | • ධර්මාශෝක රජුගේ දායකත්වය<br>• ථෙරවාදයේ ව්‍යාප්තිය<br>• ලංකාවට බුදුදහම ලැබීම<br>• ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් ලංකාවේ කාර්යභාරය | |
| | 8. මහායාන බෞද්ධ සංස්කෘතිය | • මහායානයේ ආරම්භය<br>• ව්‍යාප්තිය<br>• ලංකාව කෙරෙහි බලපෑම් | |
| | 9. ආසියාවට යුරෝපීයන්ගේ පැමිණීම | • යුරෝපීයන් පැමිණීමට තුඩුදුන් හේතු<br>• යුරෝපීය බලය ආසියාවේ ව්‍යාප්තවීම<br>• ආගම ප්‍රචාරය<br>• වෙළෙඳ ආධිපත්‍යය | |
| | 10. පෙරදිග ඕලන්ද වාණිජ ව්‍යාපාරය | • VOCසමාගම ආරම්භය හා ව්‍යාප්තිය<br>• VOCසමාගමේ දේශපාලන කටයුතු<br>• සමාගමේ ආර්ථික කටයුතු<br>• සමාගමේ පරිහානිය | |
| | 11. අග්නිදිග ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තිය | • ලන්දේසීන් ගේ පැමිණීම හා අසියාවේ යුරෝපීය බල අරගල<br>• අග්නිදිග ආසියාවේ ලන්දේසී බල ව්‍යාප්තිය<br>• බෙතාවිය ලන්දේසී මධ්‍යස්ථානය වීම<br>• සිදුවූ නව විපර්යාස<br>• ඉන්දුනීසියාව බිහිවීම | |
| | 12. ඉන්දුනීසියාවේ නිදහස් සටන් ව්‍යාපාරය | • පැවති දේශපාලන ව්‍යාකූලතාව<br>• නිදහස් සටන ආරම්භවීමේ පසුබිම හා එහි ස්වරූපය<br>• ඉස්ලාම් ආගම හා ජාතිකත්වය | |

| | | | |
|---|---|---|---|
| | | • උද්ඝෝෂණ ව්‍යාපාර හා එහි ව්‍යාප්තිය<br>• නිදහස දිනා ගැනීම | |
| | 13. බුරුම නිදහස් සටන් ව්‍යාපාරය | • බුරුමය තුළ බ්‍රිතාන්‍ය බල ව්‍යාප්තිය<br>• බුරුමයේ ඉංග්‍රීසින් විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති<br>• අපි බුරුමයෝ ව්‍යාපාරය<br>• ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා දේශපාලන උද්ඝෝෂණ<br>• බුරුමය නිදහස දිනා ගැනීම | |
| | 14. යුරෝපීයන්ට යටත්වීම නිසා ආසියාවේ ඇතිවූ වෙනස්කම් I | • ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණ<br>• දේශපාලන වෙනස්වීම්<br>• ආර්ථික වෙනස්වීම<br>• නාගරීකරණය<br>• පරිපාලනමය විපර්යාස | |
| | 15. යුරෝපීයන්ට යටත්වීම නිසා ආසියාවේ ඇතිවූ වෙනස්කම් II | • සමාජ වෙනස්කම්<br>• භාෂා හා සංස්කෘතික වෙනස්කම්<br>• ආගමික විපර්යාස | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | - දේශන පැවැත්වීම.<br>- ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා පැවැත්වීම.<br>- ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා අභ්‍යාසකරණය. | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | - නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 20%ක් හිමිවේ. නිබන්ධන, මධ්‍යවාර පරීක්ෂණය, කණ්ඩායම් හෝ කේවල ව්‍යාපෘති යන එක් ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයක් මගින් ඇගයීම සිදු කෙරේ. | |
| | **අවසාන පරීක්ෂණය** | - නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 80%ක් හිමිවේ. පැය තුනක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු වරණීය රචනා ප්‍රශ්න පත්‍රයක් ලැබේ. | |

| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** |
|---|---|


1. ඇඳගම මාලනී, 2003, **ලෝක ඉතිහාසය,** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2. ඊස්ටර්න් ස්ටුවර්ට් සී., 1967, **බටහිර අධිරාජ්‍යවාදයේ නැගීම හා වැටීම,** කොළඹ
3. කරුණානන්ද යූ.බී., 2010, සුමේරියානු ශිෂ්ටාචාරය, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10
   ග්‍රාන්ට් මයිකල්., 1973, **රෝමන්වරුන් ගේ ලෝකය,** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
4. පනික්කාර්., 2005, **ආසියාව හා බටහිර ආධිපත්‍ය,** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
5. පෙලම් එච්., 1964, **රෝම ඉතිහාස සාරය,** රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
6. පොන්නම්පෙරුම ඩී ආර්., 2002, **පැරණි මිසරය,** චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය
7. බස්නායක එච්. ටී., 2003, **අපරදිග ශිෂ්ටාචාරය I කොටස,**
8. සෝමදේවරාජ, කන්නන්ගර පද්මසිරි, විද්‍යාලංකාර අනුත්තරාදේවි 2016, ඉපැරණි ලෝක ශිෂ්ටාචාර, අධ්‍යාපන දෙපාර්තමේන්තුව
9. රොබින්සන් සිරිල් ඒ., 1965, **ග්‍රීසියේ ඉතිහාසය,** රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
10. James Henry., 1909, **A History of Egypt**, New York.
11. Mascati Sabation., 1960, **Ancient Semitic Civilization**, New York.

<table>
<tr><td>1</td><td>පාඨමාලා ඒකකයේ කේතකය</td><td colspan="2">HIGE 1002</td></tr>
<tr><td>2</td><td>පාඨමාලා ඒකකයේ නම</td><td colspan="2">අපරදිග ඉතිහාසයේ බලවේග</td></tr>
<tr><td>3</td><td>ඒකක අගය</td><td colspan="2">04</td></tr>
<tr><td>4</td><td>අධ්‍යයන වර්ෂය</td><td colspan="2">පළමුවන වසර</td></tr>
<tr><td>5</td><td colspan="3">හැඳින්වීම<br><br>මෙම විෂය ඒකකය හැදෑරීමෙන් ලෝක ඉතිහාසයේ මුල් ශිෂ්ටාචාර අවධියේ පටන් යුරෝපයේ මධ්‍යතන අවධිය හා නූතන යුගයට අවතීර්ණවීම පිළිබඳ අවබෝධයක් ලැබෙන බැවින් නූතන යුරෝපයේ ස්වාභාවය තේරුම් ගැනීමට අවශ්‍ය මූලික දැනුම ලැබේ.</td></tr>
<tr><td>6</td><td>පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා</td><td colspan="2">අවශ්‍ය නැත</td></tr>
<tr><td>7</td><td colspan="3">පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු<br>• යුරෝපීය ඉතිහාසයේ ප්‍රධාන බලවේග හඳුනා ගැනීම<br>• යුරෝපීය බල ව්‍යාප්තියේ ස්වභාවය තේරුම් ගැනීම<br>• යුරෝපා ඉතිහාසය හැදෑරීමට අවශ්‍ය මූලික පසුබිම සකස් කිරීම</td></tr>
<tr><td>8</td><td colspan="3">පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්,<br>• යුරෝපීය ප්‍රධාන ශිෂ්ටාචාර පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගනියි.<br>• යුරෝපා ඉතිහාසයේ වැදගත් අවස්ථා තේරුම් ගනියි.<br>• නූතන යුරෝපා ඉතිහාසය ගොඩනැගීමේ ස්වරූපය අවබෝධ කර ගනියි.</td></tr>
<tr><td>9</td><td colspan="3">පාඨමාලා ඒකකයේ අන්තර්ගතය</td></tr>
</table>

| ප්‍රධාන මාතෘකා | සෙසු මාතෘකා | |
|---|---|---|
| 1. යුරෝපයේ ශිෂ්ටාචාරයේ පදනම I (ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර) | • ග්‍රීක ශිෂ්ටාචාරය<br>- ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය හා එහි ව්‍යාප්තිය<br>- අපරදිග ශිෂ්ටාචාරය හැඩගැසීමට ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලද දායාද<br>- ග්‍රීක දේශපාලන ක්‍රමය<br>- විද්‍යාත්මක දියුණුව<br>- කලාව<br>- ආගම<br>- දර්ශනය<br>- ගෘහනිර්මාණ ශිල්පය<br>• රෝම ශිෂ්ටාචාරය හා සභ්‍යත්වය<br>- රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය හා එහි ව්‍යාප්තිය<br>- අපරදිග ශිෂ්ටාචාරය හැඩගැසීමට රෝම ශිෂ්ටාචාරයෙන් ලද දායාද | |

| | | | |
|---|---|---|---|
| | | - රෝම පෞරව රාජ්‍ය හා සමූහාණ්ඩු පාලනය<br>- අධිරාජ්‍යය ගොඩනැංවීම හා පාලනය<br>- රෝම නීතිය<br>- රෝම ගෘහනිර්මාණ ශිල්ප කලාව | |
| | 2. යුරෝපයේ ශිෂ්ටාචාරයේ පදනම II (ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගමික බලපෑම්) | • ක්‍රිස්තු ශිෂ්ටාචාරයේ ආරම්භය හා එහි ව්‍යාප්තිය<br>• අපරදිග ශිෂ්ටාචාරය හැඩගැසීමට ක්‍රිස්තු ශිෂ්ටාචාරයෙන් ලද දායාද<br>- ක්‍රිස්තියානි ධර්මයේ ප්‍රභවය<br>- රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත්වීම<br>• අපරදිග ශිෂ්ටාචාරය හැඩගැසීමට ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලද දායාද<br>• ඉස්ලාම් ශිෂ්ටාචාරය<br>- ඉස්ලාම් ශිෂ්ටාචාරයේ ආරම්භය හා ව්‍යාප්තිය<br>- ඉස්ලාම් ධර්මයේ ව්‍යාප්තිය<br>- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය හා ඉස්ලාම් ශිෂ්ටාචාරය අතර පැවති ගැටුම්<br>- කුරුස යුද්ධ අවස්ථා හා එහි ප්‍රතිඵල | |
| | 3. මධ්‍යකාලීන යුරෝපයේ පැවති වැඩවසම් ක්‍රමය | • වැඩවසම් ක්‍රමය හා අපරදිග ශිෂ්ටාචාර අතර ඇති සම්බන්ධතාව<br>• වැඩවසම් ක්‍රමය බිහිවීම<br>- වැඩවසම් ක්‍රමයේ මූලික ලක්ෂණ<br>• වැඩවසම් ක්‍රමයේ ව්‍යාප්තිය | |
| | 4. යුරෝපයේ නවෝදය හා එහි ප්‍රතිඵල | • යුරෝපයේ සිදුවු නවෝදයේ ස්වරූපය<br>• එයට තුඩුදුන් හේතු<br>- ආර්ථික<br>- දේශපාලන<br>- ආගමික<br>• පුනරුදය යුරෝපය පුරා ව්‍යාප්තවීම<br>• විවිධ ක්ෂේත්‍රවල ඇති වූ නවෝදය<br>• කලාව<br>• විද්‍යාව<br>• තාක්ෂණය<br>• දර්ශනවාද | |

| | | | |
|---|---|---|---|
| | 5. දේශ ගවේෂණ ව්‍යාපාරය | • ගවේෂණ සඳහා මූලිකත්වය ගත් රටවල්<br>• නව රටවල් සොයා ගැනීම<br>• දේශ ගවේෂණ ව්‍යාපාරයේ ප්‍රතිඵල | |
| | 6. ජාතික රාජ්‍ය බිහිවීම | • ජාතික රාජ්‍ය සංකල්පය හා එහි මූලික ලක්ෂණ<br>• බලය සංකේන්ද්‍රගතවීම<br>• ඒකීය නීති පද්ධතිය<br>• ස්ථිර යුද හමුදාව<br>• ජාතික රාජ්‍ය සංකල්පය යුරෝපයේ ක්‍රියාත්මක වූ ආකාරය<br>• යුරෝපයේ ප්‍රධාන ජාතික රාජ්‍ය | |
| | 7. ආගමික විප්ලවය | • ආගමික විප්ලවය හැඳින්වීම<br>• ආගමික විප්ලවයට තුඩුදුන් හේතු සාධක<br>• මාටින් ලූතර් ගේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය<br>• යුරෝපය පුරා ව්‍යාප්ත වූ නව ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාර<br>• ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රතිඵල | |
| | 8. තිස් අවුරුදු යුද්ධය | • 1618 බොහිමියාවේ කැරැල්ල<br>• යුද්ධයේ පළමු දස වසර තුළ හැස්බර්ග් වාසින් ජය ගැනීම හා කතෝලිකයන්ගේ යුද්ධ ජයග්‍රහණ<br>• තිස් අවුරුදු යුද්ධයේ දෙවැනි අදියර (1621-1630)<br>• ශුද්ධ රෝම අධිරාජ්‍යයේ ප්‍රාදේශීය රජවරුන් හැස්බර්ග් පාලකයන් හා පැවති අරගල<br>• තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල<br>• 1648 වෙස්ට්පේලියා ගිවිසුම | |
| | 9. එංගලන්ත පාර්ලිමේන්තු ක්‍රමය | • පාර්ලිමේන්තු ක්‍රමයේ ආරම්භය<br>• රජුගේ බලය සීමා කිරීමේ ප්‍රයත්න<br>• පක්ෂ ක්‍රමය හා කැබිනට් ක්‍රමය | |
| | 10. යුරෝපා අධිරාජ්‍යවාදය | • අධිරාජ්‍යවාදී සංකල්පය<br>• යුරෝපයෙන් බාහිර අධිරාජ්‍යවාදය පිහිටුවීම<br>• අධිරාජ්‍යවාදයේ ස්වරූපය<br>• පෘතුගාලය, ස්පාඤ්ඤය හා ඕලන්දයේ අධිරාජ්‍ය කටයුතු | |

| | | | |
|---|---|---|---|
| | 11. කාර්මික විප්ලවය | • කාර්මික විප්ලවය හැඳින්වීම<br>• කාර්මික විප්ලවය සඳහා තුඩුදුන් හේතු<br>• නව සොයාගැනීම්<br>• යුරෝපය පුරා ව්‍යාප්තවීම<br>• කාර්මික විප්ලවයේ ප්‍රතිඵල | |
| | 12. ධනවාදී ආර්ථික ක්‍රමයේ ආරම්භය, වර්ධනය හා ව්‍යාප්තිය | • වෙළදාම දියුණුවීම<br>• වෙළඳ පන්ති බිහිවීම<br>• මධ්‍යම පන්තියේ වර්ධනය<br>• ධනවාදී ආර්ථික ක්‍රමයේ ආරම්භය හා ස්වරූපය<br>• ධනවාදී ආර්ථික ක්‍රමයේ ව්‍යාප්තිය | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | - දේශන පැවැත්වීම.<br>- ශිෂ්‍යයන් සමග සාකච්ජා පැවැත්වීම.<br>- ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා අභ්‍යාසකරණය. | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 20%ක් හිමිවේ. නිබන්ධන, මධ්‍යවාර පරීක්ෂණය, කණ්ඩායම් හෝ ක්ෂේත්‍ර ව්‍යාපෘති යන එක් ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයක් මගින් ඇගයීම සිදු කෙරේ. | |
| | **අවසාන පරීක්ෂණය** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 80%ක් හිමිවේ. පැය තුනක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු වරණීය රචනා ප්‍රශ්න පත්‍රයක් ලැබේ. | |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. ඇඳගම මාලිනී., 2003, **ලෝක ඉතිහාසය**, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව
2. කොරොච්කින් පියෝදර්. 2016, **මිනිස් ඉතිහාසයේ කතාන්දරය** සුගත් කංකානම්ගේ (පරිවර්තන), සුභාවි ප්‍රකාශන, කෝරලඉම, ගෝනපල.
3. ගුරුගේ, ආනන්ද., 1962, **පුරාණ සංස්කෘතිය**, කොළඹ
4. පෙලම්, එච්.ඒ., 1964, **රෝම ඉතිහාස සාරය**, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
5. බස්නායක එච්.ටී., 2003, **අපරදිග ඉතිහාසය I**, කොළඹ
6. රොබින්සන්, සිරිල් ඊ., **ග්‍රීසියේ ඉතිහාසය**
7. සෝමදේවරාජ, කන්නන්ගර පත්මසිරි, විදනලංකාර අනුත්තරාදේවි, 2016, **ඉපැරණි ලෝක ශිෂ්ටාචාරය**, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
8. Burns Edward M, Ralp Philip Lee, 1955, **World Civilization** Vol I, New York
9. Bury J.B., 1920, **History of Greece**, London
10. Edward I.E.S., Gadd C.J., **Cambridge Ancient History Vol.I**

| | | |
|---|---|---|
| **1** | **පාඨමාලා ඒකකයේ කේතකය** | IRGE 1001 |
| **2** | **පාඨමාලා ඒකකයේ නම** | ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ හැඳින්වීමක් |
| **3** | **ඒකක අගය** | 04 |
| **4** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| **5** | **හැඳින්වීම**<br>ජාත්‍යන්තර සම්බන්ධතා විෂයෙහි ගතික ස්වභාවය නොවැළැක්විය හැක්කකි. එසේම ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ න්‍යායික හා සංකල්පීය දැනුමක් නොමැතිව එය පුළුල් ආකාරයෙන් වටහා ගත නොහැක. | |
| **6** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| **7** | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු :**<br>මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වන්නේ ජාත්‍යන්තර ක්‍රමය, එහි ක්‍රියාකරුවන් සහ එයට අදාළ ප්‍රධාන න්‍යායික හා සංකල්පීය ප්‍රවේශයන් පිළිබඳ පුළුල් දැනුම් සම්භාරයක් උපාධි අපේක්ෂකයන්ට ලබා දීමයි. | |
| **8** | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය :**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ න්‍යායික හා සංකල්පීය දැනුමක් ලබාගත හැකි වීම.<br>• ලෝක දේශපාලනය තුළ අන්තර් රාජ්‍ය හා රාජ්‍ය අභ්‍යන්තර සම්බන්ධතාවල ගතික ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වීම.<br>• ජාත්‍යන්තර ක්‍රමය එහි විවිධ ස්වරූපයන් සහ ප්‍රධාන ක්‍රියාකරුවා වන ජාතික රාජ්‍යයේ කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. | |
| **9** | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
|---|---|---|
| 1. හැඳින්වීම | • ජාත්‍යන්තර සම්බන්ධතා විෂයේ න්‍යායික හා සංකල්පීය විකාශනය<br>• ජාත්‍යන්තර ක්‍රමය අර්ථ දැක්වීම<br>• ජාත්‍යන්තර ක්‍රමයේ ප්‍රධාන ක්‍රියාකරුවන් හඳුනා ගැනීම | |
| 2. ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ න්‍යායික ප්‍රවේශයන් | • යථාර්ථවාදී ප්‍රවේශය<br>• විඥානවාදී ප්‍රවේශය | |
| 3. ජාතික රාජ්‍ය පිළිබඳ හැඳින්වීමක් | • රාජ්‍යයේ විකාශන ක්‍රියාවලිය<br>• ජාතිකවාදය සහ ජාතික රාජ්‍ය බිහිවීම | |
| 4. ජාතික අභිලාෂයන් | • ජාතික අභිලාෂයන් සපුරාගැනීමේ උපාංග<br>• ජාතික අභිලාෂයන් සහ විදේශ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය | |
| 5. යුද්ධය පිළිබඳ හැඳින්වීමක් | • යුද්ධ වර්ග කිරීම<br>• යුද්ධවලට බලපාන හේතු<br>• නූතන යුද්ධය | |

| | | | |
|---|---|---|---|
| | 6. ජාතික බලය පිළිබඳ හැඳින්වීමක් | • ජාතික බලය අර්ථ දැක්වීම<br>• ජාතික බලයේ මූලිකාංග<br>• ජාතික බලය මැනීම | |
| | 7. බල තුලනය පිළිබඳ හැඳින්වීමක් | • බල තුලනය අර්ථ කථනය<br>• බල තුලන මට්ටම් | |
| | 8. රාජ්‍යෝපාය පිළිබඳ හැඳින්වීමක් | • රාජ්‍යෝපායෙහි ආරම්භය සහ විකාශනය<br>• රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ රාජ්‍ය දූත සේවාව<br>• රාජ්‍යෝපායෙහි කෘත්‍යයන්<br>• නූතන රාජ්‍යෝපායේ මූලිකාංග | |
| | 9. අවිපාලනය සහ නිරායුධකරණය පිළිබඳ හැඳින්වීමක් | • අවිපාලනය සහ නිරායුධකරණය අර්ථ දැක්වීම<br>• අවිපාලනය සහ නිරායුධකරණය පිළිබඳ ක්‍රමෝපායන් (SLATI, II, NPT, PTBT, CTBT වැනි ගිවිසුම්)<br>• අවිපාලනය සහ නිරායුධකරණයේ ප්‍රතිඵල | |
| | 10. මැදිහත්වීම පිළිබඳ හැඳින්වීමක් | • මැදිහත්වීම අර්ථ දැක්වීම<br>• මැදිහත්වීම සහ එක්සත් ජාතීන්ගේ අධිකාරී පත්‍රය | |
| **10** | **පාඨමාලාව පවත්වා ගෙන යන ආකාරය** | දේශන පැවැත්වීම | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | පැවරුම ලකුණු (20) | |
| | **අවසාන පරීක්ෂණය** | වසර අවසානයේ පරීක්ෂණයට පෙනී සිටීම ලකුණු (80) | |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ:** | | |


1. Daniels, P. 1988, ***Contemporary International Relations***, Macmillan, New York.
2. Morgenthau, H. 1985, ***Politics among nation: Struggle for the power. and peace,*** New York. Mecgrw Hill
3. Rourke, J.& Mark, B. 2001, ***Internartionl Polities, on the world Stage***, New York: Mc Grow Hill.
4. Stows, Ernest 1957, ***A Guide to Diplomatic practice***, Longsnansgreen, London.
5. Vandana, A. 1998, ***Theory of International Politics***, Vikas Publishing House Ltd, New Delhi. Visakas Publishing House Ltd.

<table>
<tr><td>1</td><td>පාඨමාලා ඒකකයේ කේතකයඃ</td><td>IRGE 1002</td></tr>
<tr><td>2</td><td>පාඨමාලා ඒකකයේ නමඃ</td><td>ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන</td></tr>
<tr><td>3</td><td>ඒකක අගයඃ</td><td>04</td></tr>
<tr><td>4</td><td>අධ්‍යයන වර්ෂයඃ</td><td>පළමුවන වසර</td></tr>
<tr><td>5</td><td colspan="2">හැඳින්වීම<br><br>ලෝක දේශපාලනයේ තත්කාලීන ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ කලාපීය ඒකාග්‍රතාව යනු ප්‍රධාන සංකල්පීය ප්‍රවණතාවකි. ගෝලීය ක්‍රමය මේ වන විට විවිධ අරමුණු ඔස්සේ ධ්‍රැවීකරණයට ලක් වී ඇත. ජාත්‍යන්තර පද්ධතිය තුළ එහි ක්‍රියාකරුවන් අතර කලාපීය ඒකාග්‍රතාව ඇතිවීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන සාධකයක් වන්නේ දේශපාලන අභිලාෂය යි. එහෙත් වෙනස් වන දේශපාලන ආර්ථික ක්‍රියාවලීන් තුළ සෑම රටකටම තම ස්වායත්ත ඊඳියාව රඳා පවත්වා ගැනීමට නොහැකි වීම අයහපත් ප්‍රවණතාවක් හැටියට බලපා ඇත. මෙහි ප්‍රතිවිපාක හැටියට ලෝක දේශපාලනය තුළ කලාපීය ඒකාග්‍රතාව කේන්ද්‍රගතව ඇත. ඒ අනුව ගෝලීයකරණ ක්‍රියාදාමය තුළ විවිධ කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන ඔවුන්ටම ආවේණික වූ සමාජ, ආර්ථික, දේශපාලන හා ආරක්ෂක අභිලාෂයන් ඉටු කර ගැනීම උදෙසා ගතික ස්වභාවයෙන් යුක්තව සංවිධානය වී තිබේ. මේ නිසා රාජ්‍යයන් තම අරමුණු ළගා කර ගැනීමේලා කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන ඔස්සේ වඩාත් බලවත්ව හා ගතික ස්වභාවයෙන් යුක්තව කටයුතු කරන ස්වභාවයක් දක්නට ලැබේ.</td></tr>
<tr><td>6</td><td>පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා</td><td>නොමැත</td></tr>
<tr><td>7</td><td colspan="2">පාඨමාලාවේ අරමුණුඃ<br><br>මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වන්නේ ,<br>• විවිධ අරමුණු මත පිහිටා ඇති ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන පිළිබඳ පුළුල් දැනුම් සම්භාරයක් ලබා දීම<br>• ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන ව්‍යවහාරය තුළ රාජ්‍යයන් අතර සම්බන්ධතා සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරවරුන් අතර සම්බන්ධතා පිළිබඳ දැනුමක් ලබා දීම<br>• ගෝලීකරණ ක්‍රියාවලිය තුළ ජාත්‍යන්තර හා සංවිධාන පිළිබඳවත් ඒවායේ නව ප්‍රවණතා පිළිබඳ දැනුමක් ලබා දීම</td></tr>
<tr><td>8</td><td colspan="2">පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය ඃ<br><br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• කලාපීයවාදය පිළිබඳ සංකල්පීය අර්ථයක් ගැන අවබෝධයක් ලබාගනී.<br>• ජාත්‍යන්තර පද්ධතිය තුළ රාජ්‍යයන් සහ රාජ්‍ය නොවන ක්‍රියාකරුවන් අතර පවත්නා කාර්යභාරයන් පිළිබඳ අවබෝධයක් ලබාගනී.<br>• ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ ජාත්‍යන්තර සහ කලාපීය සංවිධානයන්හි ඇතිවන නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයක් ලබාගනී.</td></tr>
</table>

| 9 | පාඨමාලා ඒකකයේ අන්තර්ගතය | | |
|---|---|---|---|
| | ප්‍රධාන මාතෘකා | සෙසු මාතෘකා | |
| | 1. ජාත්‍යන්තරවාදය සහ කලාපීයවාදය | • ජාත්‍යන්තර සංවිධාන යනු කුමක්ද<br>• කලාපීය සංවිධාන යනු කුමක්ද<br>• ගෝලීයකරණය සහ කලාපීයකරණය යනු කුමක්ද | |
| | 2. එක්සත් ජාතීන්ගේ සංවිධානය | • ආරම්භය සහ විකාශය<br>• ආයතනික ව්‍යුහය<br>• අරමුණු හා ක්‍රියාමාර්ග | |
| | 3. යුරෝපා සංගමය | • ආරම්භය සහ විකාශය<br>• ප්‍රධාන අරමුණු<br>• යුරෝපා සංගමය ලෝක අභිලාෂයන් කෙරෙහි සිදුකරන බලපෑම | |
| | 4. උතුරු අත්ලන්තික් ගිවිසුම් සංවිධානය (නේටෝ) | • ආරම්භය සහ විකාශය<br>• අරමුණු<br>• නූතන ප්‍රවණතා | |
| | 5. ආසියාන් සංවිධාන | • ආරම්භය සහ විකාශය<br>• අරමුණු<br>• නූතන ප්‍රවණතා | |
| | 6. ඔපෙක් සංවිධානය | • ආරම්භය සහ විකාශය<br>• අරමුණු<br>• ලෝක ආර්ථිකයට සිදුකරන බලපෑම | |
| | 7. සාර්ක් සංවිධාන | • ආරම්භය සහ විකාශය<br>• අරමුණු හා කාර්යයන්<br>• සාර්ක් සංවිධානය සහ අන්තර් ජාතික සම්බන්ධතා<br>• සංවිධානය හමුවේ ඇති අභියෝගයන් | |
| | 8. පොදු රාජ්‍ය මණ්ඩලය | • ආරම්භය සහ විකාශය<br>• අරමුණු සහ කාර්යයන් | |
| | 9. නොබැඳි ව්‍යාපාරය | • ආරම්භය සහ විකාශය<br>• අරමුණු<br>• නූතන ප්‍රවණතා | |
| | 10.G 7 කණ්ඩායම | • ආරම්භය සහ විකාශය<br>• අරමුණු<br>• ලෝක අභිලාෂයන්ට කරන බලපෑම | |

| | | | |
|---|---|---|---|
| | 11. G 20 කණ්ඩායම | • ආරම්භය සහ විකාශය<br>• අරමුණු<br>• ලෝක ප්‍රවණතා | |
| **10** | **පාඨමාලාව පවත්වා ගෙනයන ආකාරය** | දේශන පැවැත්වීම | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | පැවරුම් ලකුණු (20) | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු (80)<br>වසර අවසානයේ පරීක්ෂණයට පෙනී සිටීම | |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ:** | | |


1. Falk and Mendlovitz, 1973, ***Regional Politics and World Order***, San Fancisco: W.H. Freeman and Company.
2. Barrow, 2nd edition 1972, ***The United Nations – Past, Present and Future***.
3. Robert W., 1969, ***International Organizations: World Politics***, Macmillan, London.
4. Le Roy, B, 1995, ***International Organizations: Principles***, Prentice Hall, Newyork.
5. Robert A, (Ed). 1995, ***United Nations***, Divided World, Pager.
6. කරුණාදාස, ඩබ්. එම්., 1998, ***සාක් - සප්තා, සප්ටා***, ඉමේජ් ලංකා දෙහිවල.

<table>
<tr><td>1</td><td>පාඨමාලා ඒකකයේ කේතකය</td><td>PHGE 1001</td></tr>
<tr><td>2</td><td>පාඨමාලා ඒකකයේ නම</td><td>තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය</td></tr>
<tr><td>3</td><td>ඒකක අගය</td><td>04</td></tr>
<tr><td>4</td><td>අධ්‍යයන වර්ෂය</td><td>පළමුවන වසර</td></tr>
<tr><td>5</td><td colspan="2">හැඳින්වීම<br>පෙර අපර දෙදිග දර්ශනවාදයන්හී වැදගත් විෂය ධාරාවක් ලෙස තර්ක ශාස්ත්‍රය හැඳින්විය හැකිය. මෙම විෂය හැදෑරීම මගින් නිවැරදි වූත් ක්‍රමානුකූල වූත් හා තාර්කික විනිශ්චයන්ට අවතීර්ණ වීමේ පරිචය උදාකරගත හැකිය.</td></tr>
<tr><td>6</td><td>පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා</td><td>නැත</td></tr>
<tr><td>7</td><td colspan="2">පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු<br>• තර්ක ශාස්ත්‍රයේ ඉතිහාසයේ සිට ඇරිස්ටෝටල්ගේ සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රය හා නවීන තර්ක ශාස්ත්‍රය පිළිබඳ අවබෝධය<br>• විද්‍යාව හා එහි විවිධ ප්‍රභේද පිළිබඳ අවබෝධය<br>• විද්‍යාවේ විධික්‍රමවල ස්වභාවය හඳුනා ගැනීම<br>• විද්‍යාව හා සමාජ ගැටළු අතර සම්බන්ධය ගැටලු හඳුනා ගැනීම</td></tr>
<tr><td>8</td><td colspan="2">පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්,<br>• තර්කය, බුද්ධිය භාවිතයෙන් ගැටලු දෙස තාර්කිකව බැලීම මෙන් ම ගැටලු විසඳා ගැනීමට හැකිවෙයි.<br>• තාර්කික චින්තනය දියුණු වෙයි.<br>• ගැටළු ප්‍රායෝගිකව විසඳා ගැනීමට අවශ්‍ය චින්තන ශක්තිය වර්ධනය කරයි.<br>• ශිෂ්‍යයා විද්‍යාත්මක ක්‍රමය හා එහි මූලික න්‍යායයන් පිළිබඳ වටහා ගනියි.</td></tr>
<tr><td rowspan="4">9</td><td colspan="3">පාඨමාලා ඒකකයේ අන්තර්ගතය</td></tr>
<tr><td>ප්‍රධාන මාතෘකාව</td><td>සෙසු මාතෘකා</td><td></td></tr>
<tr><td>1. තර්ක ශාස්ත්‍රය හැඳින්වීම හා ඉතිහාසය</td><td>• නිර්වචනය ආශ්‍රයෙන් තර්ක ශාස්ත්‍රය හැඳින්වීම<br>• ගුරුකුල ඔස්සේ තර්ක ශාස්ත්‍රය වර්ධනය වූ ආකාරය</td><td></td></tr>
<tr><td>2. තර්ක ශාස්ත්‍රයේ ස්වභාවය හා මූලික සංකල්ප</td><td>• නවීන තර්ක ශාස්ත්‍රය බිහිවීම සඳහා බලපානු ලැබූ හේතු<br>• පද හා ප්‍රස්තුත<br>• ඇරිස්ටෝටල්ගේ ප්‍රස්තුත වර්ගීකරණය හා නූතන ප්‍රස්තුත වර්ගීකරණය</td><td></td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | 3. අනුමානය (අව්‍යහිත අනුමානය හා ව්‍යවහිත අනුමානය) | • අනුමානය හැඳින්වීම<br>• ප්‍රස්තුත ප්‍රතියෝගය<br>• ප්‍රස්තුත ප්‍රතියෝගයේ ගැටලු | |
| | 4. සංවාක්‍ය | • සංවාක්‍ය හැඳින්වීම, ලක්ෂණ, වර්ග<br>• සංවාක්‍ය රීති<br>• රීති ඇසුරෙන් සප්‍රමාණතාව සෙවීම | |
| | 5. නවීන සංකේත තර්ක ශාස්ත්‍රයේ මූලික සංකේත | • තාර්කික විචල්‍ය<br>• නියති පද<br>• වරහන් භාවිතය | |
| | 6. සත්‍ය චක්‍ර හැඳින්වීම | • ඍජු සත්‍ය චක්‍ර ක්‍රමයට අනුව සප්‍රමාණතාවය සෙවීම | |
| | 7. වක්‍ර සත්‍ය ක්‍රමය | • සප්‍රමාණතාවය සෙවීම | |
| | 8. ව්‍යුත්පන්න | • අනුමිති රීති<br>• ව්‍යුත්පන්න ක්‍රම | |
| | 9. සත්‍යතා රුක් ක්‍රමය | • හැඳින්වීම සහ භාවිතය | |
| | 10. තර්ක ද්වාර | • හැඳින්වීම<br>• තර්ක ද්වාර සංයෝජනය | |
| | 11. ආඛ්‍යාත කලනය | • ප්‍රමාණීකෘත්‍ය තර්ක | |
| | 12. විද්‍යාත්මක ක්‍රමය හැඳින්වීම හා ඉතිහාසය | • විද්‍යාව යනු කුමක්ද ?<br>• විද්‍යාත්මක ක්‍රමය යනු කුමක්ද?<br>• ග්‍රීක හා ඊට පෙර<br>• නවීන විද්‍යාව | |
| | 13. විද්‍යාවේ ප්‍රභේද | • ශුද්ධ විද්‍යාව<br>• ව්‍යවහාරික විද්‍යාව<br>• ස්වාභාවික විද්‍යාව<br>• සමාජයීය විද්‍යා | |
| | 14. විද්‍යාවේ විවිධ ගුරුකුල | • උද්ගමනවාදය<br>• නිගාමීවාද<br>• සත්‍යොක්ෂණය<br>• අසත්‍යකරණවාදය<br>• සාපේක්ෂකවාදය | |

| | | | |
|---|---|---|---|
| | 15. විද්‍යාවේ පරීක්ෂණ ක්‍රම | • නිරීක්ෂණය<br>• සම්පරීක්ෂණය | |
| | 16. විද්‍යාත්මක උපන්‍යාස | • හැඳින්වීම<br>• උපන්‍යාසවල ලක්ෂණ | |
| | 17. සාමාජීය විද්‍යාවන්හි විධික්‍රම | • ප්‍රශ්නමාලා ක්‍රමය<br>• සම්මුඛ සාකච්ඡා<br>• ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය<br>• සහභාගී නිරීක්ෂණ | |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 20%ක් හිමිවේ. නිබන්ධන, මධ්‍යවාර පරීක්ෂණය, කණ්ඩායම් හෝ කේවල ව්‍යාපෘති යන එක් ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයක් මගින් ඇගයීම සිදු කෙරේ. | |
| | **අවසාන පරීක්ෂණය** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 80%ක් හිමිවේ. පැය තුනක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු වරණීය රචනා ප්‍රශ්න පත්‍රයක් ලැබේ. | |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. එදිරිසිංහ, දයා., 2007 පෙරේරා ඥානදාස - **විද්‍යාත්මක ක්‍රම විග්‍රහය**
2. එදිරිසිංහ, දයා., 2009 පෙරේරා ඥානදාස - **මූලික තාර්කික මූලධර්ම**
3. අතුකෝරළ , දයා රෝහණ හා තවත් අය - 2009 **සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රය**
4. එදිරිසිංහ දයා., **විද්‍යාත්මක ඥානය.**, 1985 ලස්සන මුද්‍රණ ශිල්පියෝ. 1985
5. ගුණරත්න.ආර්.ඩී., **විද්‍යාත්මක ක්‍රමය**, 2005, එන්.එන් ප්‍රින්ටර්ස්. මහනුවර.
6. ගුණරත්න.ආර්.ඩී. සහ එස්. වී. කාසිනාදන්., 1997, **තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය**, අධ්‍යාපන ප්‍රකාශනදෙපාර්තමේන්තුව.
7. බෙක්.ස්ටැන්ලි., **විද්‍යාවේ සරල බව**, 1979, මාර්ග ප්‍රකාශකයෝ.
8. Copi, Irvingm, 1982, **Introduction to Logic**.
9. Kuhn, Thomas., 1996, **The Structure of Scientific Revolutions**.
10. Losee, John, A 1980, **Historical Introduction to the Philosophy of Science**.
11. Ackermann, R.J. 1982, **Modern Deductive Logic.**

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | PHGE 1002 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | දාර්ශනික ගැටලු |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 5 | **හැඳින්වීම**<br><br>මිනිස් පැවැත්මේ මූලික මට්ටම් පිළිබඳ අවබෝධ කරගැනීමට උත්සාහ කරන විවේචනාත්මක හා ක්‍රමානුකූල අභ්‍යාසය දර්ශනය ලෙසින් හැඳින්විය හැකිය. දර්ශනය හැඳින්වීම සහ මූලික දාර්ශනික ගැටලුවල ස්වභාවය පිළිබඳ විමසා බැලීම මෙහිදී සිදු වේ. | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| 7 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• දාර්ශනික ප්‍රශ්නවල ස්වභාවය හඳුනාගැනීම.<br>• ජීවන ප්‍රශ්න නිරාකරණයේදී නිරවුල් ව ක්‍රියා කිරීමට ඉගෙනීම.<br>• ගැටලුවලදී ඒ පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණයෙන් බැලීමට පුහුණු වීම. | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• දාර්ශනික ගැටලුවල ස්වභාවය දැන ගනියි.<br>• ගැටලු විසඳීමේ දී විවිධාකාර ක්‍රමෝපායයන් භාවිතයට හුරුවෙයි.<br>• වඩාත් නිවැරදි චින්තනයට යොමු වෙයි. | |
| 9 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| | ප්‍රධාන මාතෘකාව | සෙසු මාතෘකා | |
|---|---|---|---|
| 1 | දර්ශනය හැඳින්වීම | • හැඳින්වීම<br>• නිර්වචනය තිරීම<br>• විෂය ක්ෂේත්‍ර | |
| 2 | දර්ශනයේ ආරම්භය හා විකාශනය | • පෙරදිග දර්ශනය<br>• අපරදිග දර්ශනය | |
| 3 | ආචාර විද්‍යාත්මක හා සමාජ දාර්ශනික ගැටලු | • හැඳින්වීම<br>• හොඳ පිළිබඳ දාර්ශනික සංකල්ප<br>• යුක්තිය | |
| 4 | ස්වච්ඡන්දතාවය හා නියතිවාදය | • හඳින්වීඹ<br>• ස්වච්ඡන්දතාව<br>• නියතිවාදයන්හී ස්වභාවය | |
| 5 | අපරාධ සහ දඬුවම් | • අපරාධ හැඳින්වීඹ<br>• දඬුවම් පිළිබඳ දාර්ශනික මත | |

| | | | |
|---|---|---|---|
| 6 | පාරභෞතිකවාදී ගැටලු | • ආත්මය<br>• මෝක්ෂය<br>• පුනරුත්පත්තිය<br>• දෙවියන් වහන්සේ | |
| 7 | බාහිර ලෝකයේ පැවැත්ම | • හැඳින්වීම<br>• සත්වාදය<br>• ප්‍රත්‍යක්ෂ සාපේක්ෂතාවාදය<br>• විඥානවාදය<br>• ප්‍රපංචවාදය | |
| 8 | විශ්වයේ ප්‍රභවය | • මහා පිපිරවීම් වාදය<br>• ස්ථාවර තත්ත්වවාදය<br>• ස්පන්දමාන විශ්වවාදය | |
| 9 | ඥානවිභාගවාදී ගැටලු | • හැඳින්වීම<br>• බුද්ධිවාදය<br>• අනුභූතිවාදය ඇතුළු අනෙකුත් වාද | |
| 10 | ඥානය සහ විශ්වාසය | • හැඳින්වීම<br>• ඥානය හා විශ්වාසය | |
| 11 | කාය චිත්ත ගැටලුව පිළිබඳ දාර්ශනික මතවාද | • කාය චිත්ත අන්වර්තිවාදය<br>• අන්වාභාසවාදය<br>• චර්යාවාදය<br>• අනන්‍යතාවාදය<br>• අන්‍යෝන්‍යකාරකවාදය | |
| 12 | සෞන්දර්ය විද්‍යාව පිළිබඳ ගැටලු | • කලාව යනු කුමක්ද?<br>• සාහිත්‍ය විචාරය පිළිබඳ දාර්ශනික ගැටලු | |
| **10** | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා මඟින් | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 20%ක් හිමිවේ. නිබන්ධන, මධ්‍යවාර පරීක්ෂණය, කණ්ඩායම් හෝ කේවල ව්‍යාපෘති යන එක් ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයක් මගින් ඇගයීම සිදු කෙරේ. | |
| | **අවසාන පරීක්ෂණය** | නියමිත සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 80%ක් හිමිවේ. පැය තුනක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු වරණීය රචනා ප්‍රශ්න පත්‍රයක් ලැබේ. | |

<table>
<tr>
<td>12</td>
<td>

**නිර්දේශිත ග්‍රන්ථ**


1. Arthur, C, Danto, 1968, ***What Philosophy is? A Guide to the Elements*** , a pelican Books.
2. Popkin, R, 1969, ***Philosophy Made Simple***, W. H Allen Ltd.
3. Stephan, K, 1971, ***Fundamental Questions of Philosophy***, Penguin Books.
4. ධර්මසිරි, ගුණපාල, ***දාර්ශනික ප්‍රශ්න***, 1998, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
5. එදිරිංහ දයා, පෙරේරා., ඥානදාස, 2000, ***දාර්ශනික විමර්ශන***, වත්මා ප්‍රකාශනයෝ, දෙහිවල.
6. විදානගමගේ, කුලසේන., 2001, ***දාර්ශනික ගැටලු,*** කැළණිය විශ්වවිද්‍යාලය.
7. කලංසූරිය, ඒ, ඩී, පී., 2002, ***දර්ශනය හැඳින්වීමක්*** , ආරිය ප්‍රකාශකයෝ.
8. යාපාරත්න,ඩබ්.එම්., 2008, ***ආගම් හා දර්ශන තුලනය***, දහම් සරසවිය.
9. යාපාරත්න, ඩබ්.එම්., 2015, ***පරාරෝපණය***, මාගධී ප්‍රකාශන.


</td>
</tr>
</table>

<table>
<tr><td>1</td><td>පාඨමාලා ඒකකයේ කේතකය</td><td colspan="2">POGE 1001</td></tr>
<tr><td>2</td><td>පාඨමාලා ඒකකයේ නම</td><td colspan="2">දේශපාලන විද්‍යාවේ මූලිකාංග</td></tr>
<tr><td>3</td><td>ඒකක අගය</td><td colspan="2">04</td></tr>
<tr><td>4</td><td>අධ්‍යයන වර්ෂය</td><td colspan="2">පළමුවන වසර</td></tr>
<tr><td>5</td><td colspan="3">හැඳින්වීම<br>දේශපාලන විද්‍යාවේ මූලිකාංග යනු දේශපාලන විද්‍යාවේ පදනම් පාඨමාලාව වේ. මෙමගින් ශිෂ්‍යයන්ට දේශපාලන විද්‍යාවේ මූලික සංකල්ප හා ප්‍රවේශයන් හඳුනාගත හැකිය.</td></tr>
<tr><td>6</td><td>පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා</td><td colspan="2">නොමැත</td></tr>
<tr><td>7</td><td colspan="3">පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණුඃ<br>මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වන්නේ රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීමයි.</td></tr>
<tr><td>8</td><td colspan="3">පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලයඃ<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• අධ්‍යයන විෂයයක් ලෙස දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනා ගැනීම සහ එය අධ්‍යයන කිරීමේ විවිධ ප්‍රවේශයන් අවබෝධ කර ගනියි .<br>• සමාජීය විද්‍යාවක් ලෙස දේශපාලන විද්‍යාවේ පවත්නා අන්තර් විෂයාත්මක සම්බන්ධතාවල ස්වභාවය අවබෝධ කර ගනියි .<br>• නූතන රාජ්‍යයන්හි ස්වාධිපත්‍ය, නීතියේ ආධිපත්‍යය සහ බලතල බෙදා වෙන් කිරීමේ ස්වභාවය හඳුනා ගනියි.<br>• නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්හි ලක්ෂණ හඳුනා ගනියි.<br>• විවිධ දේශපාලන ආයතනයන්හි ස්වභාවය අවබෝධ කර ගනියි.</td></tr>
<tr><td rowspan="4">9</td><td colspan="3">පාඨමාලා ඒකකයේ අන්තර්ගතය ඃ</td></tr>
<tr><td>ප්‍රධාන මාතෘකාව</td><td>සෙසු මාතෘකා</td><td></td></tr>
<tr><td>1. දේශපාලන විද්‍යාවේ ස්වභාවයඃ දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවකි.</td><td>• දේශපාලනය යනු කුමක්ද<br>• දේශපාලන විද්‍යාව යනු කුමක්ද<br>• දේශපාලන විද්‍යාව සමාජීය විද්‍යාවක් ලෙස සැලකීමට බලපාන හේතු සාධක</td><td></td></tr>
<tr><td>2. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය</td><td>• දේශපාලන න්‍යාය, දේශපාලන චින්තනය, දේශපාලන දර්ශනය හා දේශපාලන මතවාද<br>• රාජ්‍යය සහ ආණ්ඩුව<br>• දේශපාලන බලය<br>• තුලනාත්මක ආණ්ඩුක්‍රම<br>• දේශපාලන ආයතන<br>• රාජ්‍ය පරිපාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති<br>• අන්තර්ජාතික දේශපාලනය<br>• ගැටුම් අධ්‍යයනය</td><td></td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | 3. දේශපාලන විද්‍යාවේ ක්‍රමවේදය | • දාර්ශනික ක්‍රමවේදය<br>• තුලනාත්මක ක්‍රමවේදය<br>• ඓතිහාසික ක්‍රමවේදය<br>• සමාජ විද්‍යාත්මක ක්‍රමවේදය<br>• නීති විද්‍යාත්මක ක්‍රමවේදය<br>• චර්යාවාදී ක්‍රමවේදය<br>• ක්‍රම විශ්ලේෂණය<br>• සංඛ්‍යාන ක්‍රමවේදය | |
| | 4. දේශපාලන විද්‍යාව සහ අනිකුත් සමාජයීය විද්‍යාවන් අතර පවත්නා සම්බන්ධතාව | • දේශපාලන විද්‍යාව සහ ඉතිහාසය, දේශපාලන විද්‍යාව සහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව සහ සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව සහ භූගෝල විද්‍යාව. | |
| | 5. රාජ්‍යයේ ස්වභාවය | • රාජ්‍යය අර්ථකථනය<br>• රාජ්‍යයේ අත්‍යවශ්‍ය අංග<br>• රාජ්‍යයේ ඓතිහාසික විකාශනය: ග්‍රීක නාගරික රාජ්‍යය, වැඩවසම් රාජ්‍යය සහ නූතන රාජ්‍යය<br>• රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ මතවාද: සමාජ සම්මුතිවාදය, ලිබරල්වාදය, මාක්ස්වාදය, පැසිස්ට්වාදය | |
| | 6. ස්වාධිපත්‍ය | • ස්වාධිපත්‍යය සංකල්පයේ වර්ධනය<br>• ස්වාධිපත්‍යය අර්ථකථනය<br>• ස්වාධිපත්‍යයේ මූලිකාංග<br>• විවේචන | |
| | 7. ආණ්ඩුවේ ස්වභාවය | • ආණ්ඩුව අර්ථකථනය<br>• ආණ්ඩුවේ කෘත්‍යයන්<br>• ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ ක්‍රම: බලය බෙදා වෙන් කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථානුකූලවාදය | |
| | 8. ආණ්ඩුක්‍රම ආකෘති | • දේශපාලන මතවාද අනුව ආණ්ඩුක්‍රම වර්ග කිරීම: ( ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී, පැසිස්ට්වාදී)<br>• බලය බෙදීම අනුව ආණ්ඩුක්‍රම වර්ග කිරීම: (ඒකීය, සන්ධීය, සහසන්ධීය)<br>• විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව ආණ්ඩුක්‍රම වර්ග කිරීම: (කැබිනට්, ජනාධිපති, මිශ්‍ර) | |

| | | | |
|---|---|---|---|
| | 9. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ලක්ෂණ | • නියෝජනය සහ මැතිවරණ ක්‍රම<br>• දේශපාලන පක්ෂ හා බලපෑම් කණ්ඩායම්<br>• සිවිල් සමාජය<br>• ප්‍රජාතන්ත්‍රවාදී සහ යහ පාලනයේ මෙවලම් | |
| **10** | **පාඨමාලා පවත්වාගෙන යන ආකාරය** | දේශන පැවැත්වීම | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය-** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | පැවරුම ලකුණු (20) | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය<br>වසර අවසානයේ පරීක්ෂණයට පෙනී සිටීම ලකුණු (80) | |
| **12** | **නිර්දේශිත ග්‍රන්ථ:**<br>1. Ball, A.R. 1999, ***Modern Politics and Government***, Macmillan, London.<br>2. Kapur, A.C. 1997, ***Principle's of Political Science***, Chand & Company Ltd, New Delhi.<br>3. Haywood, Andrew 2007, ***Politics***, Palgrave. New York.<br>4. Mahajan, V.D. 1998, ***Political Theory (Principle's of Political Science,*** Chand & Company Ltd. New Delhi<br>5. Rod Huge, Martin Harrop and Shann Bertin 1998, ***Comparative Government and Politics, an Introduction***, Palgrave. New York.<br>6. සොයිසා, එම්. ඕ. ඒ. ද. 1993, ***දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත,*** සුපුන් ග්‍රැෆික්ස්. කොළඹ. | | |

| | | |
|---|---|---|
| **1** | **පාඨමාලා ඒකකයේ කේතකය** | POGE 1002 |
| **2** | **පාඨමාලා ඒකකයේ නම** | ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලන වෙනස්වීම් |
| **3** | **ඒකක අගය** | 04 |
| **4** | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| **5** | **හැඳින්වීම**<br>මෙය සමකාලීන ශ්‍රී ලංකාවේ දේශපාලනය පිළිබඳ ආරම්භක පාඨමාලාවයි. එමගින් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමයේ මූලික ලක්ෂණයන් පිළිබඳ විස්තරාත්මකව පරීක්ෂා කරනු ලැබේ. | |
| **6** | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නොමැත |
| **7** | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු :**<br>මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වන්නේ 1833 සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීමයි. | |
| **8** | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය :**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ආයතන, මැතිවරණ හා නීති ක්‍රම පිළිබඳව අවබෝධ කරගත හැකි වීම.<br>• ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමය කෙරෙහි දේශපාලන සංස්කෘතිය ඇති කරනු ලබන බලපෑම අවබෝධ කරගත හැකිවීම.<br>• ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමය තුළ පවත්නා දේශපාලන ගැටලු හඳුනා ගත හැකි වීම. | |
| **9** | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය :** | |

| **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
|---|---|---|
| 1. ශ්‍රී ලංකාවේ යටත් විජිත පාලනය | • කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය -1833<br>• කෲව්-මැකලම් ප්‍රතිසංස්කරණය -1910<br>• මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය -1920<br>• මැනිං-ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණය -1924<br>• ඩොනමෝර් ප්‍රතිසංස්කරණය -1931 | |
| 2. යටත් විජිත සමය තුළ පැවති සමාජ සහ දේශපාලන ව්‍යාපාර | • ආගමික පුනර්ජීවන ව්‍යාපාරය<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය<br>• කම්කරු ව්‍යාපාරය<br>• වාමාංශික ව්‍යාපාරය | |
| 3. සොල්බරි ව්‍යවස්ථාව - 1947 | • සෝල්බරි ව්‍යවස්ථාවේ පසුබිම<br>• ඩොමිනියන් තත්ත්වය<br>• සෝල්බරි ව්‍යවස්ථාවේ ආයතනික ව්‍යුහය (නාමික විධායකය, සත්‍ය විධායකය, ද්විමාණ්ඩලික ක්‍රමය, සරල බහුතර නියෝජන ක්‍රමය)<br>• සුලුතර ජනවර්ගවල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධිවිධාන | |

| | | | |
|---|---|---|---|
| | | • අධිකරණය<br>• සිවිල් සේවය | |
| | 4. ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව - 1972 | • ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ පසුබිම<br>• ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ ආයතනික ව්‍යුහය (නාමික විධායකය, කැබිනට් විධායකය, ජාතික රාජ්‍ය සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය, මූලික අයිතිවාසිකම්) | |
| | 5. දෙවන ජනරජ ව්‍යවස්ථාව - 1978 | • දෙවන ජනරජ ව්‍යවස්ථාවේ පසුබිම<br>• දෙවන ජනරජ ව්‍යවස්ථාවේ ආයතනික ව්‍යුහය (විධායක ජනාධිපති ක්‍රමය, පාර්ලිමේන්තුව, අධිකරණය, සමානුපාතික නියෝජන ක්‍රමය, ඔම්බුඩ්ස්මන්, මූලික අයිතිවාසිකම්) | |
| | 6. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ | • දේශපාලන පක්ෂවල ස්වභාවය<br>• දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වභාවය<br>• දේශපාලන පක්ෂ ක්‍රමයේ නව ප්‍රවණතා | |
| | 7. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම | • ආරම්භය සහ වර්ධනය<br>• දේශපාලන බලය පිළිබඳ ගැටුම<br>• ජාතික අනන්‍යතාව<br>• ආර්ථික සාධකයේ ප්‍රතිවිපාක<br>• නෛතික සාධකයන්හි ප්‍රතිවිපාක | |
| | 8. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති | • විදේශ ප්‍රතිපත්තියේ ඇති වැදගත්කම<br>• 1956 සිට විදේශ ප්‍රතිපත්තිය තුළ ඇති වූ වෙනස්කම්<br>• 1994 සිට වර්තමානය දක්වා විදේශ ප්‍රතිපත්තිය තුළ ඇති වූ වෙනස්කම්<br>• ඉන්දු-ශ්‍රී ලංකා සම්බන්ධතා | |
| **10** | **පාඨමාලාව පවත්වා ගෙන යන ආකාරය** | දේශන පැවැත්වීම | |
| **11** | **ඇගයීම් ක්‍රමවේදය-** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | පැවරුම ලකුණු (20) | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය<br>වසර අවසානයේ පරීක්ෂණයට පෙනී සිටීම ලකුණු (80) | |

| 12 | **නිර්දේශිත ග්‍රන්ථඃ** |
|---|---|


1. Amarasinghe, Y.R. 1998, ***Revolutionary Idealism and parliamentary Politics : A study of Trotskysm in Sri Lanka,***Social Scientist association**,** Colombo.
2. Jennings, Iror 1953, ***The Constitution of Ceylon***,Oxford, London.
3. Kearny, R.N. 1973, ***The Politics of Ceylon***, Cornell University Press, London.
4. Warnapala, Wiswa 1993, ***Sri Lankan Political Science***, Navrung, New Delhi.
5. Wilson, A.J. 1979, ***Politics in Sri Lanka***, *1947- 1979*, Macmillan, London.
6. Wilson, A.J. 1980, ***The Guallist System in Asia : The constitution of Sri Lanka***, Macmillan, London, .
7. අතුකෝරල පී. 2006, ***ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටලුව***, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.
8. බණ්ඩාර, නවරත්න. ඒ. එම්. 2007, ***බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය***, ෆාස්ට් පබ්ලිෂින්, කොළඹ,
9. ජයවර්ධන, කුමාරි 2004, ***ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම***, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය**,** කොළඹ .
10. විතානවසම්, අතුල 2007, ***ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය***, තරංජි ප්‍රින්ටර්ස්, මහරගම.

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | PSGE 1001 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | සාමාන්‍ය මනෝවිද්‍යාව |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 5 | **හැඳින්වීම**<br><br>මිනිස් මනස හා චර්යාවන් පිළිබඳ අධ්‍යයන කරන මෙම විෂය වර්තමානය වන විට ලෝකයේ ජනප්‍රියම විෂයක් බවට පත්ව ඇත. මනෝවිද්‍යාවේ මූලික සංකල්ප, න්‍යායාය හා ඉගැන්වීම් පිළිබඳ සරල හඳුනාගැනීමක් මෙම විෂය ඒකකය තුළදී සිදු වේ. | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| 7 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>මනෝවිද්‍යාවේ විෂය ක්ෂේත්‍රය අතර මූලික වන සාමාන්‍ය මනෝවිද්‍යාවේ සංකල්පය හා එහි ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබාදීම | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්,<br>• මනෝවිද්‍යාව හා එහි මූලික සංකල්පය පිළිබඳ අවබෝධයක් ලබාගනියි.<br>• මානසික ස්වභාවය පිළිබඳ යථාර්ථය හඳුනා ගනියි.<br>• පුද්ගල චර්යාව පිළිබඳ අවබෝධය ලබයි. | |
| 9 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| | ප්‍රධාන මාතෘකාව | සෙසු මාතෘකා | |
|---|---|---|---|
| | 1. මනෝවිද්‍යාව හැඳින්වීම | • නිර්වචන කිරීම<br>• මනෝ විද්‍යාවේ ඉතිහාසය<br>• මනෝ විද්‍යාවේ ස්වභාවය<br>• මනෝවිද්‍යාවේ විෂය ක්ෂේත්‍රය | |
| | 2. මනෝවිද්‍යාවේ ගුරුකුල | • ව්‍යුහවාදය,<br>• කාර්යබද්ධ වාදය<br>• චර්යාවාදය<br>• මනෝ විශ්ලේෂණ වාදය<br>• ගෙස්ටෝල්ට් වාදය<br>• සමාජ ඉගෙනුම් වාදය<br>• මානුෂවාදය හා සාංදෘෂ්ටිකවාදය | |
| | 3. මනෝවිද්‍යාව අධ්‍යයන ක්‍රම | • සම්පරීක්ෂණය<br>• නිරීක්ෂණය<br>• අන්වායාම පරික්ෂණය<br>• චරිත වාර්තා ක්‍රමය<br>• ප්‍රත්‍යායක අධ්‍යයනය | |
| | 4. සංජානනය | • සංජානනය<br>• සංවේදනය<br>• අවධානය | |
| | 5. මතකය | • මතකය හා මතක සංවර්ධන ක්‍රම<br>• මිනිස් මතකයේ ස්වභාවය | |

| | | |
|---|---|---|
| | 6. ඉගෙනුම (ඉගෙනුම් ක්‍රම) | • නිර්වචනය කිරීම<br>• ඉගෙනුම් න්‍යාය |
| | 7. අභිප්‍රේරණය | • ප්‍රේරණවල ස්වභාවය<br>• ප්‍රාථමික හා ද්විතීයික ප්‍රේරණය<br>• අභිප්‍රේරණ න්‍යායයන් |
| | 8.චිත්තවේග | • සුභවාදී හා අසුභවාදී චිත්ත වේග<br>• චිත්ත වේග ඇතිවීම හා පාලනය |
| | 9. බුද්ධිය | • බුද්ධිය හැඳින්වීම<br>• බුද්ධි න්‍යායයන්<br>• බුද්ධිය සහ බුද්ධි ඵලය |
| | 10. පෞරුෂය | • හැඳින්වීම<br>• වර්ගීකරණය<br>• ස්වභාවය |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | |
| | **අඛණ්ඩ ඇගයීම්** | කණ්ඩායම් පැවරුම්, ස්වාධීන පැවරුම් හෝ ලිඛිත පරීක්ෂණ ලකුණු (20) |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු (80) |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | |


1. එදිරිසිංහ දයා., 1998, ***මනෝවිද්‍යාව ගුරුකුල සහ මනෝවිද්‍යාඥයෝ***, වත්මා ප්‍රකාශයකයෝ.
2. එදිරිසිංහ දයා. ඥානදාස පෙරේරා. 2005, ***මනෝවිද්‍යා විමර්ශන***, වත්මා ප්‍රකාශයකයෝ.
3. රාමනායක යූ.බී., 2001, ***මනෝවිද්‍යා පදනම***, සර්වෝදය විශ්වලේඛා ප්‍රකාශකයෝ.
4. මූර්ති. 2005, ***මනෝවිද්‍යාව***, මියුරෝ ප්‍රකාශන.
5. සේනාධීර සිල්වි, 20012, ***ළමා වර්ධනය හා සංවර්ධනය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
6. කාරියවසම් තිලෝකසුන්දරී, 2008, ***පියාජේගේ සංවර්ධන මනෝවිද්‍යාව***, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.
7. යාපාරත්න, ඩබ්.එම්., 2006, ***මනෝවිද්‍යාව හා අධ්‍යාපන මූලධර්ම***, දහම් සරසවිය.
8. Chance, P., and Harris, T.G (Eds.). 1990, ***The Best of Psychology Today***.New York. McGraw-Hill Inc
9. Allport G.W. 1937, ***Personality***, London.
10. Andrew crowcroft, 1967, ***The psychotic Studies in Social Pathology***, Penguin Books, U.S.A.

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | PSGE 1002 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | ව්‍යවහාරික මනෝවිද්‍යාව |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 5 | **හැඳින්වීම**<br><br>ශුද්ධ මනෝවිද්‍යාවෙන් ලබාදෙන දැනුම විවිධ ක්ෂේත්‍රයන් තුළ භාවිතයට ගැනීම සිදු වේ. මෙම පාඨමාලාවේදී ඒ පිළිබඳ මූලික අවබෝධය සිසුන් වෙත ලබාදේ. | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| 7 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු**<br>• සංවර්ධන ක්‍රියාදාමය සඳහා මනෝවිද්‍යා ඥානය උපයෝගී කර ගැනීම.<br>• මානසික යහපැවැත්ම වර්ධනය කිරීමෙහිලා මූලික මනෝවිද්‍යා න්‍යායයන් ව්‍යවහාරයට ගැනීම. | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්,<br>• සිසුන් තුළ මනෝවිද්‍යා දැනුම භාවිතයට ගැනීම පිළිබඳ කුසලතා වර්ධනය කරයි.<br>• විවිධ මනෝවිද්‍යා ක්ෂේත්‍ර තුළ ඇති ගැටලු විසඳීමට අවශ්‍ය ව්‍යවහාරික දැනුම බෙදා දෙයි. | |
| 9 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |
| | **ප්‍රධාන මාතෘකාව** | **සෙසු මාතෘකා** |
| | 1. ව්‍යවහාරික මනෝවිද්‍යාව හැඳින්වීම | • හැඳින්වීම<br>• ඉතිහාසය<br>• විෂය ස්වාභාවය |
| | 2. ව්‍යවහාරික මනෝවිද්‍යාවේ විෂය ක්ෂේත්‍රය | • අධ්‍යාපන මනෝවිද්‍යාව<br>• උපදේශන මනෝවිද්‍යාව<br>• ක්‍රීඩා මනෝවිද්‍යාව<br>• අපරාධ මනෝවිද්‍යාව<br>• පරිසර මනෝවිද්‍යාව<br>• කාර්මික මනෝවිද්‍යාව<br>• පාරිභෝගික මනෝවිද්‍යාව<br>• මාධ්‍ය මනෝවිද්‍යාව<br>• සෞඛ්‍ය මනෝවිද්‍යාව |
| | 3. අධ්‍යාපන මනෝවිද්‍යාව | • හැඳින්වීම<br>• ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය<br>• අධ්‍යාපන සංවර්ධනය |
| | 4. උපදේශන මනෝවිද්‍යාව 01 | • හැඳින්වීම<br>• ඉතිහාසය<br>• ස්වභාවය |
| | 5. උපදේශන මනෝවිද්‍යාව 02 | • උපදේශන ප්‍රවේශ |
| | 6. ක්‍රීඩා මනෝවිද්‍යාව | • හැඳින්වීම<br>• ක්‍රීඩා කුසලතා සංවර්ධනය<br>• ක්‍රීඩා උපදේශනය |
| | 7. අපරාධ මනෝවිද්‍යාව 01 | • අපරාධ මනෝවිද්‍යා හැඳින්වීම<br>• අපරාධ නිර්වචනය කිරීම<br>• අපරාධ සඳහා බලපාන සාධක |

| | | |
|---|---|---|
| | 8. අපරාධ මනෝවිද්‍යාව 02 | • පුනරුත්තාපනය<br>• පුනරුත්තාපන විධි |
| | 9. කාර්මික මනෝවිද්‍යාව 01 | • හැඳින්වීම<br>• ඉතිහාසය<br>• මූලික සංකල්ප |
| | 10. කාර්මික මනෝවිද්‍යාව 02 | • රැකියා ආතතිය<br>• රැකියා ආතතියේ ප්‍රතිඵල හැඳින්වීම |
| | 11. පරිසර මනෝවිද්‍යාව | • පරිසර මනෝවිද්‍යාව හැඳින්වීම<br>• පරිසර මනෝවිද්‍යාවේ සංකල්ප<br>• පරිසර මනෝවිද්‍යාවේ ව්‍යවහාරිකත්වය |
| | 12. පාරිභෝගික මනෝවිද්‍යාව | • හැඳින්වීම<br>• පාරිභෝගික මනෝවිද්‍යාවේ ඉගැන්වීම් හා සංකල්ප<br>• ව්‍යවහාරික තත්ත්වය |
| | 13. මාධ්‍ය මනෝවිද්‍යාව | • මාධ්‍ය මනෝවිද්‍යාව හැඳින්වීම<br>• මූලික ඉගැන්වීම්<br>• මාධ්‍යකරණය ව්‍යවහාරික මනෝවිද්‍යාව |
| | 14. සෞඛ්‍ය මනෝවිද්‍යාව | • හැඳින්වීම<br>• සෞඛ්‍ය මනෝවිද්‍යාවේ ප්‍රභේද<br>• කායික හා මානසික සෞඛ්‍ය |
| | 15. ව්‍යවහාරික මනෝවිද්‍යාව හා සමාජීය ප්‍රගමනය | • ව්‍යවහාරික මනෝවිද්‍යාව හා සමාජීය ප්‍රගමනය |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා මඟින් |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | |
| | **අඛණ්ඩ ඇගයීම්** | කණ්ඩායම් පැවරුම්, ස්වාධීන පැවරුම් හෝ ලිඛිත පරීක්ෂණ ලකුණු (20) |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු (80) |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | |


1. රේවත හිමි කුඹුකන්දන, (2014), ***ව්‍යවහාරික මනෝවිද්‍යාව***, රනාල, දකුණු ආසියානු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය
2. Muchinsky, Paul M., (2013), ***Psychology applied to work***, USA, Wadsworth,
3. Rowan Bayne, Ian Horton,(2003), ***Applied Psychology: Current Issues and New Directions***, New Delhi, Sage Publications
4. Stephen Mellalieu, Sheldon Hanton, (2008), ***Advances in Applied Sport Psychology: A Review,*** University of Wels UK
5. Paul R. Martin, Fanny M. Cheung, (2011), ***IAAP Handbook of Applied Psychology***, John Wiley & Sons

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | STGE 1001 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | මූලික ගණිතය |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 5 | **හැඳින්වීම**<br><br>මෙම ඒකකය ගණිතය පිළිබඳ මූලික සංකල්ප සඳහා පසුබිමක් සපයනු ලබන හඳුන්වාදීමේ පාඨමාලාවකි. මෙම පාඨමාලාව මගින් ශිෂ්‍යයන්ට සමාජීය විද්‍යාවන්ගේ අනෙකුත් ක්ෂේත්‍ර සඳහා යොදාගත හැකි විශ්ලේෂණාත්මක චින්තනය ගොඩනගා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. එදිනෙදා ජීවිතයේ කටයුතුවලදී සංඛ්‍යානමය සහ ගණිතමය දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීම පිළිබඳ මෙම ඒකකය මගින් තවදුරටත් අවබෝධයක් ලබාදෙනු ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව ශිෂ්‍යයන්ට සමාජ සංඛ්‍යාන විෂය ක්ෂේත්‍රයට අදාළ ගැටලු නිරාකරණය කිරීම සඳහා ගණිතමය දැනුම යොදා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| 7 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු:**<br>• ගණිතයෙහි මූලික සංකල්ප අවබෝධ කරගැනීම<br>• චින්තන ශක්තිය සහ විශ්ලේෂණ කුශලතා වැඩිදියුණු කිරීම<br>• සමාජීය විද්‍යාවන්හි සංකීර්ණ ක්ෂේත්‍ර සරල කරගැනීමට අවශ්‍ය පසුබිම සැපයීම | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගෙනීමෙන් අපේක්ෂිත ඵලය:**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්,<br>• වීජීය ප්‍රකාශනයන් ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා වීජ ගණිතය පිළිබඳ විවිධ මූලික නීති යොදා ගනී.<br>• භාග භින්න භාගවලට වියෝජනය කරයි.<br>• සමාන්තර, සරල සහ වර්ගජ සමීකරණ විසඳයි.<br>• දර්ශක ආශ්‍රිත ගැටළු විසඳීම සහ ලඝු ගණක නීති යොදා ගනී.<br>• ප්‍රස්තාර ක්‍රම භාවිතයෙන් සමීකරණ විසඳීම සහ ප්‍රස්තාර ඇඳී.<br>• සරල රේඛාවක සමීකරණය ගොඩනගයි.<br>• ද්විපද න්‍යාය විස්තර කිරීම සහ යොදා ගනී.<br>• සමාන්තර සහ ගුණෝත්තර ශ්‍රේණි ආශ්‍රිත ගැටළු විසඳයි.<br>• න්‍යාස භාවිතයෙන් සරල රේඛීය සමීකරණ විසඳයි. | |
| 9 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| **ප්‍රධාන මාතෘකාව** | **සෙසු මාතෘකා** | |
|---|---|---|
| 1. වීජීය ගණිත නීති | • BODMAS නීතිය<br>• වීජීය ප්‍රකාශන ආකලනය හා ව්‍යාකලනය<br>• වීජීය ප්‍රකාශනවල ගුණිතය සහ බෙදීම<br>• ආදේශ කිරීම<br>• භාවිතයන් | |

| | | | |
|---|---|---|---|
| | 2. සංඛ්‍යා හැඳින්වීම | • සංඛ්‍යා වර්ගීකරණය<br>• පරිමේය සහ අපරිමේය සංඛ්‍යා<br>• නිඛිල, පරිමිත, දශම, සමාවර්ථ දශම සහ ප්‍රථමක සංඛ්‍යා<br>• කරණි සහ අඛිලකරණි හඳුනා ගැනීම<br>• කරණි සුළුකිරීම | |
| | 3. සාධක බිඳීම | • පොදු සාධක සෙවීම<br>• වර්ග දෙකක අන්තරය<br>• ඝණ දෙකක එකතුව සහ අන්තරය<br>• ත්‍රිපද වර්ගජ ප්‍රකාශනවල සාධක බිඳීම<br>• භාවිතයන් | |
| | 4. භාග | • භාග එකතු කිරීම සහ අඩුකිරීම<br>• භාග ගුණකිරීම සහ බෙදීම<br>• භින්න භාග | |
| | 5. ඒකජ සහ වර්ගජ සමීකරණ විසඳීම | • ඒකජ සමීකරණ<br>• විචල්‍යය දෙකකින් සමන්විත සමගාමී සමීකරණ<br>• විචල්‍යය තුනකින් සමන්විත සමගාමී සමීකරණ<br>• සාධක වෙන් කිරිමෙන් වර්ගජ සමීකරණ විසඳුම<br>• සමීකරණ ගොඩනැගීම හා විසදුම් | |
| | 6. දර්ශක | • දර්ශක නීති<br>• දර්ශක නීති භාවිතයෙන් වීජීය ප්‍රකාශන සුළු කිරීම | |
| | 7. ලඝු ගණක | • ලඝු ගණක හැඳින්වීම<br>• ලඝු ගණක නීති<br>• ලඝු ගණක නීති භාවිතයෙන් වීජීය ප්‍රකාශන සුළු කිරීම | |
| | 8. කණ්ඩාංක ජ්‍යාමිතිය | • කාටීසියානු තලයක ලක්ෂ්‍ය පිහිටීම<br>• ලක්ෂ්‍ය දෙකක දුර ගණනය කිරීම<br>• සරල රේඛාවක සමීකරණය සෙවීම<br>• සරල රේඛාවක අනුක්‍රමනය සෙවීම<br>• සමාන්තර රේඛා<br>• ලම්භක රේඛා | |

| | | | |
|---|---|---|---|
| | 9. ප්‍රස්තාර | • විජීය ශ්‍රිතවල ප්‍රස්තාර<br>• උපරිම සහ අවම අගයන්<br>• *f(x) = 0* සහ *f(x) = g(x)* හි ප්‍රස්තාරික විසඳුම<br>• ශ්‍රිතවල පරාසයන් | |
| | 10. කුලක සහ ද්විපද ප්‍රමේයය | • කුලක හැඳින්වීම<br>• සංකරණ<br>• සංයෝජන<br>• ද්විපද ප්‍රමේය<br>• භාවිතයන් | |
| | 11. සමාන්තර ශ්‍රේණි | • අර්ථ දැක්වීම<br>• සමාන්තර ශ්‍රේණිය<br>• සමාන්තර ශ්‍රේණියක පොදු පදය ලිවීම<br>• සමාන්තර මධ්‍යනය<br>• සමාන්තර ශ්‍රේණියක පද n ගණනක ඓක්‍යය<br>• භාවිතයන් | |
| | 12. ගුණෝත්තර ශ්‍රේණි | • අර්ථ දැක්වීම<br>• ගුණෝත්තර ශ්‍රේණියක පොදු පදය ලිවීම<br>• ගුණෝත්තර මධ්‍යනය<br>• ගුණෝත්තර ශ්‍රේණියක පද n ගණනක ඓක්‍යය<br>• භාවිතයන් | |
| | 13. දෛශික | • දෛශික හැඳින්වීම<br>• දෛශික නීතීන්<br>• දෛශික සමාන කිරීම<br>• දෛශිකයක පෙරළුම<br>• දෛශිකයක විශාලත්වය<br>• දෛශික දෙකක් අතර කෝණය | |
| | 14. න්‍යාස | • න්‍යාස හැඳින්වීම<br>• න්‍යාස සමාන කිරීම<br>• න්‍යාස නීතීන්<br>• න්‍යාස එකතු කිරීම සහ අඩුකිරීම<br>• න්‍යාස අදිශයකින් ගුණ කිරීම<br>• න්‍යාස ගුණිතය | |

| | | | |
|---|---|---|---|
| | | • න්‍යාස පෙරළුම<br>• සමමිතික න්‍යාස | |
| | 15. නිශ්චායක | • අර්ථ දැක්වීම<br>• 2x2 සහ 3x3 න්‍යාසයක නිශ්චායක ගණනය කිරීම<br>• නිශ්චායක ගුණිතය<br>• ක්‍රැමර්ස් නීතිය භාවිතයෙන් සමීකරණ විසඳීම | |
| | 16. න්‍යාස ප්‍රතිලෝමය | • අර්ථ දැක්වීම<br>• 2x2 සහ3x3න්‍යාසවල ප්‍රතිලෝම න්‍යාසය සෙවීම<br>• න්‍යාස ප්‍රතිලෝම භාවිතයෙන් සමීකරණ පද්ධති විසඳීම | |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන / නිබන්ධන / කණ්ඩායම් සාකච්ඡා | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදයඃ** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | පැවරුම් / මධ්‍ය වාර පරීක්ෂණ / ඉදිරිපත් කිරීම් ලකුණු (40-20) | |
| | **අවසාන පරීක්ෂණය** | (අවසාන වාර පරීක්ෂණය - ලකුණු (60-80)<br>පැය තුනක ලිඛිත පරීක්ෂණය | |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථඃ** | | |


1. Abbott, P., & Neil, H. 1996. ***Teach Yourself Algebra***. London: Hodder Headline Plc.
2. Allen, R., & George, D. 1960. ***Basic Mathematics***. London: McMillan.
3. Ayres, F., & Mendelson, E. 1990. ***Shaum's Series, Calculus (3rd Ed).*** New York: McGraw-Hill.
4. Hall, H. 1960. ***School Algebra***. London: McMillan.
5. Tintner, G. 1953. ***Mathematics and Statistics for Economists***. New York: Rinehart & Co., Inc.
6. Holden, K., & Pearson, A. 1975. ***Introductory Mathematics for Economists***. London: David and Charles.
7. Karunarathne, K. 1994. ***Pure Mathematics 01, Second Edition***. Colombo: Lake house Investment Company Ltd.

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | STGE 1002 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | මූලික සංඛ්‍යානය |
| 3 | **පාඨමාලා අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 5 | **හැඳින්වීම**<br>සංගනන, සමාජ ආර්ථික සමීක්ෂණ, ඡන්ද විමසීම් සහ සමාජීය විද්‍යා අධ්‍යයනවල දී භාවිතයට ගතහැකි විශාල දත්ත ප්‍රමාණයක් පවතින නමුත් තීරණ ගැනීම සම්බන්ධ ක්‍රියාවලියේ දී මෙම දත්ත භාවිතයට ගැනීම සැලකිය යුතු ලෙස අවම මට්ටමක පවතී. මෙම දත්ත සංඛ්‍යානමය ශිල්පක්‍රම භාවිත කරමින් නිසි ආකාරයට විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමෙන් තීරණ ගැනීමේ හැකියාව තවදුරටත් වර්ධනය කළ හැකි වේ. නිගමනවලට එළඹීමේ ක්‍රියාවලියේදී එහි අවදානම මැනීම සඳහා යොදාගත හැකි සම්භාවිතා සංකල්ප පිළිබඳ දැනුමක් ශිෂ්‍යයන් සතු විය යුතුය. එමනිසා සම්භාවිතාවයේ මූලික සංකල්ප උදාහරණ සහිතව විස්තරාත්මකව ඉදිරිපත් කෙරෙනු ඇත. | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |
| 7 | **පාඨමාලා ඒකකයේ අපේක්ෂිත අරමුණු :**<br>• සංඛ්‍යානයේ ඉදිරි පාඨමාලාවන් සඳහා භාවිතයට ගතහැකි වන මූලික සංඛ්‍යානමය ශිල්පීය ක්‍රම පිළිබඳ කුසලතාවන් වර්ධනය කිරීම<br>• සංඛ්‍යානයේ ඉදිරි පාඨමාලාවන් සඳහා භාවිත කළහැකි සම්භාවිතාව සහ සම්භාවිතා සංකල්ප පිළිබඳ වූ න්‍යායාත්මක රාමුව හඳුන්වාදීම<br>• අවදානම අවම කරගනිමින් පවතින දත්ත පදනම් කරගෙන ප්‍රශස්ත තීරණ ගැනීම සඳහා විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකිරීමට අවශ්‍ය පදනම සැපයීම | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගෙනීමෙන් අපේක්ෂිත ඵලය :**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• සංඛ්‍යානය නිර්වචනය කිරීම, එහි භාවිතය සහ දුර්වලතා පැහැදිලි කරයි.<br>• දත්ත සහ දත්ත රැස්කිරීමේ ක්‍රම පැහැදිලි කරයි.<br>• ලබා දී ඇති දත්ත විස්තර කිරීම සඳහා සුදුසු ප්‍රස්තාර තෝරාගෙන භාවිත කරයි.<br>• සරල සාරාංශගත සංඛ්‍යාති ගණනය කිරීම සහ අර්ථකථනය කරයි.<br>• ද්විචලල දත්ත විසිරි තිත් සටහනක දැක්වීම මගින් ප්‍රතිපායනය සහ සහ-සම්බන්ධය පිළිබඳව වූ අදහස පැහැදිලි කරයි.<br>• සහ-සම්බන්ධතා සංගුණක ගණනය කිරීම සහ ප්‍රතිපායන රේඛාව නිර්ණය කරයි.<br>• කාලශ්‍රේණි සංරචක පැහැදිලි කිරීම සහ නිමානය කරයි.<br>• දර්ශකාංකවල ගොඩනැගීම පැහැදිලි කිරීම සහ දත්ත භාවිත කිරීමෙන් විවිධ දර්ශකාංක ගණනය කරයි.<br>• සම්භාවිතාව පිළිබඳ විවිධ පිවිසුම් පැහැදිලි කරයි.<br>• සම්භාවිතාව පිළිබඳ ගුණ්‍යාන සහ ආකල ආකෘතිය යොදා ගනී.<br>• අසම්භාව්‍ය සම්භාවිතාවේ සහ ස්වායත්තතාවේ මූලික අදහස් පැහැදිලි කරයි.<br>• පූර්ණ සම්භාවිතා නීතිය ඇසුරින් බේයස් න්‍යාය පැහැදිලි කරයි. | |

| | | | |
|---|---|---|---|
| | • සසම්භාවී විචල්‍යයක සම්භාවිතා ව්‍යාප්තිය, අපේක්ෂිත අගය සහ විචලතාව විස්තර කිරීම සහ නිර්ණය කරයි. | | |
| **9** | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | | |
| | **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
| | 1. හැඳින්වීම | • සංඛ්‍යානය පිළිබඳ නිර්වචන<br>• සංඛ්‍යානයේ ප්‍රභේද<br>• සංඛ්‍යානයේ භාවිතයන්<br>• සංඛ්‍යානයේ සීමාවන් | |
| | 2. දත්ත රැස්කිරීම | • දත්ත මාර්ග<br>• ප්‍රාථමික දත්ත එකතු කිරීමේ ක්‍රම<br>• ප්‍රශ්නාවලිය සහ උපලේඛනය<br>• ප්‍රශ්නාවලිය පූර්ව පරීක්ෂාව සහ සංස්කරණය | |
| | 3. දත්ත සංවිධානය කිරීම සහ ඉදිරිපත් කිරීම | • වගු<br>• ප්‍රවර්ගික සහ ප්‍රමාණාත්මක දත්ත ඉදිරිපත් කිරීමේ රූපසටහන්<br>- සිතිලිය<br>- වෘත්ත පත්‍ර සටහන්<br>- වට සටහන් සහ ස්තම්භ සටහන්<br>- තිත් සටහන් සහ විසිරි තිත් සටහන්<br>- සරල රේඛීය සහ සුමට රේඛීය සටහන්<br>- ලෝරන්ස් වක්‍රය<br>- පැතිකඩ සටහන්<br>- Z සටහන් | |
| | | • සංඛ්‍යාත ව්‍යාප්තිය<br>• ජාල රේඛය<br>• සංඛ්‍යාත බහු අස්‍රය<br>• සමුච්චිත සංඛ්‍යාත ව්‍යාප්තිය සහ සමුච්චිත සංඛ්‍යාත වක්‍ර | |
| | 4. කේන්ද්‍රික ප්‍රවණතා මිණුම් | • මධ්‍යනය, මධ්‍යස්ථය සහ මාතය<br>• කේන්ද්‍රික ප්‍රවණතා මිණුම්වල ගුණාංග<br>• හරිත, ගුණෝත්තර සහ හරාත්මක මධ්‍යනය<br>• චතුර්තක, දශමක සහ ප්‍රතිශතක | |

| | | | |
|---|---|---|---|
| | 5. අපකිරණ, කුටිකතා සහ වක්‍රිම මිණුම් | • පරාසය, චතුර්තක අපගමනය<br>• මධ්‍යන්‍යය අපගමනය<br>• විචලතාව සහ සම්මත අපගමනය<br>• විචලන සංගුණකය<br>• කුටිකතා මිණුම්<br>• වක්‍රිම මිණුම් | |
| | 6. ප්‍රතිපායනය සහ සහ-සම්බන්ධතා විශ්ලේෂණය | • විසිරි තිත් සටහන<br>• ප්‍රතිපායන රේඛාව නිමානය කිරීම<br>• නිර්ණන සංගුණකය<br>• පුරෝකථනය<br>• සූර්ණ සහ-සම්බන්ධතා සංගුණකය<br>• තරා සහ-සම්බන්ධතාව | |
| | 7. දර්ශකාංක | • සරල සාපේක්ෂ දර්ශක<br>• සරල සමාහාර දර්ශක<br>• හරිත සමාහාර දර්ශක<br>• ලැස්පියර් දර්ශකය<br>• පාෂේ දර්ශකය<br>• ෆිෂර් දර්ශකය<br>• මාෂල් එජ්වර්ත් දර්ශකය<br>• හොඳ දර්ශකාංකයක ගුණාංග<br>• බහුලව භාවිතවන දර්ශකාංක | |
| | 8. සම්භාවිතා සංකල්ප | • සසම්භාවී පර්යේෂණ, නියදි අවකාශ සහ සිද්ධි<br>• සම්භාවිතා සංකල්ප<br>• සම්භාව්‍ය පිවිසුම, සාපේක්ෂ සංඛ්‍යාත පිවිසුම, පුද්ගල බද්ධ පිවිසුම සහ ගණිතමය පිවිසුම<br>• සිද්ධීන් සම්බන්ධ කිරීම<br>• අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාරක සිද්ධි සහ ආකලන නියමය<br>• සාමූහික වශයෙන් නිරවශේෂ සිද්ධි<br>• නියත සම්භාවිතා අවකාශ<br>• නියත සමසම්භාවිතා අවකාශ<br>• අනියත නියදි අවකාශ | |

| | | | |
|---|---|---|---|
| | 9. අසම්භාව්‍ය සම්භාවිතාව සහ ස්වායක්තතාව | • අසම්භාව්‍ය සම්භාවිතාව<br>• අසම්භාව්‍ය සම්භාවිතාව සඳහා ගුණායන නියමය<br>• ස්වායත්ත සිද්ධි | |
| | 10. සම්භාවිතා නියම | • ගුණායන නියමය<br>• නියත ආනුමානික ක්‍රියාවලි සහ රුක් සටහන්<br>• මුළු සම්භාවිතා නියමය<br>• බේයස් න්‍යාය<br>• ස්වායත්ත සහ පුනරාවර්ත නැහැසුම් | |
| | 11. සසම්භාවී විචල්‍යයන් | • විවික්ත සසම්භාවී විචල්‍යයන්<br>• විවික්ත සසම්භාවී විචල්‍යයක සම්භාවිතා ස්කන්ධ ශ්‍රිතය, අපේක්ෂාව, විචලතාව සහ සම්මත අපගමනය<br>• විවික්ත සසම්භාවී විචල්‍යයක සමුච්චිත ව්‍යාප්ති ශ්‍රිතය | |
| | | • සන්තතික සසම්භාවී විචල්‍යයන්<br>• සන්තතික සසම්භාවී විචල්‍යයක සම්භාවිතා සනත්ව ශ්‍රිතය, අපේක්ෂාව, විචලතාව සහ සම්මත අපගමනය<br>• සන්තතික සසම්භාවී විචල්‍යයක ව්‍යාප්ති ශ්‍රිතය | |
| | 12. බද්ධ සම්භාවිතා ව්‍යාප්ති | • හැඳින්වීම<br>• බද්ධ සම්භාවිතා ව්‍යාප්තියක ව්‍යාප්ති ශ්‍රිතය, සහ-විචලතාව, සහ සහ-සම්බන්ධතාව<br>• ස්වායත්ත සසම්භාවී විචල්‍යය | |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන / නිබන්ධන / කණ්ඩායම් සාකච්ඡා | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය:** | | |
| | **අඛණ්ඩ ඇගයීම්** | පැවරුම් / මධ්‍ය වාර පරීක්ෂණ<br>කණ්ඩායම් වැඩ, ඉදිරිපත් කිරීම්, සහ ව්‍යාපෘති - ලකුණු (40-20) | |
| | **අවසාන පරීක්ෂණය** | අවසාන වාර පරීක්ෂණය - ලකුණු (60-80)<br>පැය තුනක ලිඛිත පරීක්ෂණය | |

| 12 | නිර්දේශිත ග්‍රන්ථ: |
|---|---|


1. Beaver, M. B. 2007. ***Probability and Statistics***. Baba Barkha Nath Printers.
2. Gupta, S. 1979. ***Statistical Techniques***. New Delhi: Sultan Chand & Sons.
3. Jayatissa, W. A. 1995. ***Basic Statistics – I (Descriptive Statistics), Second Edition***. Colombo: Tharanjee Prints.
4. Jayatissa, W. A. 1991. ***Basic Statistics - II(Probability & Probability Distribution)***. Colombo: Tharanjee Prints.
5. Karunarathne, K. 1994. ***Pure Mathematics 01, Second Edition***. Colombo: Lake house Investment Company Ltd.
6. Lipschutz, S. 1968. ***Theory and Problems of Probability, Schaum's Outlines Series***. New York: McGraw-Hill.
7. Spiegel, M. R. 1961. ***Theory and Problems of Statistics***. New York: McGraw-Hill.

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | SOGE 1001 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | සමාජ විද්‍යාවේ මූලික සංකල්ප |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |

5 **හැඳින්වීම**

දැනට භාවිතවන සමාජීය විද්‍යා විෂයන් අතර සමාජ විද්‍යා විෂය හැදෑරීම උදෙසා විශාල ප්‍රවණතාවක් දේශීයව මෙන්ම ජාත්‍යන්තරවද උපාධි අපේක්ෂකයන් අතර පවතී. සමාජය නවීකරණයත් සමඟම ඇතිවන ගැටලු විසඳා සමාජය නැවත සකස් කිරීම උදෙසා මෙන්ම, මිනිසාට යහපත් සංවර්ධනයක් අත්පත් කරදීම උදෙසා සමාජ විද්‍යාඥයන්ගේ පර්යේෂණ තුළින් විශාල දායකත්වයක් ලබාගත හැකි බව තේරුම් ගොස් ඇති කරුණකි. මේ නිසාම වර්තමානය වන විට සමාජීය විද්‍යාවන් හදාරන උපාධි අපේක්ෂකයන්ට අමතරව වෛද්‍ය විද්‍යා, ශුද්ධ විද්‍යාවන්, ඉන්ජිනේරු, කළමනාකරණ, කෘෂිකර්ම, සාත්තු සේවා යන සියලුම විෂය ක්ෂේත්‍රයන්හි උපාධි අපේක්ෂකයන් සමාජ විද්‍යාව හැදෑරීම සඳහා උනන්දුවක් දක්වන බව පැහැදිලිය. සමාජ විද්‍යාව තම උපාධියේ ප්‍රධාන විෂයක් ලෙස හැදෑරීමට අපේක්ෂිත උපාධි අපේක්ෂකයන්ගේ මූලික විෂය දැනුම වර්ධනය කිරීම මෙම විෂය ඒකකයෙන් බලාපොරොත්තු වේ.

| | | |
|---|---|---|
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත |

7 **පාඨමාලා ඒකකයෙන් අපේක්ෂිත අරමුණු**

- මූලික සමාජ විද්‍යාත්මක අවබෝධය තුළ සමාජ කරුණු විශ්ලේෂණය සඳහා ස්වයං අධ්‍යයනයක් කිරීමේ හැකියාව වර්ධනය කිරීම.
- මූලික සමාජ විද්‍යාත්මක සංකල්ප පිළිබඳව අවබෝධයක් ලබා දීම.
- සමාජ විද්‍යාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම උදෙසා අවබෝධය ඇති කිරීම.
- සමාජ විද්‍යාව හැදෑරීම උදෙසා අවශ්‍ය මූලික දැනුම ලබා දීම.

8 **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**

මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;

- සමාජ විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳව උපාධි අපේක්ෂකයන් පුළුල් අවබෝධයක් ලබයි.
- සමාජ විද්‍යාව වෙනත් විෂයන් සමඟ අන්තර් සම්බන්ධ වන ආකාරය පිළිබඳව දැනුමක් ලබයි.
- සමාජ ක්‍රියාවලිය හා සමාජය වඩාත් හොඳින් තේරුම් ගැනීමේ හැකියාවක් ලබයි.

9 **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය**

| **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
|---|---|---|
| 1. සමාජ විද්‍යාවේ ස්වභාවය | • විෂය ක්ෂේත්‍රය සහ අරමුණු<br>• වෙනත් සමාජ විද්‍යා විෂයන් සහ සමාජ විද්‍යා විෂය අතර සම්බන්ධය<br>• සමාජ විද්‍යාවට මුලපිරූ සමාජ චින්තනය සහ සමාජ විද්‍යාවේ ප්‍රභවය ඇති වූ ආකාරය පිළිබඳව ඓතිහාසික විග්‍රහයක් | |

| | | | |
|---|---|---|---|
| | 2. සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් පිළිබඳව හැඳින්වීමක් | • ඔගස්ට් කොම්ට්<br>• හර්බට් ස්පෙන්සර්<br>• එමිල් ඩුර්කහිම්<br>• මැක්ස් වෙබර්<br>• කාල් මාක්ස් | |
| | 3. සමාජානුයෝජනය | • ප්‍රාථමික සමාජානුයෝජනය<br>• ද්විතීයික සමාජානුයෝජනය<br>• සමාජානුයෝජන කාරක<br>• සමාජානුයෝජන වර්ගීකරණය<br>• පෞරුෂත්වය පිළිබඳ මූලික හැඳින්වීමක්<br>• සංස්කෘතිය පෞරුෂත්වයට බලපෑම | |
| | 4. සමාජ සමූහ | • ප්‍රාථමික සමූහ<br>• ද්විතීයික සමූහ<br>• විධිමත් හා අවිධිමත් සමූහ<br>• තිරස් සහ සිරස් සමූහ<br>• සමූහගතික<br>• සමූහ සංසක්තිකභාවය | |
| | 5. තත්ත්වය හා කාර්යභාරය | • ආරෝපිත තත්ත්වය හා සාධිත තත්ත්වය<br>• තත්ත්ව මාලාව<br>• කාර්යභාර වර්ගීකරණය<br>• කාර්යභාර ගැටුම | |
| | 6. ප්‍රජාව හඳුනා ගැනීම | • ප්‍රජාව හඳුනා ගැනීමේ නිර්නායක<br>• ප්‍රජාවේ ස්වභාවයෙහි ව්‍යුහයන්<br>• ප්‍රජාව වර්ගීකරණය හා ලක්ෂණ<br>• ග්‍රාමීය ප්‍රජාවෙහි විශේෂ ලක්ෂණ<br>• නාගරික ප්‍රජාවෙහි විශේෂ ලක්ෂණ | |
| | 7. සමාජ සංස්ථා පිළිබඳ මූලික අධ්‍යයනය | • පවුල් සංස්ථාව<br>• ආගමික සංස්ථාව<br>• ආර්ථික සංස්ථාව<br>• අධ්‍යාපනික සංස්ථාව<br>• දේශපාලන සංස්ථාව | |
| | 8. සමාජ ස්තරායණය හා චල්‍යතාව | – | |

| | | | |
|---|---|---|---|
| | 9. සංස්කෘතිය හා සමාජ අගනාකම් | • සංස්කෘතිය පිළිබඳ සමාජ විද්‍යාත්මක නිර්වචන<br>• සංස්කෘතියේ ප්‍රධාන බෙදීම්<br>• උප සංස්කෘතින් හා දුගී බවේ සංස්කෘතිය | |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම** | කණ්ඩායම් පැවරුම්, ස්වාධීන පැවරුම් හෝ ලිඛිත පරීක්ෂණ ලකුණු (20) | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු (80) | |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. Haralambos with R. M. Heald., 1980/1981, **Sociology: Themes and Perspectives**, Oxford University Press, New Delli.
2. Rao, Shankar, C. N., 1990/1998, **Sociology**, Chands & company, New Delli
3. Landis, P.H., 1958, **Introduction Sociology**, Ronald Press, New York
4. රත්නපාල, නන්දසේන., 1986/1995, **සමාජ විද්‍යාවේ මූලධර්ම**, ලේක් හවුස්, කොළඹ.
5. පෙරේරා, ටෙනිසන්, බී .ඒ., 1993/2005, **මානව විද්‍යා හා සමාජ විද්‍යා ප්‍රවේශය**, ගොඩගේ සහෝදරයෝ ,කොළඹ.
6. සමරකෝන්, මයුර., 2005/2009, **මූලික සමාජ විද්‍යාව 1**, කර්තෘ ප්‍රකාශන, කොළඹ.
7. සමරකෝන්, මයුර., 2009/2011, **සමාජ සංස්ථා**, කර්තෘ ප්‍රකාශන, කොළඹ.
8. සමරකෝන්, මයුර., 2008/2010, **සම්භාව්‍ය සමාජ විද්‍යාඥයෝ**, කර්තෘ ප්‍රකාශන, කොළඹ.
9. සමරකෝන්, මයුර., 2009, **ග්‍රාමීය සමාජ විද්‍යාව** , කර්තෘ ප්‍රකාශන, කොළඹ.
10. සමරකෝන්, මයුර., 2009, **නාගරික සමාජ විද්‍යාව** , කර්තෘ ප්‍රකාශන, කොළඹ.
11. ද, සිල්වා, අමරසිරි., 2012, **සමාජ විද්‍යාව 1**, කර්තෘ ප්‍රකාශන, මහනුවර.

| | | |
|---|---|---|
| 1 | **පාඨමාලා ඒකකයේ කේතකය** | SOGE 1002 |
| 2 | **පාඨමාලා ඒකකයේ නම** | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම |
| 3 | **ඒකක අගය** | 04 |
| 4 | **අධ්‍යයන වර්ෂය** | පළමුවන වසර |
| 5 | **හැඳින්වීම**<br>සමාජ පැවැත්ම, සංවිධානාත්මක ස්වරූපය, සමාජ ව්‍යුහය මෙන්ම සමාජ සංස්කෘතික රටාවේ වෙනස් වීම එයටම අනන්‍ය වූ ගති ස්වභාවයකි. නව නිපදවීම්, සොයා ගැනීම්, විද්‍යා හා තාක්ෂණික මෙන්ම මානව බුද්ධියේ සූක්ෂ්මතාවයෙන් යුක්ත ප්‍රපංච සමාජ විද්‍යාඥයන්ගේ නිරන්තර පර්යේෂණයට භාජනය වූවකි. සමාජ විද්‍යා විෂය ආරම්භක අවස්ථාවේ සිටම මෙම තේමාවන් අධ්‍යයනයට ලක්ව තිබේ. | |
| 6 | **පාඨමාලා ඒකකයේ පූර්ව අවශ්‍යතා** | නැත. |
| 7 | **පාඨමාලා ඒකකයෙන් අපේක්ෂිත අරමුණු**<br>• සමකාලීන සමාජය හා සමාජ වෙනස් වීමට අදාළ සංකල්ප හා සිද්ධාන්ත හැදෑරීම.<br>• වෙනස් වෙමින් පවතින ගෝලීය සමාජය හා ස්වකීය සමාජය අතර වූ විෂමතාව වටහා ගෙන විද්‍යාත්මක නව දැනුමින් පෝෂණය වීමේ අවශ්‍යතාව පිළිගෙන ක්‍රියාත්මක වීම. | |
| 8 | **පාඨමාලා ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂිත ඵලය**<br>මෙම පාඨමාලා ඒකකය නිසි ලෙස සම්පූර්ණ කිරීම තුළින්;<br>• ශිෂ්‍යයන්ට මෙම පාඨමාලාව හැදෑරීමෙන් තද් විෂයට අදාළ සංකල්ප හා සිද්ධාන්ත පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීමට හැකියි.<br>• තමන් ලබන දැනුම ඵලදායි ආකාරයෙන් භාවිත කිරීමෙන්, විශ්ලේෂණය කිරීමෙන් සමාජ සංවර්ධනයට දායක වීමේ ශක්‍යතා හඳුනා ගනී. | |
| 9 | **පාඨමාලා ඒකකයේ අන්තර්ගතය** | |

| **ප්‍රධාන මාතෘකා** | **සෙසු මාතෘකා** | |
|---|---|---|
| 1. සමාජ පැවැත්ම සහ වෙනස්වීම | • වෙනස් වීම/විපරිණාමය යනු කුමක්ද? නිර්වචන, සංකල්පීය විග්‍රහය | |
| 2. නූතන සමාජ වෙනස් වීම කෙරෙහි සිදු කෙරුණු බලපෑම්හි ඓතිහාසික වර්ධනය | • සමාජීය හා සංස්කෘතික වෙනස්වීම් අවබෝධ කර ගැනීම<br>• ප්‍රංශ විප්ලවය/ රුසියානු විප්ලවය<br>• කාර්මික විප්ලවය<br>• ලෝක යුද්ධ | |
| 3. සමාජ වෙනස්වීම කෙරෙහි ගොඩ නැඟුණ සිද්ධාන්ත | • රොබර්ට් කේ. මර්ටන් ඃ මධ්‍ය පර්යන්ත න්‍යාය<br>• ටොම්බන්ස්, ෆර්ඩිනන්ඩ් ටෝනීස් ඃ ගෙමයින් ෂාප්ට්, ගෙෂල් ෂාප්ට්, ජගත් පද්ධති න්‍යාය | |

| | | | |
|---|---|---|---|
| | 4. සාම්ප්‍රදායිකත්වයෙන් නූතනත්වයට අදාළ සමාජ වෙනස්වීම් කාරක, ස්වාභවයේ වාසි අවාසි සහිතව | • ගෝලීයකරණය<br>• නාගරීකරණය<br>• නවීකරණය<br>• බටහිරකරණය<br>• කාර්මීකරණය<br>• ලෞකිකකරණය<br>• සංස්කෘතිකකරණය | |
| | 5. තුන්වැනි ලෝකයේ සමාජ ගෝලීයකරණය වෙමින් පවතින සමාජ ජීවිතය | • අධිරාජ්‍යවාදයෙන් බිහිවුණු ආර්ථික ක්‍රමය<br>• දිළිඳුකම<br>• ලෝකය හා ඇති සම්බන්ධතා ආහාර නිෂ්පාදනය හා කුසගින්න, ණය ගැතිභාවය | |
| | 6. රාජ්‍ය නොවන ජාත්‍යන්තර ක්‍රියාකාරීත්වය | • එක්සත් ජාතීන්<br>• අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන බහු ජාතික සමාගම්හි සංස්කෘතික අධිරාජ්‍යවාදය | |
| | 7. ස්ත්‍රී පුරුෂ ස්වභාවය | • ස්ත්‍රී පුරුෂ සමාජ න්‍යාය පිළිබඳ සංකල්ප<br>• ස්ත්‍රී පුරුෂ සමාජ න්‍යාය හා සමාජ වෙනස්වීම | |
| 10 | **පාඨමාලාව පවත්වාගෙන යන ආකාරය** | දේශන සහ කණ්ඩායම් සාකච්ඡා මඟින් | |
| 11 | **ඇගයීම් ක්‍රමවේදය** | | |
| | **අඛණ්ඩ ඇගයීම** | කණ්ඩායම් පැවරුම්, ස්වාධින පැවරුම් හෝ ලිඛිත පරීක්‍ෂණ ලකුණු (20) | |
| | **අවසාන පරීක්ෂණය** | ලිඛිත පරීක්ෂණය ලකුණු (80) | |
| 12 | **නිර්දේශිත ග්‍රන්ථ** | | |


1. Alix, K. Ernest, 1995, **Sociology**, West publishing company, Minneapolis, USA.
2. Giddens, Anthony, 1991, **Introduction to Sociology**, W. W. Norton & Company, Newyork.
3. Modern Robert K. 1957, **Social Theory & Social Structure**, Free press, Newyork
4. Browning, G. et.al. 1999, **Understanding Contemporary Society**, Sage Publication, New York.
5. Ebrahim, A. 2019, **Measuring Social Change**, Stanford University Press, Stanford.
6. සමරකෝන්, මයුර., 2009, **සමාජ වෙනස්වීම**, කර්තෘ ප්‍රකාශන, කොළඹ.

External Degrees and Extension Courses Unit
University of Sri Jayewardenepura
Gangodawila, Nugegoda

| | |
|---|---|
| Tel | : 0112801481 |
| Fax | : 0112802753 |
| Web | : www.external.sjp.ac.lk |
| E-Mail | : info.ext@sjp.ac.lk |
| E-Learning | : learnext.sjp.ac.lk |

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ

| | |
|---|---|
| දුරකථන අංකය | : 0112801481 |
| ෆැක්ස් අංකය | : 0112802753 |
| වෙබ් අඩවිය | : www.external.sjp.ac.lk |
| විද්‍යුත් තැපෑල | : info.ext@sjp.ac.lk |
| විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය | : learnext.sjp.ac.lk |